
# THE WHITE HACKLE

## JOURNAL OF THE SRI LANKA LIGHT INFANTRY

## ශ්‍රී ලංකා පාබල හමුදා සඟරාව



JANUARY 1999

සාමයෙන්
සෞභාග්‍යයෙන් පිරි
නව වසරකට ආසිරි!



රෙජිමේන්තු 09 වන සංවත්සරය
වෙනුවෙන් පැවති පිරිත් දේශනයෙන් පසු
මහා සංඝරත්නය විසින් වර්ණ ධජයන්
වෙත සෙත් පැතීම.



රෙජිමේන්තු සංවත්සරය වෙනුවෙන්
පැවති හින්දු දේව මෙහෙය.



රෙජිමේන්තු සංවත්සරය වෙනුවෙන්
පැවති මුස්ලිම් දේව මෙහෙය.



රෙජිමේන්තු සංවත්සරය වෙනුවෙන්
පැවති ක්‍රිස්තියානි දේව මෙහෙය.

# THE WHITE HACKLE

**JANUAR Y 1999, VOLUME 06 NO. 01**



ජයසිකුරු ජයමාවත කරා - 6 ශ්‍රීලපාහ

පිටුව 13

## Headlines


| | |
|---|---|
| ලක්මවගේ අභිවෘද්ධියට පිළිලයක් වූ ඊලාම් සටන | 6 |
| ශ්‍රීලපාහ 6 වන බලඇණියේ නායකත්වය | 8 |
| ජයසිකුරු ජයමාවත කරා 6 ශ්‍රීලපාහ | 13 |
| තිරියාය ප්‍රදේශයෙන් මුදගත් ජයගුම් ක්‍රියාත්විතය | 16 |
| මංගල සීනු | 20 |
| අන්තර් රෙජිමේන්තු ආබධිත රණවිරුවන්ගේ ක්‍රීඩා උළෙල 1998 | 28 |
| තල් අරඹ | 32 |
| ආබාධිත සහිත වූවන්ගේ 8 වන ජාතික ක්‍රීඩා උළෙල - 1998 | 39 |


අන්තර් රෙජිමේන්තු ආබාධිත රණවිරුවන්ගේ ක්‍රීඩා උළෙල 1998



පිටුව 28



ආබාධිත සහිත වූවන්ගේ 8 වන ජාතික ක්‍රීඩා උළෙල - 1998

පිටුව 39

**කවරයේ කථාව** : ජ්‍යෙෂ්ඨ නිලධාරී සමුගැනීමේ සාදයේ තිළින ප්‍රදානය කිරීම, යුධහමුදපතිගේ කදවුරු සංචාරය, රෙජිමේන්තු අධිපති වශයෙන් වැඩ භාර ගැනීම හා පැසිපික් කලාපීය ආබාධිත වූවන්ගේ ක්‍රීඩා උළෙලේ දී ශ්‍රී ලංකාව නියෝජනය කරමින් රන් පදක්කම් දිනාගත් මෙම රෙජිමේන්තු ආබාධිත රණවිරුවා

**COVER PAGE** : AWARDS CEREMONY AT THE FAREWELL PARTY OF SENIOR OFFICERS. VISIT OF THE ARMY COMMANDER TO THE REGIMENT. ACCEPTING APPOINTMENT AS COLONEL OF THE REGIMENT. A DISABLED SOLDIER OF THE REGIMENT, WHO WON GOLD MEDALS AT THE PACIFIC AREA DISABLED PERSONNELS SPORTS EVENTS.

PRINT WELL, 244, DAM STREET, COLOMBO 12

THE WHITE HACKLE

**SRI LANKA LIGHT INFANTRY MAGAZINE**

**Col of the Regt.**
Maj Gen SHS Kottegoda RWP, RSP,USP.

**Oftg. Centre Commandant**
Lt Col KADA Karunasekara RSP. SLLI

*The White Hackle*, Staff

| | |
|---|---|
| Editor-in Chief | -Lt. Col. KADA Karunasekera RSP, SLLI |
| Assistant Editor | -Lt. Col. S C Karunarathne RSP, SLLI |
| Associate Editors | - Maj D Hettiarachchi RWP, SLLI<br>Capt R A D P Rathnayake, SLLI<br>Capt P R B A Bandara RSP, SLLI<br>Capt WDR Gunasekera, SLLI |
| Chief Consultant | - Maj Gen SHS Kottegoda RWP, RSP, USP |
| Honorary Consultants | - Maj Gen HV Athukorale VSV, psc, FBIM (Rtd), (Reg Force)<br>Brig AER Abeysinghe KSV (Rtd) (Vol Force) |

| | |
|---|---|
| Publisher | - Regimental Centre Sri Lanka Light Infantry. |

*The White Hackle* is published quarterly under the supervision of the Regimental Centre Commandant to provide the Regiment with information on people, policies, operations, technical developments, views, opinions and ideas about the Sri Lanka Light Infantry. ◆ Manuscripts of interest to the Regiment are invited. ◆ Direct Communication is authorized to Editor, or Asst Editor, The White Hackle, Regimental Centre, Army Cantonment, Panagoda, Homagama, Phone 855204 or 437073 - 4 Extn. 4340 or 4341. ◆ Individual paid subscriptions are available through the Regimental Adjutant, Sri Lanka Light Infantry. ◆ Publication of this periodical is authorized by the Dte of PA, Army HQ CBO by letter No. A/275/27 of 16 Mar '94. ◆ Use of funds for printing this publication has been approved by the Regimental Commander on 30th Aug 1993 at the Regimental Conference held at Welioya.

# Feedback

## අදහස් උදහස් හා විවේචන

# Readers Please Write in

The WHITE HACKLE, the Voice of the Sri Lanka Light Infantry Regiment is now firmly established. It has reached maturity. This is the Nineteenth issue.

We should not rest on our laurels. Targets have to be set. Greater goals achieved. The success of WHITE HACKLE depends on combined efforts. Everyone has his contribution to make, and every contribution is most welcome. What is valued is our making the attempt, then we can surely do our bit. Express your thoughts, ideas, opinions, and criticisms, hopes and fears through 'THE WHITE HACKLE' the journal of the oldest and proudest Regiment of them all. If you have much to say about your Battalion's experience go ahead and write in to the 'WHITE HACKLE'. We are willing to accept and use what is of a standard, like sketches, stories and poems, whatever comes from your thoughts and your pen.

Our Motto is "Ich Dien", "I Serve". Let 'WHITE HACKLE' be a way to serve each other, our regiment and our country with our banner flying high as it always will.

Wishing you all a Happy New Year '99 and Compliments of the Season.

*Editor in Chief*

## හිතවත් පාඨකය, කරුණාකර ඔබගේ අදහස් අප වෙත එවන්න

ශ්‍රී ලංකා පාබල හමුදවේ හඬ ඉතා උසස් ලෙස නංවන 'වයිට් හැකල් සහරාවේ' දහනවවන කලාපයත් සමග එහි ළදරු අවධිය අවසන්කල අප ඉතා විශ්වාස වන්තව ඉදිරියට පිය ඔසවමින් පරිනත භාවයට පත් වෙමින් සිටින්නෙමු. රෝම අධිරාජ්‍යය ඉතා කෙටි කලකින් ගොඩ නැගුවක් නොවන අතර අපි ද පියවරින් පියවර ඉතා විශ්වාසවන්තව ස්ථිර අඩිතාලමක් සඳහා ඉදිරියට ගමන් කරමින් සිටින්නෙමු.

එනමුත් අප දැනට ලබා ඇති ප්‍රගතියෙන් සෑහීමකට පත්විය නොහැක, තව ඉදිරියට යා යුතු මග බොහෝ ය. එය දුෂ්කර ද නැතහොත් බාධාවකින් තොර වන්නේ දැයි තීරණය වන්නේ ඔබගෙන් ලැබෙන මහඟු සහයෝගය මතය. 'වයිට් හැකල් සහරාවේ' ප්‍රගතිය සඳහා අප සියලු දෙනාටම ඉටු කිරීමට ඇති කාර්යභාරය ඉමහත් ය. ඔබගෙන් සුළුවෙන් හෝ අප වෙත ලැබෙන සහයෝගය සෑම අවස්ථාවකම අපි අගයමු. අවශ්‍ය වන්නේ ඔබගේ උත්සාහයයි. එයින් අප වඩාත් ධෛර්යමත් වන අතර අපගේ කාර්යය නිසි අයුරු ඉටු කිරීමට අවශ්‍ය පන්නරය ලබන්නෙමු.

මෙම සහරාව පිළිබඳ හා එහි ලිපි රචනා පිළිබඳ ඔබගේ අවංක අදහස් හා විවේචන අප වෙත එවන්න. එය වයිට් හැකල් සහරාවේ ඉදිරි ගමනට මහඟු අත්වැලකි. 'වයිට් හැකල් සහරාව' ශ්‍රී ලංකා යුධ හමුදවේ අභිමානවත් ඉතිහාසයට හිමිකම් කියන ප්‍රෞඪතම රෙජිමේන්තුවක් වන ශ්‍රී ලංකා පාබල හමුදව මගින් ත්‍රෛයි මාසිකව පළ කරනු ලබයි.

මෙම පෞඪ රෙජිමේන්තුවේ සාමාජිකයෙකු හා සාමාජිකයෙකු වී සිටීම ගැන ඔබ ඔබ ගැනම ආඩම්බර විය යුතු ය. මෙම රෙජිමේන්තුව අනාධිමත් කලක් රැකගත් විලසට අප විසින් එය ඉදිරියට ද සුරැකිය යුතුය.

ඔබ බලඇණිවල යම් විශේෂ සිදුවීම් හා අවස්ථා පිළිබඳ ඔබ හට පැවසීමට ඇත්නම් 'වයිට් හැකල් සහරාව' වෙත ලියන්න. ඔබගේ ලිපි ඉතා උසස් තත්වයක ඇතැයි අප විශ්වාස කරන අතර එම ලිපි 'වයිට් හැකල් සහරාවේ' පළ කිරීමට අප පුල පුලා බලා සිටින්නෙමු. එමෙන්ම ඔබගේ උසස් කවි සංකල්පනා හා සිතුවම් සඳහා ද මෙම සහරාවේ ඉඩ ප්‍රස්ථාව ඇත.

අපගේ ආදර්ශ පාඨය යන 'සේවය කරමි' මත පිහිටා අප එකිනෙකාට, රෙජිමේන්තුවට, හමුදවට හා රටට සේවය කරමු. අපගේ පාබල හමුද ධජය ඉතා විශ්වාසවන්තව, අභිමානයෙන්, ඉතා ඉහලින් ලෙලදුන් විලසටම, තව දුරටත් ලෙලදීමට අවස්ථාව උද කර දෙමු.

ප්‍රධාන කර්තෘ

**THE WHITE HACKLE** is for Members of the SLLI, their families, Ex-Servicemen of SLLI and as a whole for the entire Army. It will be extended even to all Sri Lankans.

We invite readers' views. Under 150 words; A post card will do - and include your name, rank and address. We will withhold your name if you so desire and may condense your views because of space. We cannot publish or answer every one, but we will use representative views. Send your letters to:

**Feedback,**
The White Hackle,
RHQ SLLI, Army Cantonment,
Panagoda, Homagama.

### රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරල්
### එස් එච් එස් කෝට්ටේගොඩ ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී විසින් නිකුත් කරනු ලබන

# 1999 වර්ෂය සඳහා අළුත් අවුරුදු පණිවුඩය

වසරක් ගෙවී නව වසරක උදවත් සමගින් ශ්‍රී ලංකා පාබල හමුදවේ රෙජිමේන්තු අධිපති වශයෙන් ඔබ සැම වෙත සුභාශිංෂණ පණිවුඩයක් නිකුත් කරනුයේ ඉතාමත් සතුටිනි.

නව වසරකට පියමන් කරන මෙම අවස්ථාවේ දී ගෙවීගිය වසර දෙස ආපසු හැරී බැලීම කාලෝචිත වේ.. එම කාල සීමාව තුල අප ලැබූ සුවිශේෂ ජයග්‍රහණයන් මෙන්ම කටුක අත්දැකීම් ද විය. ශ්‍රී ලංකා පාබල හමුද නිත්‍ය/ස්වේච්ඡා බළඇණි වලට ශ්‍රී ලංකාවේ ඒකීය භාවය හා භෞමික අඛණ්ඩතාවය ආරක්‍ෂා කරලීමේ ජාතික මෙහෙවරට උරදීමක් වශයෙන් දැනට පවතින උතුරු / නැගෙනහිර ක්‍රියාන්විතයන් හි අති දුෂ්කර වූ කටුක ජීවිතයක් ගත කරන්නට සිදුවුවත්, ඒ සැම අවස්ථාවකදීම ශ්‍රී ලංකා පාබල හමුද සෙබලුන් වශයෙන් අප සැම උරින් උර ගැටී සාමුහිකත්වයෙන් හා එකමුතු කමින් කටයුතු කිරිමේ ප්‍රතිඵලයක් වශයෙන් කීර්තිමත් අනාගතයක් කරා ගමන් කිරීමට අප රෙජිමේන්තුවට හැකිවීම අප සියලු දෙනාම ලැබූ විශිෂ්ඨ ජයග්‍රහණයක් බැව් පවසනුයේ ද හද පිරි සතුටිනි. තම ආදරණීය දෙමාපියන්, අඹු දරුවන්, සහෝදර, සහෝදරියන් හා ඥතිමිත්‍රාදීන් ගෙන් ඈත්ව මතු පරපුරේ අනාගත අභිවෘද්ධිය උදෙසා තම ජීවිතය පරදුවට තබා සේවය කරන ඔබ මුලු මහත් තුන් සිංහලයේම රණවිරුවන් බැව් තහවුරු කර ඇත.

ශ්‍රී ලංකාවේ භෞමික අඛණ්ඩතාවයත් රටේ ඒකීය භාවයත් සුරකීම උදෙසා තම ජීවිතය පරදුවට තබමින් රුදුරු ත්‍රස්තවාදීන් සමග සටන් වැදුනා වූ සියලුම වීරෝධාර රණවිරුවන් මේ මොහොතේ දී ගෞරවයෙන් යුතුව මා සිහිපත් කරමි. ත්‍රස්තවාදී ප්‍රහාරවල දී අප අතරින් වියෝ වූ සියළුම රණවිරුවන් ද ඉතා ගෞරවයෙන් සිහිපත් කරන අතර, ආරක්‍ෂා කිරීම උදෙසා ඔවුන් බිහිකළ දෙමාපියන්ටත්, ඔවුන්ගේ අඹු දරුවන්ටත්, මගේ භක්ති ප්‍රණාමය පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි. ශ්‍රී ලක් දෙරණ තුළ ඈත ඉතිහාසයේ පවා මෙවැනි ම්ලේච්ඡ උවදුරු ඇති වූ බව අප සියලු දෙනාම දන්නා කරුණකි. එවන් අවස්ථාවල දී නොබියව, නොසැලී ඉදිරියට ගිය ඒ වීරෝධාර රජ දරුවන්ගේ ක්‍රියා බල මහිමය සිහියට නංවමින් ඔවුන් එද තම රුධිරය වගුරවමින් මෙම උතුම් හෙලදිව ආරක්‍ෂා කළ ආකාරය අදටත් රන් අකුරින් ඉතිහාසයට එක් වී ඇත. එම වීරෝධාර රජදරුවන් ගිය මග සිහියට ගනිමින් අපෙන් බිහිවන්නා වූ මතු පරපුරට නිදහස්, නිවහල්, ස්වෛරී පරපුරක් ලෙස අනාගතයේ දී නැගී සිටීමට මග එළිපෙහෙළි කරදෙනු වස්, මෙම රුදුරු ත්‍රස්තවාදීන් විනාශ කිරිමේ මහගු කර්තව්‍යයට සහභාගී වීමෙන් තම රට හා දේශය වෙනුවෙන් ඔබ විසින් ඉටුකළ මහගු සේවය නොපිරිහෙලා ඉදිරියටත් ඔබ විසින් ඉටු කරනු ඇතැයි මාගේ විශ්වාසයයි.

උදා වූ මෙම නව වසරේ දී ඔබ සැම දෙනාහට නියමවන විවිධ රාජකාරීන් නොපිරිහෙලා ඉටු කිරීම ද, පුහුණුවීම් කටයුතු මගින් වෘත්තිය දැනුම දියුණු කර ගැනීමටත්, රෙජිමේන්තුවේ ගෞරවයත් පොදුවේ මුළු යුධ හමුදවේ ගෞරවය හා කීර්තිනාමයත් ආරක්‍ෂා කර ගනිමින් සියලු අවස්ථාවල දී අවංකව, විනයගරුකව ක්‍රියා කිරීමට කටයුතු කරන ලෙස ද ඔබ සැමගෙන් ඉල්ලා සිටිමි.

අවසාන වශයෙන් ලැබුවා වූ 1999 නව වසර ශ්‍රීලපාහ සියලුම නිළධාරී / සෙසු නිළයින් හා ඔවුන්ගේ පවුල්වල සැමටත්, අප සමග මනා කැපවීමකින් රාජකාරී කරනු ලබන සිවිල් සේවක මහත්වරුන්ට හා ඔවුන්ගේ පවුල්වල සැමටත් සාමය සතුට පිරි සෞභාග්‍යමත් නව වසරක් වේවායි මම ඉත සිතින් ප්‍රාර්ථනා කරමි.

**එස් එච් එස් කෝට්ටේගොඩ ආර්ඩබ්පී, ආර්එස්පී, යූඑස්පී**
මේජර් ජෙනරාල්
රෙජිමේන්තු අධිපති ශ්‍රීලපාහ

දිනය 1999 ජනවාරි 01 දින

සේවයේ යෙදී සිටියදී මියගිය අයට ගෞරව දැක්වීම සඳහායි

# IN HONOUR OF THOSE WHO DIED IN SERVICE

| | REGT. NO. | RANK | NAME | UNIT | LOCATION | DATE |
|---|---|---|---|---|---|---|
| 1 | O/50945 | Lieut | APNC De Vaas Gunawardena | 1 SLLI | Thirunawely | 23-Jul-83 |
| 2 | S/10859 | C/Sgt | Thilakaratne SA | 1 SLLI | Trincomalee | 23-Jul-83 |
| 3 | S/11000 | Sgt | Perera PG | 1 SLLI | Thirunawely | 23-Jul-83 |
| 4 | S/11401 | Cpl | Perera PG | 1 SLLI | " | 23-Jul-83 |
| 5 | S/11467 | L/Cpl | Karunaratne KD | 1 SLLI | " | 23-Jul-83 |
| 6 | S/11541 | L/Cpl | Amarasinghe SS | 1 SLLI | TCO | 23-Jul-83 |
| 7 | S/11451 | L/Cpl | Mannampitiya DMAD | 1 SLLI | " | 23-Jul-83 |
| 8 | S/11637 | L/Cpl | Wijesiri AT | 1 SLLI | " | 23-Jul-83 |
| 9 | S/11664 | L/Cpl | Rajathilake SPG | 1 SLLI | " | 23-Jul-83 |
| 10 | S/11473 | L/Cpl | Robert B | 1 SLLI | " | 23-Jul-83 |
| 11 | S/10942 | Sgt | Premaratne WA | 1 SLLI | Murukandi | 19-Jan-85 |
| 12 | S/11418 | Cpl | Dayaratne HP | 1 SLLI | Murukandi | 19-Jan-85 |
| 13 | S/11991 | L/Cpl | Jayasekara KH | 1 SLLI | Trincomalee | 19-Jan-85 |
| 14 | S/11715 | L/Cpl | Weerasinghe HM | 1 SLLI | " | 19-Jan-85 |
| 15 | S/11739 | L/Cpl | Kotalawela KLB | 1 SLLI | " | 19-Jan-85 |
| 16 | S/11997 | L/Cpl | Jayathilake DHA | 1 SLLI | Trincomalee | 19-Jan-85 |
| 17 | S/11729 | L/Cpl | Rodrigo HAN | 1 SLLI | Trincomalee | 19-Jan-85 |
| 18 | S/11691 | L/Cpl | Jayantha Kumara GU | 1 SLLI | Murukandi | 19-Jan-85 |
| 19 | S/11635 | L/Cpl | Wijesinghe DVR | 1 SLLI | " | 19-Jan-85 |
| 20 | S/11689 | L/Cpl | Dayananda GV | 1 SLLI | " | 19-Jan-85 |
| 21 | S/11737 | L/Cpl | Miththreepala HM | 1 SLLI | " | 19-Jan-85 |
| 22 | S/11380 | L/Cpl | Indrananda LK | 1 SLLI | Ariyalai | 29-Apr-85 |
| 23 | S/11392 | L/Cpl | Ananda RMA | 1 SLLI | Murukandi | 29-Apr-85 |
| 24 | S/11935 | L/Cpl | Silva DAP | 1 SLLI | Kokavil | 09-May-85 |
| 25 | S/3428 | L/Cpl | Jayasinghe Pathiraja PM | 5(V) SLLI | Kokavil | 09-May-85 |
| 26 | S/20283 | Sgt | Silva TM | 2(V) SLLI | Punani | 04-Sep-85 |
| 27 | S/20990 | Cpl | Rathnayake RMM | 2(V) SLLI | Punani | 04-Sep-85 |
| 28 | S/12055 | L/Cpl | Ananda PG | 1 SLLI | Wakarai | 06-Nov-85 |
| 29 | S/12296 | L/Cpl | Perera AANA | 1 SLLI | " | 06-Nov-85 |
| 30 | S/12270 | L/Cpl | Amitha WMRK | 1 SLLI | " | 06-Nov-85 |
| 31 | S/11065 | C/Sgt | Heenbanda MR | 1 SLLI | Dehiwatte | 03-Dec-85 |
| 32 | S/11985 | Cpl | Ekanayake EM | 1 SLLI | " | 03-Dec-85 |
| 33 | S/12182 | L/Cpl | Subaratne DAJ | 1 SLLI | " | 03-Dec-85 |
| 34 | S/12207 | L/Cpl | Palipana HMM | 1 SLLI | " | 03-Dec-85 |
| 35 | S/11989 | L/Cpl | Wanasinghe WMR | 1 SLLI | " | 18-Dec-85 |
| 36 | S/13089 | L/Cpl | Wijeratne SN | 1 SLLI | " | 17-Jan-86 |
| 37 | S/12599 | L/Cpl | Wickramasinghe MW | 1 SLLI | " | 17-Jan-86 |
| 38 | S/12072 | L/Cpl | Dharmasiri KLN | 1 SLLI | " | 17-Jan-86 |
| 39 | S/10963 | WO II | Chandradasa AV | 3 SLLI | Serunuwara | 18-Feb-86 |
| 40 | S/12864 | L/Cpl | Chandrawanse HAD | 3 SLLI | Serunuwara | 18-Feb-86 |
| 41 | S/12349 | L/Cpl | Pemanath AVD | 1 SLLI | " | 19-Feb-86 |
| 42 | S/11360 | Sgt | Mawalagedara SMB | 3 SLLI | Dehiwatte | 19-Feb-86 |
| 43 | S/12665 | L/Cpl | Jayawardena KJAK | 3 SLLI | Kattaparichchan | 10-Mar-86 |
| 44 | S/20664 | Cpl | Sahabandu DJ | 2(V) SLLI | Wakaneri | 05-Apr-86 |
| 45 | S/11511 | Sgt | Anwardeen TM | 1 SLLI | Punani | 15-Apr-86 |
| 46 | S/21530 | L/Cpl | Mahindarathna JA | 2(V) SLLI | Wakaneri | 15-Apr-86 |
| 47 | S/13231 | L/Cpl | Dayananda MPD | 1 SLLI | " | 18-Apr-86 |

| | REGT. NO. | RANK | NAME | UNIT | LOCATION | DATE |
|---|---|---|---|---|---|---|
| 48 | S/11230 | Sgt | Danapala M | 3 SLLI | Kattaparichchan | 29-Apr-86 |
| 49 | S/12400 | L/Cpl | Ashoka Hemantha LMA | 3 SLLI | Kattaparichchan | 29-Apr-86 |
| 50 | S/21541 | L/Cpl | Jayarathna PPM | 2(V) SLLI | Wakaneri | 07-May-86 |
| 51 | S/12084 | L/Cpl | Kumara JDAS | 3 SLLI | Thoppur | 30-May-86 |
| 52 | S/13924 | L/Cpl | Yodasinghe YGA | 3 SLLI | Thoppur | 30-May-86 |
| 53 | S/11847 | Cpl | Jayalath PVV | 3 SLLI | Thoppur | 30-May-86 |
| 54 | S/11454 | Sgt | Nimalsiri S | 3 SLLI | Thoppur | 30-May-86 |
| 55 | S/12813 | L/Cpl | Shelton N | 3 SLLI | Thoppur | 30-May-86 |
| 56 | S/12357 | L/Cpl | Kiriella GN | 3 SLLI | Thoppur | 30-May-86 |
| 57 | S/12742 | L/Cpl | Ranjith AAK | 3 SLLI | Thoppur | 30-May-86 |
| 58 | S/11978 | Cpl | Jayatissa ED | 3 SLLI | Thoppur | 30-May-86 |
| 59 | S/13443 | L/Cpl | Daramadasa DH | 3 SLLI | Thoppur | 30-May-86 |
| 60 | S/13446 | L/Cpl | Palitha SR | 3 SLLI | Thoppur | 30-May-86 |
| 61 | S/10754 | WO II | Jayathilaka Banda TM | 3 SLLI | Thoppur | 30-May-86 |
| 62 | S/12192 | L/Cpl | Hettiarachchi HNN | 3 SLLI | Thoppur | 30-May-86 |
| 63 | S/12425 | L/Cpl | Karunarathna DR | 3 SLLI | Thoppur | 30-May-86 |
| 64 | S/12232 | L/Cpl | Shantha KDJUW | 3 SLLI | Thoppur | 30-May-86 |
| 65 | S/11956 | L/Cpl | Jayarathna K | 3 SLLI | Thoppur | 30-May-86 |
| 66 | S/11736 | Sgt | Sunil DP | 3 SLLI | Thoppur | 30-May-86 |
| 67 | S/12556 | L/Cpl | Bandara AG | 3 SLLI | Thoppur | 30-May-86 |
| 68 | S/11977 | Cpl | Ranjith D | 3 SLLI | Thoppur | 30-May-86 |
| 69 | S/12946 | L/Cpl | Wimalsisira HRD | 3 SLLI | Thoppur | 30-May-86 |
| 70 | S/11900 | Cpl | Perera LKR | 3 SLLI | Thoppur | 30-May-86 |
| 71 | S/12452 | L/Cpl | Dissanayake DMAB | 3 SLLI | Thoopur | 30-May-86 |
| 72 | S/13461 | L/Cpl | Osman JB | 3 SLLI | Thoppur | 30-May-86 |
| 73 | S/11753 | Sgt | Perera APD | 3 SLLI | VNA | 30-Jul-86 |
| 74 | S/12903 | L/Cpl | Sarath Kumara | 1 SLLI | " | 09-Aug-86 |
| 75 | S/11669 | Sgt | Sarathsiri HA | 1 SLLI | Thiriyaya | 09-Aug-86 |
| 76 | S/13142 | L/Cpl | Jayaratne BM | 1 SLLI | " | 11-Aug-86 |
| 77 | S/13269 | L/Cpl | Manamperi WK | 1 SLLI | " | 11-Aug-86 |
| 78 | S/12057 | L/Cpl | Danapala MAB | 1 SLLI | " | 11-Aug-86 |
| 79 | S/13112 | L/Cpl | Adikari AMS | 1 SLLI | " | 11-Aug-86 |
| 80 | S/11764 | Sgt | Senanayake AMK | 1 SLLI | Wakarai | 11-Aug-86 |
| 81 | S/11614 | Sgt | Werake NMMB | 3 SLLI | Thoppur | 19-Sep-86 |
| 82 | S/11974 | Cpl | Ariyathilake KL | 3 SLLI | Thmpalagamuwa | 20-Sep-86 |
| 83 | S/12934 | L/Cpl | Pathmasiri PG | 3 SLLI | Monkey Bridge | 24-Sep-86 |
| 84 | S/11567 | Sgt | Luxman HLK | 3 SLLI | Monkey Bridge | 24-Sep-86 |
| 85 | S/3232 | L/Cpl | Anil SM | 5(V) SLLI | Irattaperiyakula | 25-Sep-86 |
| 86 | S/12559 | Cpl | Ranasinghe U | 3 SLLI | Kattaparichchan | 27-Sep-86 |
| 87 | S/12220 | Cpl | Sumanathissa RA | 3 SLLI | Kattaparichchan | 28-Sep-86 |
| 88 | S/11132 | C/Sgt | Premawardena HDTA | 3 SLLI | Kattaparichchan | 07-Oct-86 |
| 89 | S/13264 | L/Cpl | Silva MSS | 3 SLLI | Kattaparichchan | 07-Oct-86 |
| 90 | S/13552 | L/Cpl | Bandara ABTE | 1 SLLI | " | 18-Oct-86 |
| 91 | S/13959 | L/Cpl | Santha Kumara HM | 1 SLLI | Sambalthive | 22-Oct-86 |
| 92 | S/12707 | L/Cpl | Malwatta MDSKS | 3 SLLI | Mathugama | 16-Dec-86 |
| 93 | S/12328 | Cpl | Weerasena WM | 1 SLLI | KIRAN | 06-Jan-87 |
| 94 | S/13679 | L/Cpl | Megasuriya MMSK | 3 SLLI | Mannar | 08-Feb-87 |
| 95 | S/3619 | Pte | Senarath Bandara EM | 5(V) SLLI | PALLEKELE | 17-Feb-87 |
| 96 | S/3617 | L/Cpl | Daya Mendis GA | 5(V) SLLI | " | 07-Mar-87 |
| 97 | S/3515 | L/Cpl | Wijesiri WG | 5(V) SLLI | Avarantalawa | 07-Mar-87 |
| 98 | S/3724 | L/Cpl | Karunathilake GA | 5(V) SLLI | " | 07-Mar-87 |
| 99 | S/3505 | L/Cpl | Somarathna RM | 5(V) SLLI | " | 07-Mar-87 |
| 100 | S/3613 | L/Cpl | Samel Weerasinghe WM | 5(V) SLLI | " | 07-Mar-87 |

# ලක්මවගේ අභිවෘද්ධියට පිළිලයක් වූ "ඊලාම් සටන"

අනාදිමත් කාලයක පටන් ඒකීය රාජ්‍යයක් වශයෙන් පවතින ශ්‍රී ලංකාද්වීපය දෙකඩකර වෙනම රාජ්‍යයක් පිහිටුවා ගැනීමේ අරමුණින් බෙදුම්වාදී ද්‍රවිඩ ජාතික සංවිධාන විසින් මුල පිරූ අරගලය මේ වන විට බිහිසුණු යුද්ධයක් බවට පරිවර්තනය වී හමාරය. මෙකී අරමුණ මුල් කරගෙන වරින් වර නොයෙකුත් ද්‍රවිඩ සංවිධාන විවිධ මුහුණුවරින් නැගීසිටි බව අතීතය දෙස බැලීමේ දී පසක් වන අතර, මෙසේ බිහි වූ සෑම සංවිධානයක්ම දමිළ ජාතීන්ගේ විමුක්තිය කරා ක්‍රියා කරන බවට සාමාන්‍ය ජනයා හමුවේ ඔවුනොවුන්ම හඳුන්වා ගත්හ.

ද්‍රවිඩ ජාතිකයින්ගේ විමුක්තිකාමීන් ලෙස තම ජාතියේ වුව ද වෙනත් නායකයින් යටතේ සංවිධාන බිහිවීම සිය සංවිධානයට අභියෝගයක් විය හැකි බව ද්‍රවිඩ ඊලාම් විමුක්ති කොටි සංවිධානයේ නායක වේළුපිල්ලේ ප්‍රභාකරන් තරයේ විශ්වාස කළේය. එම නිසා එවැනි සංවිධානවල ශක්තිය දුර්වල කිරීමට ඔහු උපායශීලීව සූක්ෂම ලෙස කටයුතු යෙදීය. රාජ්‍ය විරෝධී ත්‍රස්තවාදීන්ගේ කඩාකප්පල්කාරී ක්‍රියාවන් මර්ධනය කිරීමේලා රාජ්‍ය අනුග්‍රහයෙන් ආරක්ෂක හමුදවන් මෙයට මැදිහත්වීමත් සමගම එසේ බිහිව තිබූ බොහෝ සංවිධාන අඩපන වූ අතර, ඇතැම් සංවිධාන ක්‍රියාකාරීත්වය මුළුමනින්ම පාහේ අකර්මන්‍ය විය. අනෙකුත් සංවිධානයන්ගේ පසු බැම, "එල්ටීටීඊ" සංවිධානයේ හිතසුව පිණිස වූ අතර, එම සංවිධානවල සාමාජිකයින් තම සංවිධානයට නතු කරගෙන "එල්ටීටීඊ" ය පෝෂණය ලැබීය. එසේ තම සංවිධානයට නතු නොවූ හා එරෙහි වූ ඇතැම් සංවිධානවල නියමුවන් හා සාමාජිකයින් මිලේච්ඡ ලෙස ඝාතනය කිරීමට ද ඔවුන් නොපසුබට විය.

මෙපරිද්දෙන් පිරිස් බලය නංවාගත් "එල්ටීටීඊ"න් ජාත්‍යන්තර ප්‍රජාවගේ ආධාර ලබාගැනීමට ද නත් අයුරින් උත්සාහ ගත්හ. මෙහි දී ආරක්ෂක හමුදවන්ගෙන් මෙන්ම සාමාන්‍ය සිංහල ජනතාවගෙන් සිදු වූ යම් දුර්වල ක්‍රියාවක් ඔවුන් ඊට අවියක් කර ගත්තා සේම, ත්‍රස්තවාදීන්ට එරෙහිව ආරක්ෂක හමුදවන් සිදුකල මෙහෙයුම් වල දී මරණයට පත් ත්‍රස්තවාදීන්ගේ මළ සිරුරු හා එම ප්‍රදේශයේ සිදු වූ අලාභහානි මෙන්ම, ඔවුන් විසින් හිතාමතාම දේපල විනාශ කරමින් එවැනි ද ඡායාරූප හා වීඩියෝගත කර ලොව පුරා බෙදහැර, ඒවා වැරදි ලෙස හුවා දක්වමින් ලක් රජය දමිළ ජනයා සමූල ඝාතනය කරන බවට ප්‍රචාරය කරමින් ලෝකවාසී ප්‍රජාවගේ අනුකම්පාව හා ආධාර ලබා ගැනීමට ද ප්‍රයත්න දැරිය. දමිළ ජනයාගේ එකම ගැලවුම්කරු හා ආරක්ෂකයා තම සංවිධානය බව හඳුන්වා ගෙන ව්‍යාජ ප්‍රතිරූපයක් මවාගත් "එල්ටීටීඊ" ත්‍රස්තවාදීන් ඔවුන්ගේ වහසි බස් වලට රැවටුන ඇතැම් රටවලින් යුධ ආධාර පවා ලබාගත් බවට පිලිගත හැකි සාක්ෂිද වේ. මෙයින් පෝෂණය වූ එල්ටීටීඊ සංවිධානය මේ මොහොත වන විට ශක්තිමත් ගරිල්ලා සංවිධානයක් බවට පත්වී ලංකාවාසී සියලුම ජනකොටස් පීඩාවට පත් කරමින් දිගින් දිගටම කඩාකප්පල්කාරී ක්‍රියාවන්හි නිරතව සිටී.

ජාති, ආගම්, කුල, පංති හෝ තරාතිරම භේදයකින් තොරව විශාලපිරිසක් මේ විනාශකාරී යුද්ධය විසින් දැනටමත් බිලිගෙන හමාරය. එසේම විවිධ ආබාධිත තත්ත්වයන්ට පත්ව අසරණ වූ පිරිස ද සැලකිය යුතු පමණකින් ඉහළ ගොස් ඇත. ඊලාම් සටනේ ආරම්භයේ සිට මේ දක්වා විනාශ වී ඇති රාජ්‍ය හා පුද්ගලික දේපොල වල වටිනාකම අපහසුවෙන් හෝ ගිනිය හැකි වුව ද, මේ විනාශකාරී යුද්ධය නිසාවෙන් විනාශ වූ මිනිස් ජීවිත වල වටිනාකම රුපියල් ශත වලින් තක්සේරු කළ නොහැකි බව අවිවාදයෙන් පිළිගත යුතු වේ.

යුද්ධයෙන් විනාශයට පත් ගුවන් යානා, නාවික යාත්‍රා, යුධ ටැංකි ගොඩනැගිලි වැනි ඕනෑම දේපලකට එහි වටිනාකම රුපියල් මිලියන හෝ බිලියන වලින් තක්සේරු කළ හැක. එමෙන්ම එවැනි ද නැවත මිල දී ගැනීමේ හැකියාවක් ද ඇත. එහෙත් මේ විනාශකාරී යුද්ධය විසින් බිලිගත් ජනනායකයින්, විද්වතුන් හා මෙකී නොකී පිරිමි මෙන්ම, ළදරු ළදරියන්ගේ වටිනාකම මෙතෙකැයි කිව හැකිද? එවැන්නක් වෙනත් රටකින් මිල දී ගත හැකි ද? කිසි ලෙසකින්වත් එය කළ නොහේ.

එබැවින් සංවර්ධන කටයුතු අඩපන කර, ජන ජීවිත දහස් ගණනින් බිලිගෙන, ඒසා විශාල සංඛ්‍යාවක් ආබාධිත තත්ත්වයට පත් කරමින් ශ්‍රී ලංකාද්වීපයේ අභිවෘද්ධියට පිළිලයක් වූ මේ කුරිරු යුද්ධය නිම කිරීමට රාජ්‍ය නායකයන් ද නොගත් වෙහෙසක් නොමැත. විටෙක සාකච්ඡා මාර්ගයෙන් විසඳීමට උත්සාහ දැරුව ද එය ද ව්‍යර්ථ විය. මේ නිසා රටේ සංවර්ධනයට යෙදවිය හැකි මුදල් මේ අනර්ථකාරී යුද්ධය හමුවේ නිකරුනේ විනාශයට පත්වනවා සේම, අනාගතයේ බිහිවීමට සිටින දරුවන් පවා අනෙකුත් රටවලට ණයකරුවන් වී හමාරය. මේ විනාශකාරී යුද්ධයේ අනිටු විපාක දැනටමත් අප සැමට අත්විඳීමට සිදුව ඇත. යුද්ධය නිසා සිදුවන විනාශයේ පාපය, ලක් මවගේ අනාගතය භාර ගැනීමට සිටින ළදරුවන්ට මෙන්ම අනාගතයේ බිහිවීමට සිටින දරුවන්ට ද ඉතාමත් බැරෑරුම් ලෙස බලපානු නොඅනුමානය. එය එසේ වීමට ඉඩදිය යුතුද? නැත. අපගේ වගකීම ඉදිරියේ දී රට භාර ගැනීමට සිටින පරම්පරාවට නිවහල් දේශයක් හිමිකර දීම නොවේ ද?

එසේම විශාල අඳුරු ආගාධයකට ලක් මවගේ අනාගතය ඇද දමූ, බල තන්හාවෙන් උමතුව වෙනම රාජයක් පිහිටුවීමට ප්‍රයත්න දරන, වේළුපිල්ලේ ප්‍රභාකරන් ප්‍රමුඛ කරගත් නිවට "එල්ටීටීඊ""න්ගේ සිහින දේශය සිහිනයක්ම බවට පත් කරමින් මතු පරපුරට නිවහල් දේහයක් උරුම කරදීමේ අධිෂ්ඨානයෙන් "ජය සිකුරු" ජය මාවත කරා ගෙන ගොස් මේ විනාශකාරී යුද්ධය නිම කිරීමට වෙර දරමු.

වා/සැරයන් ප්‍රීති කුමාර කේඒආර්
බුද්ධි අංශය 6 ශ්‍රීලපාහ

# උද්ඝෝෂ පාඨය

යුද්ධ හමුදාවේ සියළුම ඒකකයන්ට ආවේනික වූ උද්ඝෝෂ පාඨ තිබේ. එම උද්ඝෝෂ පාඨයන්හි ඉතා වැදගත් තේරුමක් තිබෙන අතර ඒවා ඒකක ධජයන්හි ද පැහැදිලිව ම දක්වා ඇත. එසේම යුද්ධ හමුදාව තුළ අප සියළු දෙනාම පළඳින තම ඒකක ලාංඡනයන්හි ද එය එලෙසින්ම ඇතුළත් කර ඇති අතර, ඒවා පහත සඳහන් පරිදි වේ.

| | | |
|---|---|---|
| ශ්‍රීලසයරෙ | - | කැඳවුම කොතැනද එතනට යා යුතු ය |
| ශ්‍රීලකාහ | - | යුක්තියත් කීර්තියත් යන මගෙහිම |
| ශ්‍රීලංඉ | - | මව්බිම, ගෞරවය, සේවය |
| ශ්‍රීලංසංබ | - | ක්ෂණිකයි ස්ථිරයි |
| ශ්‍රීලපාහ | - | සේවය කරමි |
| ශ්‍රීලංසිරෙ | - | නිර්භීත වේගවත් |
| ගැහේබ | - | මානිවන්ත අභික්ඛම |
| ගජබා | - | සමගිය ශක්තියයි |
| කමාන්ඩෝ | - | නොහැක්කක් නොමැත |
| සබුබ | - | නැණ රණ ජය |
| ශ්‍රීලයුසේබ | - | පධීන්නං පරිත්ත (සැමට සේවය) |
| ශ්‍රීලයුයුබ | - | අප්පමත්තා නමීයන්ති |
| ශ්‍රීලවියාඉ | - | නිපුනත්වයෙන් රණබිමට |
| ශ්‍රීලයුපොහේබ | - | ආදර්ශයෙන් පෙරමුණ ගනිමු |
| ශ්‍රීලයුපුබ | - | ශ්‍රමය ජාතියක ජීවයයි |
| ශ්‍රීලංජාඅාබ | - | ස්වර්ගයට පෙර දේශය |

මෙම උද්ඝෝෂ පාඨ දෙස බැලීමේ දී පාබල රෙජිමේන්තුවේ උද්ඝෝෂ පාඨය අන් සියල්ලටම වඩා වෙනස් ස්වරූපයක් ඇති බව ඔබට පැහැදිලිව පෙනෙනු ඇත. ඉතාම සරල බසින් සටහන්ව ඇති එය අන් අයවළුන්ගේ දූන ගැනීමට වඩා තමුන්ගේ සිතෙහි නිතැතින්ම ඇති විය යුතු අදහසක් සටහන් කර තැබීමක් වැනිය.

අප එය ලාංඡනයෙහි තිබූ පමණින්ම, ලාංඡනය පැළඳ සිටි පමණින්ම සේවය කිරීමක් සිදු නොවේ. එම වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම අප එය ඉටුකර පෙන්විය යුතු වන්නේ ය. ඒ සඳහා කාලය උදව් වසර 15 ක පමණ කාලයක් මේ වන විටත් ගෙවී ගොස් හමාරය. එම කාලයතුල අප සිතට එකහව අපගේ උද්ඝෝෂ පාඨය ක්‍රියාවට නැංවූයේ ද යන්න අප දූන් මොහොතකට සිතා බැලිය යුතු ව ඇත. එද ඒකකයන් 02 ක් ලෙසින් සිටි අප අද නිත්‍ය සහ ස්වේච්ඡා වශයෙන් ඒකකයන් 14 ක් දක්වා ව්‍යාප්තව සිටිති. ඒ අනුව අදල "සේවය කරමි" යන උද්ඝෝෂ පාඨය ඇතුළත් ලාංඡන පළඳින සංඛ්‍යාව 14000 ක් පමණ වෙති. අප ඇත්තෙන්ම දිවයිනෙහි ඕනෑම පළාතක, ඕනෑම කාලසීමාවක් තුළ, ඕනෑම වාතාවරණයක් යටතෙහි රාජකාරීන් සිදු කිරීමට ජාතික ධජය අභියස දී දිවුරුම් දූන් පුද්ගලයෝ වෙමු. එසේ සිතනුයේ අප අතුරින් අතලොස්සක් දෙනා පමණක් වනු ඇතැයි මා සිතමි. ඔබ ද එලෙසම සිතනු ඇත. එසේ සිතීම පිළිබඳව ඔබ මා හට දෙස් නොනගනු ඇතැයි මා අදහස් කරමි.

නමුත් අපි ඇත්තෙන්ම එසේ සේවය කරන්නේ ද යන්න ඊලඟට පැන නගින ප්‍රශ්නය වේ. සියයට එකක් නොව දහසකට එකක් හෝ එසේ සේවය කරන අයවළුන් ද අප අතර නැතුවාම නොවේ. එවැනි අයවළුන් මාගේ යුධ හමුද දිවිය තුළ මා හට හමු වී ඇත. ඒ පිළිබඳව මම ආඩම්බර වෙමි. තමුන්ට හැකි උපරිම අයුරින් සේවය කිරීම අප කාගේත් අපේක්ෂාව, පරමාර්ථය විය යුතු ය. එයට හේතූන් බොහෝ ය. අපගේ කෑම බීම, ඇඳුම් පැළඳුම්, ඉඳුම් හිටුම්, සෞඛ්‍ය කටයුතු ආදිය සඳහා වූ වැය දරන්නේ මහජන මුදලිනි. මහජන මුදල් යනු විවිධ අයකිරීම් යටතේ රජය මහජනතාවගෙන් අයකර ගනු ලබන මුදල් ය. එම මුදල් රජය විසින් මහජනතාවගෙන් නීති මාර්ගයෙන් එසේ නැතහොත් අනිවාර්ය ලෙස ලබා ගන්නා මුදල් ය. තත්වය එසේ වුවත් ඊට හාත්පසින්ම වෙනස් වූ පැත්තක් ද තිබේ.

එනම් අද රට තුළ පවතින යුධමය තත්ත්වය මධ්‍යයෙහි මහජනතාව සහ විවිධ ආයතන, පාසැල් විසින් ස්වකීය කැමැත්තෙන්ම විවිධ ආකාරයෙන් ආධාර ලබාදීමයි. මෙම සත් කාර්යයට කෝටිපතියන්, ලක්ෂපතියන් මෙන්ම, එදිනෙද ජීවත්වීමට ඉතා අපහසු ආර්ථික තත්ත්වයේ පසුවන අයවළුන් ද දායක වී ඇත. ඔවුන් විටෙක මුදලින් ද, තවත් අවස්ථාවක ආහාර, ඇඳුම් පැළඳුම්, ඖෂධ වර්ග ද, සුඛෝපභෝගී භාණ්ඩ ද (රූපවාහිනී, ශීතන් විදුලි යන්ත්‍ර ආදිය) පොල්අතු, ටකරන් තහඩු ආදියෙන් ද ආධාර කළ අවස්ථාවන් බොහෝ ය. තවත් අවස්ථාවක රජයේ සහ පුද්ගලික ආයතනයන්හි සේවය කරන්නන් ඔවුන්ගේ දිනක වේතනය ද, පාසැල් දරු දූරියන් ඔවුන්ගේ එදිනෙද වියදම් සඳහා දෙමව්පියන් දෙනු ලබන ඉතා කුඩා මුදල කැටයකට එකතු කර, එම මුදල ද පරිත්‍යාග කර ඇත.

ඔවුන් එලෙසින් ආධාර කරනුයේ අපගෙන් ලැබෙන සේවයට උපහාරයක් ලෙසින් මෙන්ම එම සේවය තවදුරටත් ඉතා උසස් තත්ත්වයෙන් ලබාගැනීම් වස් අපව දිරිමත් කිරීම සඳහායි. අප සැම විටම ඒ පිළිබඳව අවධානය යොමු කළ යුතුයි. ඒ අනුව අප රාජකාරිය ඉටු කරන සෑම අවස්ථාවකදීම උසස් අයුරින් ඉටු කිරීමට සිතෙහි ධාරණය කරගත යුතුවේ. රාජකාරී ක්ෂේත්‍ර, පාලක පුහුණු ආදී කුමක් හෝ විය හැකිය. එම සියල්ලටම එක සේ උනන්දුවක්, ආශාවක් ඇතිව අන් අයෙකුගේ පෙළඹවීමකින් තොරව කරන්නේ නම් පමණකි අපට ඒ පිළිබඳව මුළු හදින්ම සතුටු විය හැක්කේ. උසස් නිලයෙකුගේ විධානයක් මත පෙළඹවීමක් හෝ බලකිරීමක් මත යමක් සිදුකිරීමෙහි සහ ඉහත සඳහන් කළ පරිදි ස්වකීය කැමැත්තෙන්ම යමක් සිදුකිරීමෙහි යන දෙකෙහි විශාල වෙනසක්, පරතරයක් දැකිය හැකිය. යමෙකුගේ නියෝගයක් මත සිදුකළ රාජකාරියක් සම්බන්ධව තමන්ට අවංකවම සතුටුවිය නොහැකිය. එය අප සියළු දෙනාම අවිවාදයෙන් පිළිගත යුතුව ඇත.

යුධ හමුදවේ අන් සියළුම ඒකකයන් ස්ථාපනය කර ඇත්තේ ශ්‍රී ලංකා පාබල හමුද රෙජිමේන්තුවේ ආභාෂයෙනි. අප අනුකරණය කරමින් ඒ සියළුම ඒකකයන් බිහි වූ අතර ඒවායේ සියළු කටයුතු සිදු කෙරෙනුයේ අපගෙන් ලත් ආභාෂය ඇසුරෙනි. දූන් දූන් ඒවායේ සුළු සුළු වෙනස්කම් දක්නට ලැබුනද, ආරම්භය අපෙනි. ඒ පිළිබඳව අප සතුටු විය හැකිවාක් මෙන්ම සිතට සුළු ආඩම්බරයක් ද ඇති වේ. පාබල හමුදවේ සොල්දදුවන් වශයෙන් එය ඔබගේ සිතෙහි ද ඇති වනවාට කිසිදු සැකයක් නොමැත. එම ආඩම්බරය තව දූරටත් සිතෙහි රඳවා ගැනීමට නම් අප සියළු දෙනාම අපගේ උද්ඝෝෂ පාඨයට සරිලන සේ ක්‍රියා කළ යුතුයි. අපට ලැබෙන සියළුම රාජකාරීන් නොපිරිහෙලා ඉටුකිරීමෙන් ප්‍රථමයෙන් ඒකකයටත්, පසුව රෙජිමේන්තුවටත් කීර්තිනාමයක් ඇතිවේ. එය පෙළෙන්, බණ්ඩයෙන්, කණ්ඩායමෙන් ආරම්භ වන්නකි. අප දූන් සියළු දෙනාම පාබල රෙජිමේන්තුවේ සාමාජිකයින් වෙමු. එබැවින් අප රෙජිමේන්තුව අද යුද්ධ හමුදව තුළ ලබා ඇති ස්ථානය එලෙසින්ම රැක ගනිමින්, ඉදිරි අනාගතයේ දී ඊටත් වඩා ඉහළ ස්ථානයකට ගෙන ඒමට අප සියළු දෙනාම එකසේ අධිෂ්ඨානය කර ගනිමු.


**සෙ/12432**

**සැරයන් කරුණාරත්න ටීඑම්එන්අයි**

**බලඇණි මූලස්ථානය 6 ශ්‍රීලපාහ**

# ශ්‍රීලපාහ 6 වන බළඇණියේ නායකත්වය

ශ්‍රීලපාහ රෙජිමේන්තුවේ 6 වන සාමාජිකයා වශයෙන් 90/06/08 දින 0810 පැයට යෙදුන ශුභ මොහොතින් ස්ථාපනය කරන ලද 6 වන ශ්‍රී ලංකා පාබල හමුදාවේ ප්‍රථම අණදෙන නිලධාරි තනතුර හෙබවීමට භාග්‍ය උදාකර ගත්තේ එවකට මේජර් නිලයේ සිටි බ්‍රිගේඩියර් ඩී රත්නසභාපති, ආර්එස්පී ශ්‍රීලපාහ විසිනි. ඒකකය ස්ථාපනයකර දින දෙකක් වැනි කෙටිකාලයක් ගතවීමත් සමග රජය සමග ද්විපාර්ශ්වික සාම සම්මුතියකට එළඹ සිටි "එල්ටීටීඊ" සංවිධානය, ඉන්දියන් සාම සාධක හමුදාවේ නික්මයාමත් සමගම සාම සම්මුතිය කඩකරමින් II වන ඊලාම් සටන ආරම්භ කළහ.

ඒකකය ආරම්භ කිරීම සඳහා ශ්‍රීලපාහ ජ්‍යෙෂ්ඨ ඒකකයන්ගෙන් අත්දැකීම් බහුල හා කාර්යශූර නිලධාරී /සෙබළ නිළයින් ලබාදුන්නද, එකිනෙකා අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවය ගොඩනගා ගැනීමේ අරමුණින් සාමූහික පුහුණුවීම් ආරම්භ කිරීමට අණදෙන නිලධාරි තුමා අදහස්කර, ඒ සඳහා සූදානම්ව සිටිය ද ඉහත කී වතාවරණය මත ඊට අවස්ථාවක් නොලදිමු. ඒ අනුව ඒකකය ස්ථාපනය කර තුන්වන දින උදවන විට "එල්ටීටීඊ" සංවිධානය I වන ඊලාම් සටන ආරම්භ කළ අම්පාර ප්‍රදේශයේ ක්‍රියාන්විත රාජකාරීන් සඳහා වාර්තා කිරීමට සිදුවිය.

මේ අවස්ථාව වන විට අම්පාර නගරය ඇතුළු අවට ප්‍රදේශ ත්‍රස්තවාදීන්ගේ තෝතැන්නක් බවට පත්ව තිබූ අතර, ඒකකය මගින් නිරන්තරයෙන් සිදුකරන ලද මෙහෙයුම් හේතුකොටගෙන ත්‍රස්තවාදී ක්‍රියා මැඩලා සාමාන්‍ය ජනජීවිතය යථා තත්ත්වයට පත් කිරීමට හැකිවිය. විශේෂයෙන්ම පාබල ඒකකයන්ගේ සාමාන්‍ය කාර්යභාරය වනුයේ ක්‍රියාන්විත රාජකාරීන්හි නිරතවීම බැවින්, ඊට මූල්තැන දෙමින් අභිනවයෙන් ස්ථාපිත කළ ඒකකය ගොඩනගා ගැනීමට ද අණදෙන නිලධාරි තුමන්ට සිදුවිය. ක්‍රියාන්විතයන්හි නියැලෙමින් ම ඒකකය ගොඩනැගීමේ දී කෙතරම් කාර්යභාරයක් හා වෙහෙසක් දැරීමට සිදු වූයේ ද යන්න ක්ෂේත්‍රයේ නියැලෙන්නන්ට පැහැදිලි කිරීම අනවශ්‍ය කරුණක්සේ සලකමි. ඒකකය ගොඩනැගීම සඳහා රෙජිමේන්තු මධ්‍යස්ථානය වෙතින් තාවකාලිකව 2 වන අණදෙන නිලධාරී වශයෙන් පත්කළ එවකට මේජර් නිලයේ සිටි බ්‍රිගේඩියර් ටීටීආර් ද සිල්වා, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී ශ්‍රීලපාහ ගෙන් ද ඉටු වූ සේවය මෙතකැයි පැවසිය නොහැක. ඒකකයේ අනෙකුත් නිලධාරීන්ගේ හා සෙබළ නිලයින්ගේ සහයෝගය මත ඒකකයේ ප්‍රථම අණදෙන නිලධාරි වශයෙන් යුධ හමුද ක්ෂෙත්‍රයේ ඉහලම ස්ථානයකට 6 ශ්‍රීලපාහ නාමය ගෙන ආ හේ, 93/01/28 දින 0638 පැයට යෙදුන ශුභ මොහොතින් එවකට මේජර් නිලයේ සිටි කර්නල් ආර්එම්ඩී රත්නායක, ආර්ඩබ්පී, ආර්එස්පී ශ්‍රීලපාහ හට හොරොව්පතාන කඳවුරේදී අණදෙන නිලධාරි තනතුර භාරදුනි.

මේ වන විට ඒකකය ස්ථාවර තත්ත්වයකට පත්ව තිබුණ ද, එම තත්ත්වය වර්ධනය කරමින් තව දුරටත් ඉදිරියට ගෙන යාමට කර්නල් ආර්එම්ඩී රත්නායක, ආර්ඩබ්පී, ආර්එස්පී, ශ්‍රීලපාහ කටයුතු කලේය. ඔහුගේ පාලන සමයේ දී විශේෂයෙන්ම ක්‍රියාන්විත රාජකාරීන්හි සාර්ථකව නියැලී ජයග්‍රහනය ලබමින් සමස්ථ යුධ හමුදව තුළම 6 ශ්‍රීලපාහ නාමය ප්‍රචලිත කිරීමට සමත් විය. 6 වන ශ්‍රී ලංකා පාබල හමුදව ක්‍රියාන්විතයන්හි පෑ දක්ෂකම් හමුවේ තම නාමය යුධ හමුදව තුළ කෙතරම් අවධානයකට ලක්ව තිබුණේ ද යත්, යම් ක්‍රියාන්විතයක් සැලසුම් කරන අවස්ථාවේ තම බලසේනාවේ සහය ඒකකයක් වශයෙන් 6 වන ශ්‍රීලංකා පාබල හමුදව ඇතුළත් කර ගැනීමට බලසේනාධිපතීන් මහත් වෙහෙසක් ගත්බව, එම බලසේනාධිපතින් ඒකක හට පිරිස් ඇමතූ අවස්ථාවන්හිදී පසක් විය. එසේම යාන්ත්‍රික බලසේනාව සමග වූ ක්‍රියාන්විතයන් හා විශේෂ බලකාය නියැලෙන ක්‍රියාන්විතයන්හි තම සහායක ඒකකය වශයෙන් 6 වන ශ්‍රී ලංකා පාබල හමුදව නිරන්තරයෙන් තෝරා ගැනීමට හේතුපාදක වූයේ කර්නල් ආර්එම්ඩී රත්නායක, ආර්ඩබ්පී, ආර්එස්පී. ශ්‍රීලපාහ ගේ මුහුකුරාගිය නායකත්වය බව අවිවාදයෙන් සඳහන් කළ යුතු වේ.

ක්‍රියාන්විතයන්හිදී මෙන්ම ඒකකයේ පාලන කටයුතු, පුහුණුවීම, ක්‍රීඩා හා අනෙකුත් සාමූහික කටයුතු වලදී ද අන් ඒකකයන්ට ආදර්ශමත් ලෙස ඒකකයේ උන්නතිය තකා ඇතිකල සේවාවන් බොහොමයක් අතුරින් පහත සඳහන් ද ප්‍රමුඛත්වයේ ලා සටහන් කළ හැක.

i. සෙබළ නිවාඩු නිකේතන (තල් සෙවන - මාදගල් / කන්කසන්තුරය)
ii. ඡායාරූප ශාලාව 6 ශ්‍රීලපාහ
iii. වීඩියෝ කැමරා සේවය
iv. ලොන්ඩ්‍රි සේවය (කේ. කේ. එස්. ක්ලිනර්ස්)
v. කරණවැමි සේවය (සැලූන් ඩී ලාල්)

වසර තුනක අණදීම තුලින් 6 ශ්‍රීලපාහ ජය මාවතේ ජයටැඹ කරාගෙන ගිය කර්නල් ආර්එම්ඩී රත්නායක, ආර්ඩබ්පී, ආර්එස්පී ශ්‍රීලපාහ, 96/01/27 දින 0750 පැයට යෙදුන ශුභ මොහොතින් ඒකකයේ අණදීම එවකට මේජර් නිලයේ සිටි ලූතිනන් කර්නල් ඩියූ ද ලැනරෝල්, ආර්ඩබ්පී, ආර්එස්පී, ශ්‍රීලපාහ වෙත කන්කසන්තුරය කඳවුරේ දී භාරදුනි. ඒකකයේ ආරම්භක නියමුවන් ගිය මග යමින් ලූතිතන් කර්නල් ඩියූ ද ලැනරෝල්, ආර්ඩබ්පී, ආර්එස්පී ශ්‍රීලපාහ ද, 6 ශ්‍රීලපාහ හි ජයග්‍රාහී නාමය රැක ගනිමින් ඉදිරියට ගෙනයාමට සමත් විය. මොහුගේ අණදීම තුළ ද ශ්‍රී ලංකා ඉතිහාසයේ ප්‍රධාන මෙහෙයුම් ගණනාවකට සහභාගී වී ජයග්‍රහණ ලද්දසේම, රිවිරැස III මෙහෙයුමෙන් අනතුරුව ඒකකය

ස්ථානගත ප්‍රදේශයන්හි අනාථව සිටි (පේදුරුතුඩුව හා කයිට්ස්) දමිළ ජනයාගේ ජන ජීවිතය නංවාලීමට ඇප කැපවීමෙන් කටයුතු කර, ඔවුන්ගේ නොමඳ ගෞරවය දිනා ගැනීමට සමත් වීම පොදුවේ යුධ හමුදාව වෙනුවෙන් ලත් සුවිශේෂ ජයග්‍රහණයකි. වර්තමානයේ ක්‍රියාත්මක වන "ජයසිකුරු" මෙහෙයුමේ ඒකකයේ අණදෙන්නා වශයෙන් කටයුතු කිරීමේ දී ත්‍රස්තවාදී ප්‍රහාරයෙන් තුවාල ලබා, තාවකාලිකව ඒකකයෙන් බැහැර වූ අවස්ථාවේ දී තාවකාලිකව ඒකකයේ අණදීම හෙබවීමට එවකට 2 වන අණදෙන නිලධාරී වශයෙන් කටයුතු කළ මේජර් එල්එම් මුදලිගේ ශ්‍රීලපාහ හට අවස්ථාව උදාවිය. ඒකකයේ ආරම්භක නියමුවන් සමග විධායක අධිකාරී, කණ්ඩායම් නිලධාරී අණදෙන හා 2 වන අණදෙන නිලධාරී වශයෙන් කටයුතු කර මනා අත්දැකීම් සම්භාරයකින් පන්නරය ලබා සිටි ඔහු ද, මේ ලත් අනගි අවස්ථාවෙන් මනා ප්‍රයෝජන ගෙන තම දක්ෂතාවය පෙන්නුම්කර ඒකකයේ ගෞරවය ආරක්ෂාකර, ආදර්ශමත් ලෙස අණදීම හෙබවිය.

ලුතිනන් කර්නල් ඩියූ ද ලැනරෝල්, ආර්ඩබ්පී, ආර්එස්පී මාස 03 ක පමණ කාලයක් නේවාසිකව ප්‍රතිකාර ලබා තම අසනීප තත්ත්වය නිසි අයුරු සුවවීමට පළමුව නැවත ඒකකය වෙත පැමිණ ක්‍රියාන්විතයන්හි නියැලුනි. "ජය සිකුරු" මෙහෙයුමට සහභාගී වීමට ඒකකයන් වැඩි පිරිසක් වන්නි ප්‍රදේශයට පැමිණීමේ දී තම මූලස්ථාන පිහිටුවා ගැනීමට සුදුසු ස්ථානයන් සොයා අනෙකුත් ඒකකයන් වෙහෙසෙන අවස්ථාවේ ඒකකය වෙත නිත්‍ය කඳවුරක් ලබා ගැනීමේ මූලික අඩිතාලමක් වශයෙන් මිහින්තලේ - මහකනදරාව වාරිමාර්ග ඉංජිනේරු ව්‍යාපෘති භූමියේ 6 ශ්‍රීලපාහ මූලස්ථානය පිහිටුවා ගැනීමට හැකිවීම ඒකකය වෙනුවෙන් ලත් සුවිශේෂම ජයග්‍රහණයක් ලෙස හැඳින්වියහැක.

ඒකකය "ජයසිකුරු" මෙහෙයුමේ යෙදී සිටින අවස්ථාවේදී ලුතිනන් කර්නල් ඩියූ ද ලැනරෝල්, ආර්ඩබ්පී, ආර්එස්පී, ශ්‍රීලපාහ අවුරුදු 02 කුත් මාස 03 ක කාලයක් දුරු ඒකකයේ අණදීම 98/04/23 දින නිම කළේය. 98/04/23 දින 0933 පැයට යෙදුන ශුභ මොහොතින් මහා සංඝරත්නයේ පිරිත් සජ්ජායනය මධ්‍යයේ පොල්තෙල් පහන දැල්වීමෙන් අනතුරුව 6 වන ශ්‍රීලපාහ පාබල හමුදාවේ නව අණදෙන නිලධාරී වශයෙන් වැඩ භාරගනිමින් තම යුධ හමුදා දිවියේ අමරණීය අවස්ථාවක් සනිටුහන් කරගැනීමට මේජර් එස්කේජීඑන්බී ඇහැලමල්පේ ශ්‍රීලපාහ භාග්‍ය උදාකර ගනී. ශ්‍රීලපාහ ජ්‍යෙෂ්ඨ ඒකකයක හා වෙනත් මූලස්ථානයන්හි විවිධ තනතුරු හොබවා අත්දැකීම් සම්භාරයක් ලබා සිටින වත්මන් අණදෙන නිලධාරී තුමන් අණදීම භාරගෙන ගත වූ සුළු කාලය තුළ දී සිය දක්ෂතාවයන් මනාව පිළිබිඹු කර ඇත.

රාජකාරි භාර ගැනීමෙන් අනතුරුව මිහින්තලාව - මහකනදරාව කඳවුරේ ආරම්භ කිරීමට යෝජිතව තිබූ "සුබ සාධක වෙළඳසැල" ගොඩනැගීම සඳහා 98/04/23 දින මුල්ගල තබමින්. 6 වන ශ්‍රී ලංකා පාබල හමුදාවේ උන්නතිය තකා ඔහු තැබූ පළමු පියවර ලෙස හැඳින්විය හැක. එසේම ලුතිනන් කර්නල් ඩියූ ද ලැනරෝල්, ආර්ඩබ්පී, ආර්එස්පී, විසින් 6 ශ්‍රීලපාහ නිත්‍ය කඳවුර වශයෙන් මිහින්තලා මහකනදරාව කඳවුර පවරා ගැනීමට දැමූ මූලික අඩිතාලම ඔස්සේ යමින්, වත්මන් අණදෙන නිලධාරී තුමා එය නිත්‍ය වශයෙන්ම පවරා ගැනීමට සියළු වෙහෙස දරමින් සිටී. ශ්‍රීලපාහ රෙජිමේන්තුවේ 6 වන සාමාජිකයා වශයෙන් බිහි වූ 6 වන ශ්‍රී ලංකා පාබල හමුදාව සිය 8 වන විය සපුරන විට එහි අණදීම හෙබවීමට භාග්‍ය ලත් මේජර් එස්කේජීඑන්බී ඇහැලමල්පේ ශ්‍රීලපාහ හට 6 වන ශ්‍රීලපාහ කීර්ති නාමය දිනෙන් දින ජයටැඹ කරා ගෙන ගොස් ජයදද ලෙලවීමට සියළු ශක්තිය හා ධෛර්ය ලැබේවා යන්න ඒකකයේ සියළුම නිළයින්ගේ ඒකායන පැතුමයි.

6 වන ශ්‍රී ලංකා පාබල හමුදාව සැද දිනේවා

| |
|---|
| සෙ/13394 ව/සැරයන් ප්‍රීතිකුමාර කේජ්ආර් |
| බුද්ධි අංශය - 6 ශ්‍රීලපාහ |

# ලන්තෑරුම් ගත් මදුරුවෝ

මේ සිදුවීම සිදු වී තිබෙන්නේ එවකට අප රටට පැමිණි ඉංග්‍රීසි සොල්දාදුවන් දෙදෙනකුට ය. සොල්දාදුවන් හට නවාතැන් ගැනීමට සාද තිබූ කූඩාරමක් තුළ ඔවුන් දෙදෙනාට නිදා ගැනීමට සිදු විය. දැඩි රස්නයකින් යුත් කූඩාරම තුළ ඔවුන්ට නිදා ගැනීමට නොහැකි වී ඔවුන් දෙදෙනාම එළියට පැමිණ නිදාගත්හ. එළියේ හමන සුළං වලට දැනෙන සනීපයට හොඳ හැටි නින්ද ගොස් තිබුණි. එම අවස්ථාවේ එක් සොල්දාදුවෙකුට අවදිවීන ඒ අවදි වී ඇත්තේ අප කවුරුත් දන්නා මදුරුවන් විදීමෙනි. නමුත් මදුරුවන් ගැන කිසිත් නොදත් ඔහු අනෙකාට කථා කර "මචං මොකුන් ද සත්තු වගයක් විදිනවා ඇඟත් හරියට දනවා. මෙතැන ඉන්න බැහැ කූඩාරමට ගොස් නිදගමු යයි පැවසුය.

දෙදෙනාම කූඩාරම ඇතුලට ගොස් දෙපැත්තෙන්ම ඇති කවුලු වසා නිද ගැනීමට සූදානම් වුනා පමණි. කූඩාරමට ඇතුල් වූ කලාමැදිරියන් දෙතුන් දෙනෙක් එළිපත්තු කරමින් ඒ මේ අතර පියාඹා යනු එක් සොල්දාදුවෙක් දුටුවේ ය. ඉන්පසු අනෙක් සොල්දාදුවාට ඔහු පැවසුවේ මචං දැන්නම් බේරෙන්න ක්‍රමයක් නැහැ උන් ලන්තෑරුම් පත්තු කරගෙන අපි හොයනවා. ඉන්මනට පොරොනයෙන් ඇඟ වසාගෙන හැංගෙමු යනුවෙනි.

| |
|---|
| සෙ/300676 සැරයන් තෙවිල් කුමාර එම් |
| 10 ශ්‍රීලපාහ "ඩී" කණ්ඩායම |

## සෙබලාගේ යෞවනය

කුරිරු යුද්ධය වෙත
සුන්දර ජීවිතය කැප කල
සුන්දර තාරුණ්‍යය ජීවිත පුද කල
වීර සොයුරනි ඔබෙන් පසු එන
ලෝකය උදෙසා
ඔබ කළ සේවය
එදා අප මෙන් මතු දද උපදින
තරුණයාගෙන් ඉටු වේවි

ඉතින් සොයුර අමතක කරන්න
සුන්දර යෞවනයේ
ගන්න සුරතට අවිය
යෞවනයේ නාමයෙන්
දෙනු මව්නි මාහට අවසර...

සෙ/128405 ආසෙ කරුණානායක පීඩීආර්
1 ශ්‍රීලපාහ "ඒ" කණ්ඩායම

# ඒකක පස්වන සංවත්සරය සැමරීම

# 9 වන(සෙව්) බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදව

9 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමදව 1998 නොවැම්බර් මස 01 දින සිය පස්වන සංවත්ස්රය සැමරීමට සැරසෙන මෙම අවස්ථාවේ අප මෙතෙක් ආ ගමන් මග මොහොතකට ආපසු හැරී බලමු. 1993 ක් වූ නොවැම්බර් මස 01 වන දින ශ්‍රී ලංකා යුධ හමුද ස්වේච්ඡා බලසේනාවට නව පාබල ඒකකයක් ලෙස 9 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදව අලුතෙන් ස්ථාපිත කෙරුන අතර, මෙම බළඇණිය නගා සිටුවීමෙහිලා ස්වේච්ඡා බළසේනාවේ නොයෙකුත් ඒකකයන් වෙතින් නිලධාරීන් / සෙසුනිළයින් සිය කැමැත්තෙන් ඉදිරිපත් වී පැමිණෙන ලදී. එසේ පැමිණි පළමු සාමාජිකයන් රැස්කොට ඒකකයේ පළමුවන අණදෙන නිලධාරී වශයෙන් රාජකාරී භාරගත් ලූතිතන් කර්නල් (එවකට මේජර්) ජේබී ගල්ගමුව - ශ්‍රීලංසිරෙ විසින් 1993 නොවැම්බර් මස 01 වන දින එළඹි සුභ මොහොතින් පොල්තෙල් පහනක් දල්වා යාපනය අර්ධ ද්වීපයේ මයිලඩි කඳවුරේ දී ඒකකයේ රාජකාරී කටයුතු ආරම්භ කරන ලදී.

නව ඒකකයක් නගා සිටුවීමේ දී කණ්ඩායම් වශයෙන් නිත්‍ය ඒකකයන්ට අනුයුක්තව රාජකාරී කිරීමට සිදුවිය. මෙලෙස ඉතා සුලු කාලයක් රාජකාරීන් සඳහා විසිරී සිටි අප භට පිරිස් 1994 මාර්තු මස වන විට ඒක රාශි කොට ගෙන ස්වාධීනව ඒකකයක් වශයෙන් රාජකාරීන් ඉටු කිරීම ආරම්භ කරනලදී. මේ අනුව මයිලඩි ටී හංදියේ සිට කන්කසන්තුරය දක්වා වූ වෙරළබඩ තීරය ආරක්ෂා කිරීමේ භාරදූර කාර්යය භාරගන්නා ලදී.

මෙලෙස රාජකාරීන් කරමින් සිටින අතරතුර 1994.04.12 වන දින ලුතිතන් කර්නල් (එවකට මේජර්) ජීකේ වික්‍රමසිංහ ශ්‍රීලපාහ අප ඒකකයේ අණ දෙන නිලධාරී වශයෙන් වැඩ භාරගැනීමට පැමිණෙන ලදී. මෙතුමා යටතේ ද පෙරකී ස්ථානයේම පැවරී තිබූ රාජකාරීන් මැනවින් ඉටු කිරීමෙහිලා නිරතව සිටින ලදී. මෙම වසර අග භාගය වන විට ඒකකයේ පළමු වන සංවත්සරය ළඟා වෙමින් තිබුණි. ත්‍රස්තවාදී උවදුරු කොතෙක් තිබුණ ද පළමුවන සංවත්සරය සැමරීම සඳහා අණදෙන නිලධාරී තුමන්ගේ අධීක්ෂණය යටතේ නිලධාරී මණ්ඩලයේ උද්යෝගීමත් උත්සාහයෙන් සියලු කටයුතු සූදනම් කෙරින. ඒ අනුව මයිලඩි යුධ හමුද කඳවුරේ දී අප ඒකකයේ පළමු සංවත්සරය විසිරී සිටි භට පිරිස් ද නව ඒකකය යටතේ එකට රාජකාරී කරමින් සැමරීම උත්කර්ෂවත් අන්දමින් පවත්වන ලදී.

ඉන් අනතුරුව ඉතා කෙටි කාලයකින් එනම් 1994.12.10 වන දින නැවතත් අණදෙන නිළධාරී මාරුවීමක් ඇති විය. මේ අනුව 1994.12.10 වන දින ලුතිතන් කර්නල් (එවකට මේජර්) ඒයූසි සූරවීර ශ්‍රීලපාහ අණදෙන නිලධාරී වශයෙන් වැඩ භාරගන්නා ලදී. එතුමා යටතේ ද සුපුරුදු පරිදි රාජකාරීන් ඉටු කරන ලදී. අණදෙන නිලධාරී වශයෙන් ක්‍රියාකළ මේජර් ඒයූසී සූරවීර ශ්‍රීලපාහ 1995.08.01 වන දින ලුතිතන් කර්නල් නිලයට උසස් වීමක් ලැබූ අතර, මෙතෙක් අප ඒකකයේ අණදෙන නිලධාරී වශයෙන් වැඩිම කලක් සේවය කළ නිළධාරියා ද ඔහු විය. මේ වන විට අප ඒකකය යාපනය අර්ධ ද්වීපයේ ස්ථාන ගණනාවකම එනම් මයිලඩි, ඉලෙයිකාඩු, කන්කසන්තුරය, වැල්වටිතුරය, පේදුරුතුඩුව, පොන්නාලෙයි, මාදගල්, නාවක්කේරි, තොන්ඩමනාරු, වාසවිලාන්, කොඩිකාමන්, පොන්නාලෙයි, කඩ්ඩුවාන්, පුත්තූර්, කෝපායි, නිර්වේලි, අච්චුවේලි, කුප්පිලාන්, අච්චුවේලි යන ස්ථානවල රාජකාරීන්හි නිරතව සිටි බව සඳහන් කළයුතුව ඇත. මෙලෙස ටික කලක් ගතවීමෙන් අනතුරුව, නැවත නව අණදෙන නිලධාරී වරයෙකු පත්ව එන ලදී.

1998 අප්‍රේල් මස 08 වන දින ලුතිතන් කර්නල් ඩබ්ඩීඑල්පී වික්‍රමසිංහ ශ්‍රීලපාහ නව අණදෙන නිලධාරී වශයෙන් වැඩ භාරගන්නා ලදී. ඒකකයේ ආරම්භයේ සිට පළමුවෙනි දෙවන අණදෙන නිලධාරී වශයෙන් පූරා අවුරුදු 03 ක් රාජකාරී කළ නව අණදෙන නිලධාරී තුමා යටතේ ඒකකයේ පස්වන සංවත්සර දිනය 1998.11.01 වන දින ඉතා උත්කර්ෂවත් අන්දමින් පවත්වන ලදී.

ඒ සඳහා අණදෙන නිලධාරී තුමන්ගේ සම්පූර්ණ උපදෙස් පරිදි අනෙකුත් නිලධාරී සෙනීන්ගේ ද සහභාගීත්වයෙන් යුතුව පහත සඳහන් පරිදි ඉතා චාම් අන්දමින් උත්සවයක් සංවිධානය කරන ලදී. එනම් 19998.10.30 වන දින සංඝයා වහන්සේලා ඒකකයට වැඩම කරවා පිරිත් සජ්ඣායනාවක් පැවැත්වීම, 1998.11.01 වන දින 0630 පැයට ජාතික ධජය සහ ඒකක ධජය එසවීම, 0900 පැයට අණදෙන නිලධාරීතුමන් වෙනුවෙන් පැවැත්වෙන සම්මාන පෙළපාලිය පිළිගැන්වීම, 0945 පැයට අණදෙන නිලධාරී තුමන්ගේ දේශනය, 1100 පැයට ත්‍යාග හා සහතිකපත් ප්‍රධානය කිරීම. 1245 පැයට සියලු නිළයින් වෙනුවෙන් පැවැත්වෙන දිවා භෝජන සංග්‍රහය, මියගිය රණවිරුවන්ගේ නාම පුවරු විවෘත කිරීම, 1998.11.02 වන දින බනි/සැරයන් නිවස්නයේ දිවා භෝජන සංග්‍රහය, 1998.11.04 වන දින නිලධාරී නිවස්නයේ දිවා භෝජන සංග්‍රහය පැවැත්වීමෙන් උත්සවයේ කටයුතු නිමාවට පත් කෙරිණි.

පාලන කණ්ඩායම සහ රයිෆල් කණ්ඩායම් 05 ක් යටතේ අණු කණ්ඩ 15 ක් පිහිටුවා භටපිරිස් ස්ථානගත කර වලිකාමන් නැගෙනහිර ප්‍රදේශයේ බලය තහවුරු කර ගනිමින් මේ වන විට

ක්‍රියාත්වින රාජකාරීන්හි යෙදී සිටින අප ඒකක හට පිරිස් තම රාජකාරීන් කැපවීමකින් හා උනන්දුවෙන් ඉටු කරන බව සඳහන් කරනුයේ හදපිරි සතුටිනි. 9 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුද ඒකකය ස්ථාපිත වූ දින පටන් මේ දක්වා පූරා වසර 05 ක් නොකඩවා යාපනය අර්ධද්වීපය තුලම ඉතා උසස් සේවාවක් ඉටු කළ බව ආඩම්බරයෙන් හා නිහත මානීව කිවයුතු අතර, මෙම වසර 05 ඇතුලතදී රුදුරු ත්‍රස්තවාදීන් සැඟව සිට කරන ලද ම්ලේච්ඡ පහර දීම් හේතු කොටගෙන එක් නිලධාරියෙකු ඇතුළු සෙසු නිළයින් 26 ක් රටජාතිය වෙනුවෙන් සිය වටිනා ජීවිත පරිත්‍යාග කරන ලදී. එලෙස අප අතරින් වියෝ වූ වීරෝදර රණවිරුවන් සැම භක්ති ප්‍රණාමයෙන් සිහිපත් කරන්නෙමු.


තව ද අප ඒකකය අයත් බළසේනාව වන 511 බළසේනාවේ සේනාධිපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලයත්, සේනාංකය වන 51 වන සේනාංකයේ සේනාධිපති තුමා ඇතුළු සියලූ නිළයින්ගෙන් ද අපහට ලැබෙන උපදෙස් හා මග පෙන්වීම අපගේ රාජකාරීන් සඳහා මහත් රුකුලක් වී ඇති බව ස්තුති පූර්වකව සිහිපත් කරමි.

එපමණක් ද නොව ශ්‍රීලංයුහයේ බළසේනාවේ සේනාවිධායක තුමා ඇතුලූ සියලූම නිළයින් ද ශ්‍රී ලංකා පාබල හමුද රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති තුමා ඇතුලු සියලූම නිළයන්ගේ ද පාලනමය අතින් ලැබෙන උපදෙස් හා මගපෙන්වීම මෙහිලා සිහිපත් කරනුයේ කෘතඥතා පූර්වකය.

9 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල ඒකකයේ ඒකායන ප්‍රාර්ථනය වන්නේ ත්‍රස්තවාදය සඳහටම අප රටින් තුරන් වී සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් බිහිවේවා යන්නයි. ඒ සඳහා සියලු ධෛර්ය හා ශක්තිය ලැබේවා.

සෙ/9ඩී00026
ව/සැර ද සිල්වා ඩීඑස්පීජ්
ප්‍රධාන ලිපිකරු - මූලස්ථාන -
9 (සෙවි) ශ්‍රීලපාහ





යුධ හමුද දිනය නිමිත්තෙන් 1998.10.10 වෙන දින යාපනය අර්ධද්වීපයේ අච්චුවේලි ප්‍රදේශයේ අච්චුවේලි රජයේ රෝහල ශ්‍රමදනයක් මගින් සුද්ධ පවිත්‍ර කර එම රෝහලේ නේවාසික රෝගීන් හට පිසින ලද ආහාර වේලක් පිලිගැන්වීම වෙනුවෙන් පැවැති උත්සවය

## බිඳුන පෙම

උඳුවප් සීතලේ ගැහෙමින් ගන කැලය මැද
සිත තුළ සිහින දකිමින් හෙට ගැනත් අද
තරුණ විය රකිමින් බංකරය අද
සුපුරුදු රැය පහන් විය දහසක් පැතුම් මැද

සිතනා විලස මා යන මග වෙහෙස කර
යන්නට සිතුවේ කැන්ද ඇය මගේ කර
එනමුදු නොහැකි දෛවය ගෙන වෙනස් කර
සුපුරුදු අවිය අත ඇත ඇය දුරස් කර

පතනා හැගුම් සුළඟට මුසු වුනාවේ
සොඳුරු රැයක් බංකරයේ තනි වුනාවේ
දුක සැප දෙකම එක ලෙස හමු වුනාවේ
නිසල බිමක පනරැලි රැඳ වුනාවේ.

සෙ/308958
සාසෙ ජයසිංහ ජේකෝට්
1 ශ්‍රීලපාහ "ඒ" කණ්ඩායම




# අන්තර් රෙජිමේන්තු එල්ලේ තරගාවලිය -

## 1998 වසර සඳහා රෙජිමේන්තු ශ්‍රීලපාහ විසින් තරගාවලියේ අනුශූරතාවය දිනාගැනීම

ශ්‍රී ලංකා පාබල හමුද රෙජිමේන්තුවේ නව රෙජිමේන්තු අධිපති වශයෙන් මේජර් ජෙනරාල් එච්එච්එස් කෝට්ටේගොඩ, ආර්ඩබ්පී, ආර්එස්පී, යූඑස්පී පත්වීමෙන් පසු පළමුවෙන්ම රෙජිමේන්තුව නියෝජනය කළ ක්‍රීඩා උත්සවය වූයේ රෙජිමේන්තු එල්ලේ තරගාවලියයි. මෙම ක්‍රීඩා තරගයේ දී රෙජිමේන්තු ශ්‍රීලපාහ කණ්ඩායම තරගාවලියේ අනුශූරතාවය දිනා ගන්නා ලදී. මෙම ජයග්‍රහණය සඳහා ක්‍රියාත්විත රාජකාරියේ යෙදී සිටින සියළුම ඒකක වෙතින් සෙනින් ගෙන්වා ගැනීම සඳහා රෙජිමේන්තු අධිපතිතුමාගේ මග පෙන්වීමත් රෙජිමේන්තු සේනාවිධායක ලුතිතන් කර්නල් ජේඑස් මාසක්කාර, ආර්එස්පී, ශ්‍රීලපාහ ගේ පූර්ණ අනුග්‍රහයත් සමගම එල්ලේ තරගාවලිය භාරව ක්‍රියා කළ මේජර් එල්එම් මුදලිගේ, ආර්එස්පී, ශ්‍රීලපාහ ගේ පූර්ණ කැපවීම සහ දයකත්වය මහත් සේ බලපාන ලදී.

අදල තරගාවලියේදී රෙජිමේන්තු කණ්ඩායම් දෙලහක් අභිබවා රෙජිමේන්තු ශ්‍රීලපාහ කණ්ඩායම විසින් තරගාවලියේ අනුශූරතාවය දිනා ගන්නා ලදී.

අවසාන මහා තරගය රෙම, ශ්‍රීලංසංබ සහ රෙම, ශ්‍රීලපාහ අතර පැවැති අතර එම තරගාවලියේදී රෙජිමේන්තු ශ්‍රීලපාහ එල්ලේ කණ්ඩායම විසින් තරගාවලියේ අනුශූරතාවය දිනා ගන්නා ලදී.

අදල තරගාවලියේ අනුශූරතාවය දිනා ගැනීම සඳහා පහත නම් සඳහන් ක්‍රීඩකයින් සහභාගී වන ලදී.

සෙ/11795 බනි 11 රණසිරි ජේඑස්එස්ඩී (උපනායක), සෙ/13327 ව/සැරයන් ජයවික්‍රම ආර්ජ්ජ් (නායක), සෙ/302187 කෝප්‍රල් පෙරේරා එම්ජ්ජ්, සෙ/15274 කෝප්‍රල් තිලකරත්න ඊඑම්, සෙ/302288 කෝප්‍රල් ප්‍රේමදස පීආර්,සෙ/304882 කෝප්‍රල් මහින්ද එල්ඩී, සෙ/302758 සාසෙ කුමාර බීඑම්එස්, සෙ/305470 සාසෙ තුෂාර එම්යූ, සෙ/304472 ලාකෝ වසන්ත කේජ්පීආර්, සෙ/123650 ආසෙ මංජුකුමාර ඩබ්, සෙ/22714 සාසෙ සරත් ඩබ්ජ්, සෙ/01755 සාසෙ ප්‍රනාන්දු ඩබ්, සෙ/103108 සාසෙ ප්‍රනාන්දු පීසී, සෙ/116404 සාසෙ කරුණාතිලක කේබි, සෙ/62278 ආසෙ ආරියපාල පී, සෙ/104618 සාසෙ චන්දන කේජ්එස්, සෙ/02061 සාසෙ ද සිල්වා එම්ජ්පේ

.

# පිරිහුණු සමාජය ගැන සිතිවිල්ලක්


ලෝකයේ සෑම සත්ත්වයෙක් ම දිහා බලන විට මනුෂ්‍යයාට හිමි වන්නේ මුල් තැනකි. මන්ද යත් මිනිසා අන් සත්ත්වයන්ට වඩා බුද්ධිමත් හා ක්‍රියාශීලී බව නිසා ය. බුද්ධිමත්ව හා ක්‍රියාශීලීව සිටින මිනිසා සෑම විටම සම්පූර්ණය. නමුත් අද සමාජය දෙස විමසිලිමත්ව බලන විට මිනිසාට හිමි වන්නේ දෙවන තැනකි. අප විසින් ජීවත් වන මේ සුළු කාලයතුල අපෙන් අපගේ දෙමාපියන්ට, ගුරුවරුන්ට, සමාජයට රටට, ජාතියට, ඉටුවිය යුතු සේවාවන් රාශියක් ඇත. ඒත් අද සමාජයේ එය සිදුවන්නේ සියයක් ගත්තොත් කී දෙනාගෙන් ද. මේ හේතුවෙන් දූෂණ, වංචා, සොරකම්, මත්පැන් හා මත්ද්‍රව්‍ය භාවිතා කිරීමත් නිසා ආගමක්, ධර්මයක් නැති මව්පියන් නොහඳුනන පිරිහුනු සමාජයක් දනටමත් එළඹී අවසානය. පිරිහුණු සමාජ තත්ත්වය අනුව මෙය පැටලි පැටලි ගොස් පිළිලයක් වාගේ වර්ධනය වී ඇත. අපි අප ගැනම අවංකවම මොහොතක් සිතමු. අපි අවුරුද්දකට කී වතාවක් තමන්ගේ ආගම අදහනවා ද, අන් ආගම් අද ඉතාමත් දියුණු වී ඇත. ඒත් අපගේ පිරිසිදු බුද්ධාගම අප ශත පහකටවත් ගණන් නොගනී. අනෙක් කරුණ නම් අපි පුංචි කාලයේ ඉඳලාම කැන කුණු අනගාලා දහසකුත් දුක් විඳලා නොකා නොබී පාසැල් ඇරලා, සිප් සතර උගන්වා හොඳ නරක දෙක උගන්වලා සම්පූර්ණ මිනිසෙක් කරලා සමාජයට එළඹෙන අපි රැකියාවක් ලැබුනාම ආදරවන්තියක් ලැබුනාම අපට අපේ අසරණ දෙමාපියන් අමතක වී යාමයි. කැන කුණු අත ගාපු අම්මාට වඩා පසුව මුණගැසුණු ආදරවන්තියට ආදරය කරයි. ඊට පසු දෙමාපියන්ට යන්න එන්න බැරි වෙන කොට මහලු මඩම්වලට දමා සතුටින් ජීවත් වෙන දූ දරුවන් අද සමාජයේ කොතෙකුත් සිටී ද, ඒ වගේම තත්ත්පරයට ගත්තොත් ස්ත්‍රී දූෂණය කියක් තිබේ ද, මංකොල්ල සොරකම්, කොතෙක් අද අහන්න දකින්න ලැබෙනවාද? මත් පැන් භාවිතය අද කොතෙක් දුරට වර්ධනය වී තිබෙනවාද, මෙම අධර්මික සමාජය තුළ මෙය නැති කරන්නට බැරි තරමට පිරිහී ගොස් ය. අපි පොඩ්ඩක් සිතමු, කොතන ද මෙහි ආරම්භය, කොතන ද අපට වැරදී ඇති තැන. අපි අදම සිතමු අදම ක්‍රියාත්මක වෙමු. සොරකම්, මැරකම්, දූෂණ නැති ජීවිතයක් ගත කරන්න තිබේ නම් එය කොච්චර හොඳ ද, අපි අපේ ආගමට අනුව පළමුව ධාර්මිකව ජීවිතයක් ගත කරමු. සමාජයේ පිළිකුල් කරන ක්‍රියාවලින් ඈත් වෙමු. බුද්ධිමත්ව සිතා බුද්ධිමත්ව ක්‍රියා කර රටටත් ජාතියටත් මෙහෙවරක් කර රටේ ලස්සන මල් කැකුළු ලෙස ලස්සන මිනිස් සමාජයක් බිහිවේවායි අපි ප්‍රාර්ථනා කරමු.

**සෙ/311600 ආසෙ සිරිවර්ධන ඩීඑස්ටී**
**10 ශ්‍රීලපාහ "ඩී" කණ්ඩායම**

# ජයසිකුරු ජයමාවත කරා 6 ශ්‍රීලපාහ



ජයසිකුරු සටන් බිමට
වැඩම කළ සංඝරත්නය
රණවිරුවන්ට සෙත් පතමින්.



ජයසිකුරු සටනේදී අත්
අඩංගුවට ගන්නා ලද
ත්‍රස්තවාදියෙකුගෙන් ප්‍රශ්න
කරන අණදෙන නිලධාරී
තුමා ඇතුළු පිරිස.



ජයසිකුරු මෙහෙයුමේදී තුවාලලත්
නිලධාරියකු රෝහල වෙත
ගෙනයාමට සූදානම්ව.

එල්.ටී.ටී. ඊ සංවිධානයේ "ඊලාම් දේශයක්" පිහිටුවීමේ නිරර්ථක උත්සාහය මත ඇති වූ වත්මන් යුද්ධයෙන් උතුරු දකුණ යාකරන ගොඩබිම් ප්‍රධාන සැපයුම් මාර්ගය අත්පත් කරගැනීමේ "ජයසිකුරු" ක්‍රියාන්විතය දියත් වී දැනට වසර එකහමාරක් ඉක්ම ගොස් ඇත. හමුදමය අතින් අප හට පිරිස් මේ වන විටත් විශාල ජයග්‍රහනයන් කීපයක් නතුරගෙන හමාර වී ඇත. අව්, වැසි කලට වේලාවට ආහාර මෙන්ම සුඛවිහරනය නොතකා සෙබළුන්ගේ දැඩි කැපවීම හා අධිෂ්ඨානය නොවන්නට ශ්‍රී ලංකා ද්වීපයට රුදුරු ත්‍රස්තවාදීන්ගේ ග්‍රහණයට පත්වී හමාරය. වත්මන් සෙබලා තම අනාගත පුතුට මෙවැනි පාපතර යුද්ධයකට දයකවීමට හෝ එහි ශාපය ලැබීමට ඉඩ නොතැබීම සඳහා දිවි පරිත්‍යාගයෙන් සේවය කරයි.

"ජයසිකුරු" ක්‍රියාන්විතයේ තවත් වේගවත් පියවරක් ඉදිරියට තබමින් ත්‍රස්තවාදීන්ගේ බලකොටුවක්ව පැවැති මාන්කුලම් නගරය අත්පත්කර ගැනීමට සැලසුම්කර තිබුන අතර, මෙහි ප්‍රහාරක බළඇණියක් ලෙස මෙම බළඇණිය ද එක් විය. එල්ටීටීඊ නායක වේලුපිල්ලේ ප්‍රභාකරන් ජාත්‍යන්තර ප්‍රජාව හමුවේ තේජාන්විතව මාන්කුලම නගරය ආරක්ෂක හමුදවන් අතට නොදෙන බව පවසා සිටි අතර, එය හමුද ග්‍රහණයට නොදී සාම ප්‍රයත්නයකට වැයම් දැරිය.

1998.09.29 දින පහන් වන්නට මාන්කුලම් මුද ගැනීමේ මෙහෙයුම ක්‍රියාත්මක විය. මේ සඳහා 55 සේනාංකය යටතේ 551, 552 සහ 553 බළසේනාත් 53 සේනාංකයත් එක්විය. 30 වන දින පහන් වනවිට මාන්කුලම් නගරය මුළුමනින්ම අත්පත් කරගත් අප හමුදවෝ එතැනින් නොනැවතී තවත් ඉදිරියට ගමන් ගත්හ. ත්‍රස්තවාදීන් වියරු වූ වෘකයින් සේ පහර පිට පහර දීමට යුහුසුළු වූහ. අවසානයේ සෙබළුන් 11 දෙනෙකු ජාතිය වෙනුවෙන් අභීතව දිවි පිදීය. නිලධාරීන් 05 X 108 ක් තුවාල ලැබීය. සෙබළුන් දෙදෙනකු අතුරුදහන්විය.

## එල්ටීටීඊ ළමා බළකාය

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ විශේෂ නියෝජිත "ඵලාරා ඔටුනු" මහතා එල්ටීටීඊ නායකත්වය මූණ ගැසුනු අවස්ථාවේ කුඩා දරුවන් යුද කටයුතු සඳහා යොද නොගන්නා බවට ප්‍රතිඥවක් දී තිබුණි. ඒ බව පුවත්පත්වල පළවී නිමවීමටත් ප්‍රථම හය හතර නොතේරෙන ළමා දරු දැරිවියෝ එල්ටීටීඊ නායකත්වය විසින් මෙම පාපතර ක්‍රියාවට හවුල්කරගෙන තිබුණි. එවැනි එක් දමිල කුඩා දරුවකු කිසිවක් නොදැන අපහට භාරවිය. නමින් රාමන් විපුලානන්දන් නම් වූ මොහු වයස අවුරුදු 14 ක් වයසැති ළදරුවෙකි. අනාගත සුව සිහින මවන එල්ටීටීඊ නායකත්වය එය බුක්ති විඳීමට උත්සාහ දරනුයේ ඔවුන්ගේම දරුවන්ගේ ළපටි ළමාවිය බිල්ලට දෙමිනි. ඔවුන්ගේ සිත්තුලට යුද්ධය යන්න කාවද්ද ඇත. අපට භාරවූ රාමන් පවසා සිටියේ තම නායත්වය සැමවිටම සිංහල හමුදවෝ මිනී කන හමුදවක් බවටත් ඔවුන්ගේ ඉඩකඩම් බලෙන් ලබාගැනීමට එන බවත් ඔවුන්ට පවසා ඇති බවකි. එහෙත් භාරවූ රාමන් ඒකක අණදෙන නිලධාරී මේජර් එස්කේජීඑන්බී ඇහැලමල්පෙ, ආර්එස්පී, ශ්‍රීලපාහ හමුවට පැමිණි අවස්ථාවේ නෙතහ කඳුලින් නැහැවිණි. රාමන්ට පියෙකු සේ කෑම, බීම ලබා දී තුවාල වලට බෙහෙත් දැමීය. රාමන් තම පුංචි සිතින් ඔවුන්ගේ කෲර නායකත්වයට හා තමාට ලබා දී තිබූ වහයි බස්වලට බැනවැදීය යන්න නොරහසකි. තවත් මෙවැනි දරු දැරිවියන් විශාල පිරිසක් භාරවී සිටියහ.

## මාන්කුලම් සිංහ ධජය එසවීම

මාන්කුලම් නගරය අත්පත් කර ගැනීමෙන් පසු විශේෂ සිද්ධියක් වූයේ පෙර මාන්කුලම් හි පැවැති යුධ හමුද කඳවුරේ නාම පුවරුව හමු වීමයි. පසුදින එම ස්ථානයේ ගරු ආරක්ෂක නියෝජ්‍ය ඇමති ජෙනරාල් අනුරුද්ධ රත්වත්තේ මැතිතුමා සහ ත්‍රිවිධ හමුද සහ පොලීසියේ ප්‍රධානත්වයෙන් පැවැති උත්සවයක දී මාන්කුලම් නගරයේ මෙතෙක් පැවැති එල්ටීටීඊ ධජය වෙනුවට තේජාන්විත සිංහ ධජය ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමා අතින් එසැවුනි. එහි දී ජෙනරාල් අනුරුද්ධ රත්වත්තේ මැතිතුමා සෙබළුන්ගේ තතු විමසීම ද විශේෂ සිද්ධියක් විය.

## පොදු කරුණු

මාන්කුලම් හමුදව ජයගැනීමෙන් අනතුරුව අප ඒකක හට පිරිස් මාන්කුලම් ඉදිරි ආරක්ෂක වළල්ලේ ස්ථානගත විය. එතැන් සිට මේ දිනවල සීමිත ක්‍රියාන්වින වල යෙදෙමින් පවතියි. මේ අතර මාන්කුලම් යුධ බිමට ත්‍රිවිධ රත්නය වැඩම කිරීම විශේෂ සිදුවීමක් විය. එසේ වැඩමකළ පූජ්‍ය මාතලේ විජිත වංශ හිමි, පූජ්‍ය මහකැලැගම රතනවංශ හිමි සහ පූජ්‍ය මොරවක ආනන්ද හිමි (මිහින්තලය ප්‍රදේශයේ පන්සල් වලින්) යන හිමිවරුන් "ජයසිකුරු" රණවිරුවන්ට සෙත් පැතීය. අප ඒකක අණදෙන නිලධාරීගේ මූලිකත්වයෙන් එම සහරුවන් මාන්කුලම් වෙත වැඩම කර වූහ.

යුද්ධය යනු ජයපරාජය දෙකම සම සමව පවතින්නකි. පිරිස් බලය හා මහජන විශ්වාසය බිඳී ගොස් ඇති ත්‍රස්තවාදීන් දැන් විශාල පසුබෑමකට ලක් වී ඇත. එබැවින් මෙම පාපතරයන් පරාජයකර පලවා හැර නුදුරේදීම වව්නියාව සිට කිලිනොච්චිය දක්වා දිවෙන ප්‍රධාන මාර්ගයේ ආරක්ෂක හමුද ආධිපත්‍යය පතුරුවා ගැනීමට හැකිවනු ඒකාන්තය. උතුර දකුණ යා කෙරෙන මාර්ගයේ සිංහ ධජය ලෙලදෙන මොහොත උදවන තෙක් 6 වන ශ්‍රී ලංකා පාබල හමුදවේ ආධුනික සෙබලා සිට අණදෙන නිලධාරි දක්වා ජීවිත පරිත්‍යාගයෙන් හා ආත්ම විශ්වාසයෙන් යුතුව රාජකාරී කරමින් පසුවන අතර, නුදුරේ දීම එම කටයුත්තට දයක වී පාබල හමුද නාමය "රන්" අකුරින් ලියවීමට අප බැඳී සිටී.

කේ ඒ පුෂ්පකුමාර, ආර්එස්පී
ලුතිතන්
බුද්ධි නිලධාරි - 6 ශ්‍රීලපාහ

# පෙර දින මා වෙත පුදකල සෙනෙහස අමතක කර දමලා නැවුම් පෙමක් ගැන සිතුවේ ඇයි ඔබ මගෙ හදවත රිදවා

## අහිමි පෙම්වතිය

තල් වැට අයිනේ හමාගෙන ආ සිසිල් සුළං රැල්ලක් ගත නහවා හඹාගෙන ගියා. තල් ගස් අතරින් පායාගෙන එන සඳ රන්තරන් පාටින් බැබලීගෙන ඉර බැසගෙන යන විට කඳවුර සමගින් සඳ එළිය දෙස බලන්නේ මොන තරම් කුතුහලයකින් ද? මව් බිමේ ඒකීය භාවය වෙනුවෙන් අපගේ ජීවිතය කැප කරල තියෙන බව තේරුම් නොගත් සිංහලයින් කොටසකුත් මේ රටේ ඉන්නවා කියලා දැනුන වේලාවේ සිතට ආ අසීමිත වේදනාව කඳුලක් වෙලා නෙත්දෙකින් ගලාගෙන යා නොදී රැක ගත්තේ අසීමිත වේදනාවකිනි.

බියකරු රාත්‍රියේ අඳුරෙන් වැසීගෙන ඇති මහ කැලෑවේ සිට කොටියන් අප දෙස පියමන් කරනවා ද යන්න අප ඉදිරිය බලාගෙන සිටියේ තල් කොට බංකරයේ පුංචි කවුළුව අතරිනි. උදවන සෑම රාත්‍රියකම නෙත් ඉදිරිය මානන කළ සිත ඔබ කරා දිව ගියේ නිරායාසයෙන්මය. ජීවිතය අන්තයටම ඔබ සමග ඉගිල යන්නට පාරමී පිරූ මාගේ අත්තටු බිඳ දමා ඔහු සමග පියමන් කරන ඔබ දෙස කඳුලු පිරුණු දසින් නොබලන්නට උදවන සෑම දවසකම පාරමී පුරමි. රුදුරු ත්‍රස්තයන් විසින් එල්ල කරන ලද ප්‍රහාරයෙන් මාගේ එක් පාදයක් අහිමි වූ ද පටන් ඔබ ඔහුගේ සුවය පැතුවාය. එය සිහිපත් වනවාරයක් පාසා මාගේ හදවතේ දැවී අලුවී යන තරමේ වේදනාවක් ඇවිලෙන්නේ ය. හිරු දුටු පිණිමෙන් මා පැතුම් මිලින කළ ඔබ ඔහු හා යන මාවත මල් ඇතුරූ මාවතක්ම වන්න කියා පාදයක් අහිමි මා තල් කොට බංකරයේ සිට නිහඬ පැතුමක් පතමි.

එහෙත් පෙරදින මාවෙත පුදකල සෙනෙහස අමතක කර දමලා නැවුම් පෙමක් ගැන සිතූ ඔබ යනෙන මාවත කෙලෙසක නම් මල් මාවතක් වන්නේ ද යන්න සෑම නිහඬ රාත්‍රියකම මම කල්පනා කලෙමි. මන්ද අද දින මා වෙත උරුම කළ විරහා වේදනාව ඔහුට ද ඔබ නොදෙන්නේ ද යන්න සිතිය නොහැකි බැවිනි. කිසිම දිනක ඔබට දෙස් පවරන්නට මසිත නොපෙළඹෙන්නේ ඔබ මා වෙත බැඳී සිටියේ සිතින් පමණක් බැවිනි. එහෙත් මාගේ පාදයක් අහිමිවීමත් සමග ඔබ ඔහු හා යාමෙන් මා සිත පෑරෙන තරම් වූ වේදනාවක් මෙලොව තවත් නැති බව ඔබට පසක් කරමි. එද ආදරයට කුලබේද වත් පොහොසත් කම් නොපැතූ ඔබම මාගේ පාදය අහිමිවීමත් සමගම මාගේ අහිංසක ආදරයට විරාමයක් දී මා නෙතු නොපැතූකඳුල සද උරුම කර අවසානයි. මා ඔබෙන් සෙනෙහස අයැද බැඳී සිටි මාගෙන් වෙන්ව ගියේ නම් මා සිතට මෙතරම් වේදනාවක් නොමැත. දුප්පත් කම හිතිපෙත්තෙන් ගලා ගිය මා සෙබළකු වූවාට පසු යුධ බිමේ දී රට ජාතිය වෙනුවෙන් යුද වැදී පාදයක් අහිමිවී කිහිලි කරුවකින් යන මා අමතක කලේ ඇයි ද යන්න මම ඔබෙන් නොඅසමි. එද මා ළඟ හිඳ ආදරය අකුරු කළ ඔබම අද මගෙන් වෙන්වී ඔහු හා යන්නේ කෙලෙස කියා මම නොදනිමි.

මෙලෙස තල් කොට බංකරයේ මතකය අලුත් කරන මට මතක් වූ එක් දෙයක් ඇත. ඒ මගෙන් යාමට බාධකය වී ඇත්තේ මාගේ පාදය අහිමි වූ නිසා බව මා දැන ගත්තේ පසුවය. ජීවිතය පුරාවට කැරකුණු විඩාබර ආර්ථිකය හමුවේ සොල්දාදුවෙකු වූ මාගේ මරණය ඔබ ප්‍රාර්ථනා කළා විය නොහැකිදැයි මා සිත ඔබෙන් කරුණු නොඅසන්නේ ය. මේ අන්දකාර රාත්‍රියේ කුරිරු ත්‍රස්ත වෙඩි පහරකින් මාගේ ප්‍රාණය නිරුද්ධ වන්නට ඉඩ ඇත. එහෙත් මෙතුවක් කල් මාගේ ජීවිතයට එය නොදැන්නේ ඔබ නිසාවෙනි. එල්ලුම් ගසට පෙම් බඳින්නට මිහිමත කිසිම යෞවනියක් ඉදිරිපත් නොවන බව මම දනිමි. එහෙත් මා අත්හල අහිමි කුමරියේ ඔබෙන් මා ලද දයාදය වූ මගේ ජීවිතයට හුරු වූ කඳුල අන් සොයුරන් හට ඔවුන්ගේ කුමරියන් විසින් නොදෙනු ඇත. ඔවුන් අතර ද සිටින්නේ ඔබ වැන්නියන් බව මා දනිමි. එහෙත් දයාබර කුමාරියේ අද දවසේ මිහිමත නිර්භයව හෙට දිනක් ගැන සිතන අතිමහත් වූ අය අතරින් ඔබ ද එක් අයෙක් පමනි. මුළු රටම වෙනුවෙන් කැප කළ අපගේ යෞවනය අප සොහොන මත දිනක ඉකිගසනු ඇත. එය මා වැනි පාදයක් අහිමි වූ සෙබළකුගේ සොහොනක් මත පමණි. උදවන සෑම රාත්‍රියකම මතකය අමතක කිරීමේ ප්‍රයත්නයක යෙදුන ද වන්නේ මතකය අලුත් වී මා නෙතු හැඬීමය අසුරුසැනින් මතකය නිමාකොට ඔබ මෙන් වෙනත් මාවතක ඇවිද යන්නට මට ද හැකිවුවා නම් දෙවියනේ යයි මට සිතේ.

එහෙත් එයට මා සිත කිසිසේත් ඉඩ නොදෙයි. එයට හේතුව ඔබ වැනි අය තවත් සමාජයේ සිටින බැවිනි. ගෙවී ගිය අතීතය සිහිකරමින් ශෝක සංතාප මාවතේ ඇවිද යන්නට මා පාරමී නොපුරමි. හෙටත් සිතන්නට බොහෝ දේ ඇත. දුප්පත් කමට පිළිසරණ සෙවූ මා සෙබළකු වීමතුළින් දිනක ඔබත් රන්සළු පළඳ රැගෙන යන්නට පාරමී පිරූ වාරයක් වාරයක් පාසා දෛවයේ කුරිරු සරදමට ලක්ව මා මියගිය දිනක මතකයේ ඉකිබිඳිමි. මා මත මගෙන් සොරාගත් ඔබේ දයාබරත්වයේ පුදසුන මත මගේ අකලන්ක වූ ආදරය නිබඳව ඉකිබින්දේය. මන්ද කලක් ඔබට දයාබර වූ නිසාවෙනි. නින්ද නොයන රාත්‍රියේ රාජකාරින් නිම කල ද මා අසලට නිදි කුමරිය නොපැමිණෙන්නේ මන්ද මසිතෙන් පිළිවදන් සොයමි. එහෙත් හෙට දිනය හිරු කුමරු සමගින් දෛවය හා සටන් වදින්නට මා හද පාරමී පුරන්නේය. එහෙත් අහිමි කුමාරියේ. මා ඔබට මෙන් මගේ ආදරය පුදකරනු ලබන තවත් ආදර වන්තියක් මා හට දැන් ඇත. මේ කුරිරු යුද්ධයෙන් මා මියගිය දිනක මා හා පෙට්ටියේ සැතපෙන්නට ඇය කැමැත්තෙන් සිටී. ඔබ මා හැරගිය ද සිට මගේ පාරය අහිමිවූ ද සිට මාහට ආදරය කරන ඇය අන් කිසිවකු නොවමාගේ කිහිලිකරුවයි.

පෙරදින මා වෙත පුදකල සෙනෙහස අමතක කර දමලා
නැවුම් පෙමක් ගැන සිතුවේ ඇයි ඔබ මගෙ හදවත රිදවා
සිය වැඩ අතහැර ඔබට පෙම් කලේ ඔබ ගැන සිහින මවා
අපේ පැතුම් ලොව මල් පූදින්නට පැතුවෙමි උදේ හවා
මම කිසි දවසක වෙන්ව නොයන බව මතකයි ඔබ කීවා
මට දුන් මේ දුක ඔහුට නොදෙනු මැන ඔබගෙන් යමුගමි මා

නිමි


සෙ/14ඞ් 00228
සාසෙ ජයතිස්ස එච්
14 (සෙව්) ශ්‍රී ලංකා පාබල හමුදව
යුධ හමුද කඳවුර. උසන් -
මිරුසුවිල්. යාපනය

# යුධ පුහුණුව

යුධ පුහුණුව යනු තම රට ජාතිය වෙනුවෙන් සෙබලකු වශයෙන් සේවය කිරීම උදෙසා දිවුරුම් ප්‍රකාශ කලදින සිට "උදර සේවයෙන්" විශ්‍රාම යන මොහොත දක්වා ලබා ගන්නා විෂය දැනුම වේ. සෙබලකු සෑම දෙයක් කෙරෙහිම මද වශයෙන් හෝ දැන සිටීම රාජකාරිය ඉටු කිරීමේදි රුකුලක් වනු ඇත. උපත් ද සිට අප විවිධ විෂයන් සබැඳිව දැනුම ලබා ගනී. එකිනෙකා කෙරෙහි ඇති දැනුම අනුව රැකියාව, පුද්ගලික හැඩ ගැස්ම හා හැකියාවන් විවිධය. දැනුමෙන් පරිපූර්ණ වූ පුද්ගලයාට හොඳ ආත්මවිශ්වාසයක් ගොඩනගා ගත හැක. ඔහු රාජකාරියට බියනැත. කුමන අන්දමේ කටයුත්තක් වුවද තෘප්තිමත්ව කිරීමේ නිරන්තර හැකියාවක් ඔහු සතුව ඇත.

ගිනි අවිය අත දරා සිටින අපට විෂය දැනුම මිලකළ නොහැකි අවියකි. දැනුමෙන් පන්නරය ලබන්නාට දක්ෂ සෙබලකු විය හැක. අපගේ ක්ෂේත්‍රය දැනුම බෙදහැරීමේ ක්‍රම ඉතාමත් සරලව සකස් කොට ඇත. ඒවා මුල සිට අග දක්වාම දම්වැලක පුරුක් හා සමානය. ඉගැන්වීමේ ක්‍රම සහ විධි ඉතාමත් පැහැදිලිව ක්ෂණිකව අවබෝධ කර ගැනීමට හැකි අයුරින් සකස් කොට ඇත.

යුද්ධයේ දී සතුරා විනාශ කොට ජය ගැනීමත් ආරක්ෂක අවස්ථාවේ නැවත සංවිධානය වීමත් අපගේ ප්‍රධාන අරමුණය. මෙම අරමුණ ඉටු කර ගැනීමට අපකළ යුතු හා නොකළ යුතු දේ දැනසිටිය යුතු ය. එය එකිනෙකාගේ විෂය දැනුම මත රඳා පවතී. තමා නියැලී සිටින කාර්යයට පරිබාහිරව බාහිර ලෝකය පිළිබඳව අප දැනසිටිය යුතුය. කියවීමෙන්, සවන්දීමෙන් හා නැරඹීමෙන් මෙන්ම ප්‍රායෝගිකව යන කුමන අයුරකින් හෝ අපහට දැනුම ලබාගතහැකි මාර්ග වේ. එසේම සෙබලුන් සඳහා විවිධ අන්දමේ පාඨමාලා සකස් කොට ඇත. මේ සෑම දේකම පරමාර්ථය විනය ගරුක සෙබලුන් බිහිකිරීමයි. තම විෂයන් පිළිබඳ මෙන්ම බාහිර ලෝකය පිළිබඳ සෙබලා කාගේත් පැසසුමට ලක්වනවා සේම නායකත්වය හා විනය ගරුක බව නිරතුරුවම දැකිය හැකිය. සමස්ථයක් වශයෙන් ගතහොත් මෑත කාලයේ සෙබලුන් නිවාඩු නොලබා සේවයට නොපැමිණීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කරයි. විෂය දැනුම හා අවබෝධය නොමැති වීම ද මේ සඳහා යම්තාක් දුරට බලපා ඇත යන්න නිගමනය කළහැකිය. තමන් කරන සේවයේ අති විශිෂ්ඨත්වය, රැකියාවේ ස්ථාවර බව සහ හමුදව තුළින් ඇතිකොට තිබෙන සුභසාධනයන් මත තම පවුල් සංස්ථාවේ සහ සිවිල් ජීවිතයේ ස්ථාවරත්වයව පිළිබඳව අවබෝධ කර ගැනීමේ ශක්තිය සෙබලුන් තුළ තිබේ ද යන්න සලකා බැලීම වටී. සෑම විෂයකින්ම සෙබලුන් ස්වයංපෝෂණය කළ යුතුය. සෙබලුන් ද තම ස්වෝත්සාහයෙන් සෑම කාර්යයක් සඳහාම අවබෝධය හා දැනුම ලබාගත යුතු ය. අද අවශ්‍යව ඇත්තේ එයයි.

දැනුම සියලු දෙනාටම ලබාගත හැකිය.ඒ සඳහා මුදල් අවශ්‍ය වන්නේ නැත. අවශ්‍ය වන්නේ කැපවීම පමණි. මරණය සියලු දෙනාටම නියතය. ශිල්පීය දැනුම හා සටන් කලාව මත එය පමාකළ හැකිය.


කේඑස්එන් සිල්වා, ශ්‍රීලපාභ
ලුතිනන්
15 ශ්‍රී ලංකා පාබල හමුදව


# රෙජිමේන්තු වර්ණ ධජය (රෙජිමේන්තු සම්මාන ධජය)

ස්කාලට් වර්ණය, රිදී වර්ණය, රන්වර්ණය සහ රාජකීය නිල් වර්ණය යන වර්ණ 04 කින් මෙම ධජයේ නිමාව දකින්නට ඇත.

අ. ලියවැල - මෙය රෙජිමේන්තු වර්ණ ධජයේ ස්කලාට් වර්ණයේ මුනත මත ධජය වටේම ඇත. මෙය ඉපැරණි සිංහල කොඩි සහ ධජ වල ද දක්නට ඇත. මෙම ලියවැල තිබීමෙන් අදහස් කරණුයේ "එක්ව සිටීම" සහ "එකිනෙකා කෙරෙහිබැඳීම"යන්නය.

ආ. ධජයේ හතර කෙළවර ලියවැල තුළට වන්නට සිංහ, අශ්ව, ගජ, වෘෂභ යන චාරිත්‍රානුකූල සතර දිශාවන් ආරක්ෂාකරන දෙවියන්ගේ වාහන එක් කොට ඇත. මෙයින් අදහස් කරනුයේ "ශ්‍රී ලංකාවේ සතර දිශාවම එක් සේසත්ව" තබන බවයි.

ඇ. රාජකීය නිල් වර්ණය ඇති කොටසේ ධජයේ සතර කොනේ "මුරායුධ"හතරක් ධජයේ මධ්‍යයේ ඇති රෙජිමේන්තු ලාංඡනය වෙතට යොමු වී ඇත. මෙම මුරායුධ ඉපැරණි සිංහල පාබල හමුදවල භාවිතයට ගෙන ඇත මුරායුධ 04 ධජයේ හතර කොනේ තැබීමෙන් අදහස් කරන්නේ රෙජිමේන්තුව විසින් මුළු ශ්‍රී ලංකාවම සතුරාගෙන් ආරක්ෂා කරන බවට කරනා ප්‍රතිඥවයි.

ඈ. රෙජිමේන්තු ලාංඡනයට පහතින් ඇති "සුදු මානෙල්" මලින් ස්වේච්ඡා සෙබලුන් විසින් කරන "ශුද්ධ වූ කැප කිරීම" සහ "අතිශුද්ධ පරිත්‍යාගය" අදහස් කරයි.

රෙජිමේන්තු වර්ණ ධජ ලී ආධාරකයේ පයික් - හිස

ශ්‍රී ලංකා යුධ හමුද ලාංඡනය අලංකාරිත උත්තල පෙති 04 ක් මත රඳවා ඇත. උත්තල කොටස් හතරේ සිංහ, ගජ, අශ්ව, සහ වෘෂභයෙකු වශයෙන් කොටා ඇත. මෙම සෑම දේව වාහනයක්ම ඉහළින් සහ පහලින් ඒකක ලාංඡනයේ ඉහළ කොටස සහ නෙළුම් මලක් කොට ඇත. නෙළුම් මලින් අදහස් වනුයේ "සවේච්ඡා සෙබලෙකුගේ ශුද්ධ වූ පරිත්‍යාගයයි"

වසර 100 ක් ස්වේච්ඡාවෙන් ශ්‍රී ලංකාවට කළ සේවය වෙනුවෙන් අතිගරු ජනාධිපති විසින් රෙජිමේන්තු වර්ණ ධජයේ "ඩෙක්ස්ටර්" පැත්තේ පහල කඩුවක් සහ 1881 - 1981 යන්න ලියූ සන්නසක් යෙදීමට අවසරය දී ඇති අතර, සෑමවසර 100කට වරක්ම වර්ණ ධජයේ ඩෙක්ස්ටර් කොටසේ පහලින් සිංහල කඩුවක සළකුන සහ වසර සියය සටහන් කිරීමට ජනාධිපති විසින් බලය දී ඇත. සෑම වසර 20කට වරක්ම වර්ණයක් නැවත ප්‍රධානය කිරීමක් කළයුතු බව ද වර්ණ සම්ප්‍රදයට ඇතුළත් ය.


සෙ/22343 කෝප්‍රල් විජයානන්ද
එච්එම්ජේආර්
බළඇණි මූලස්ථානය 2 (සෙච්) ශ්‍රීලපාභ

# What's New
## තොරතුරු බිඳක්....

Major D Hettiarachchi RWP SLLI

### එතෙරම පාඨමාලා නිලධාරී

නිලධාරි මෝටාර් පාඨමාලාව ඉන්දියාව - 98.12.09 - 99.01.27
නි/61560 කපිතන් එස්පී විජේසූරිය, ශ්‍රීලපාහ - 6 ශ්‍රීලපාහ
නිලධාරි කණිෂ්ඨ අණදෙන පාඨමාලාව - 98.11.09-99.04.03
නි/60651 මේජර් එම්ඩී විජේසුන්දර, ශ්‍රීලපාහ - 6 ශ්‍රීලපාහ
නි/61031 මේජර් අයිජීආර්ජී බෝගොඩවත්ත, ශ්‍රීලපාහ
නි/62150 කපිතාන් සීජ්ආර් ඇන්තනී, ශ්‍රීලපාහ - 6 ශ්‍රීලපාහ
නි/62188 කපිතාන් වීඩීඑස් පෙරේරා, ශ්‍රීලපාහ - 7 ශ්‍රීලපාහ

### විවාහ වීම් නිලධාරී - සෙසු නිල

සෙ/302597 ලාන්ස් කෝ රත්නායක ආර්එම්ජේබී - 97.11.19 දින මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ අරුණාලෝක උත්සව ශාලාවේ දී ගාර්දිවසම් බාලගේ නදීරා ද සිල්වා මෙනවිය සමගින් විවාහ වන ලදී.

සෙ/302592 කෝප්‍රල් බංඩාර එම්ආර්එස් - 97.07.30 දින පාතහේවාහැට දිස්ත්‍රික් කාර්යාලයේ දී රත්නායක මුදියන්සේලාගේ සම්පත් කුමාරි මැණිකේ රත්නායක මෙනෙවිය සමග විවාහ වන ලදී.

සෙ/306502 සාසෙ කුමාර එච්එම්එස් - 98.02.25 දින මාදම්පේ රෙජිස්ටාර් කාර්යාලයේ දී ගොඩකන්ද කම්කානම්ලාගේ පුෂ්පා කුමාරි මෙනෙවිය සමග විවාහ වන ලදී.

සෙ/306981 සාසෙ බංඩාර ජීජී - 96.12.28 වන දින ගල්තැන්වැව විවාහ ලේකම් කාර්යාලයේදී එපිට වත්තේ ගෙදර ඉනෝකා නිශාන්ති මෙනෙවිය සමග විවාහ වන ලදී.

සෙ/303947 සාසෙ අමරසේකර විජේපීඑම් - 95.07.26 දින දික්වැල්ල දිස්ත්‍රික් රෙජිස්ටාර් කාර්යාලයේ දී වත්තිආරච්චිගේ ශිරෝමි නදී මෙනවිය සමගින් විවාහ වන ලදී.

සෙ/303074 කෝප්‍රල් ගුණරත්න එස්ඩී - 98.01.29 දින තුරුවිල විවාහ ලේකම් කාර්යාලයේ දී කෙහෙල්ගෙදර ස්වර්ණා ගුණතිලක සමගින් විවාහ වන ලදී.

සෙ/303986 සාසෙ සිසිරකුමාර ජීකේඑල් - 98.05.29 දින වරකාක විවාහ ලේකම් කාර්යාලයේ දී තිඹිරිපලගේ චන්ද්‍රිකා නිලන්ති රාජපක්ෂ සමග විවාහ වන ලදී.

සෙ/301167 කෝප්‍රල් වසන්ත ඩබ්ජී - 98.05.28 දින හෙට්ටිමුල්ල විවාහ ලේකම් කාර්යාලයේ දී මතිමෙල්වඩුගේ ඉරෝෂා ඉඳුනිල් කුමාරි මෙනවිය සමගින් විවාහ වන ලදී.

සෙ/302447 කෝප්‍රල් වීරසිංහ එස් - 98.06.19 දින දිවුල්පිටිය විවාහ ලේකම් කාර්යාලයේ දී බැව්වගොඩගේ ශිරෝමි වීරසිංහ මෙනෙවිය සමග විවාහ වන ලදී.

### දරු උපත් නිලධාරී/ සෙසු නිල

නි/62153 කපිතන් කේඑම්ඩබ් බංඩාර ශ්‍රීලපාහ ගේ බිරිඳට 1997.11.03 වැනි දින මහනුවර මහ රෝහලේ දී ගැහැණු දරුවෙක් ඉපදිනි. නම කේ එම් හෂිනි ප්‍රදීපිනි බංඩාර

නි/64098 2/ලුතිනන් ඒ තිලකරත්න ශ්‍රීලපාහ ගේ බිරිඳට කුරුණෑගල රජයේ මහ රෝහලේ දී පිරිමි දරුවෙකු උපදිනි නම හෂිත නිරෝෂන් තිලකරත්න

සෙ/301043 කෝප්‍රල් කුරුනේරු ඩීආර් ගේ බිරිඳට 1997.10.09 වැනි දින යුහරෝහල කොළඹ දී ගැහැණු දරුවෙකු උපදිනි, නම දර්ශා කුරුනේරු

සෙ/12316 කෝප්‍රල් ජයවීර ඒ ගේ බිරිඳට 1996.09.21 වැනි දින යුහරෝහල කොළඹ දී ගැහැණු දරුවෙකු උපදිනි නම බුද්ධිනි තිසංසලා ජයවීර

සෙ/302876 කෝප්‍රල් ගුණරත්න කේජ්ජේකේ ගේ බිරිඳට 97.08.16 වැනි දින බදුල්ල මහ රෝහලේ දී පුතෙක් උපනි. නම කළුආරච්චිලාගේ ගයනුක සමිත් ජයන්ත.

සෙ/300545 කෝප්‍රල් වික්‍රමසිංහ ආර්ඩී ගේ බිරිඳට 94.03.25 දින මහනුවර මහ රෝහලේ දී දුවක් උපනි. නම ආර්ඩී ශාන්ති මාලා රණසිංහ

සෙ/303947 සාසෙ අමරසේකර විජේපීඑම් ගේ බිරිඳට 98.10.24 දින ලුණුගම්වෙහෙර රජයේ රෝහලේ දී පුතෙක් උපනි. නම වී තරිඳු සංගීත් මෙන්ඩිස් අමරසේකර

සෙ/300044 සාසෙ තිමල්සිරි ටීඩී ගේ බිරිඳට 98.07.01 දින රත්නපුර රෝහලේ දී දුවෙක් උපනි. නම ප්‍රසාදිනී වසුන්දරා

සෙ/300115 සාසෙ වීරතිලක කේජීඑන් ගේ බිරිඳට 93.11.23 දින පේරාදෙණිය මහ රෝහලේ දී දුවක් උපනි. නම කහට දෙනියේ ගෙදර අනුරාධා උෂානි වීරතිලක

සෙ/14261 කෝප්‍රල් කග්ගොඩආරච්චි ආර්එස් ගේ බිරිඳට 98/07/01 දින ගාල්ල මහමෝදර රජයේ රෝහලේ දී දුවක් උපනි නම කේ සියුම්විදූෂිකා

සෙ/301941 කෝප්‍රල් ගුණතිලක කේජීඑන් ගේ බිරිඳට 97/12/19 දින කෑගල්ල රජයේ රෝහලේ දී පුතෙකු උපනි. නම කේජී චාමර ප්‍රසාද් ගුණතිලක

සෙ/303032 කෝප්‍රල් ජයසිංහ ජේඑම් ගේ බිරිඳට 98/01/22 දින කුරුණෑගල ශික්ෂණ රෝහලේ දී දුවෙකු උපනි. නම ජේඑම් තිවංකි දිනේත්‍රා

සෙ/12773 සාසෙ සුනිල්ශාන්ත එම්ජීඑ් ගේ බිරිඳට 1998.1021 දින කළුතර නාගොඩ රෝහලේ දී පුතෙකු උපනි. නම සුපුන් මදුවන්ත මාකාවිට

## විවාහ වීම්

සෙ/302022 සැරයන් විජේසිංහ ඩබ්පීඑස්ආර් - 98.08.12 දින දූනගහ ලේකම් කාර්යාලයේ දී හෙට්ටියා මෙරින්ලාගේ රොනාලි දිල්රුක්ෂි මෙනවිය සමග විවාහ වන ලදී.

සෙ/13738 සැරයන් කොස්තා ජේඑම්එස්එම් - 97.11.15 දින කරුන්කුලියවිවාහ ලේකම් කාර්යාලයේ දී ඇන්දන් වඩුගේ සුජීවා පෙරේරා මෙනෙවිය සමගින් විවාහ වන ලදී.

සෙ/302179 කෝප්‍රල් කුලරත්න ඩබ්එල්එන් - 98.05.07 දින කෑගල්ල රෙජිස්ට්‍රාර් කාර්යාලයේ දී මද්දුමහේවගේ ශ්‍රියාණි අමරසිංහ මෙනෙවිය සමග විවාහ වන ලදී.

සෙ/14932 ව/සැරයන් විජේසේන ආර්පීජේපී 98/09/28 දින කිරිමැටියාව රෙජිස්ට්‍රාර් කාර්යාලයේ දී සේමසිංහ වන්නිනායක මුදියන්සේලාගේ කල්‍යාණි කුමාරි මෙනවිය සමග විවාහ විය.

සෙ/14640 සැරයන් ජයතිලක ජේඑච් 98/05/08 දින ගෝනමැරියාව විවාහ රෙජිස්ටාර් කාර්යාලයේ දී අවුසදහාමිගේ චන්ද්‍රලතා මෙනෙවිය සමග විවාහ විය.

සෙ/301897 කෝප්‍රල් ප්‍රේමචන්ද්‍ර බීජ් 98/09/03 දින කළුදවල විවාහ රෙජිස්ට්‍රාර් කාර්යාලයේ දී මුදුන්පිටගේ දෙන් නයෝමා දිලානි මෙනවිය සමග විවාහ විය.

සෙ/302969 කෝප්‍රල් ජයවර්ධන ජේඑම්ආර් 98/05/08 දින ගල්ටැන්වැව විවාහ ලේකම් කාර්යාලයේ දී විමද්දේ ආරච්චිලාගේ නිර්මලා සංජීවනී මෙනවිය සමග විවාහ විය.

සෙ/302087 කෝප්‍රල් ෆොන්සේකා එම් ජ 98/06/12 දින වග ඉරිදපොල මනාලියගේ නිවසේ දී ලේකම් ගමරාලලාගේ සුනීතා රංජනී මෙනවිය සමග විවාහ විය.

සෙ/301200 කෝප්‍රල් වනිගසූරිය ඩබ්ජ්එස්එන් 98/08/17 දින තලල්පිටිය මනාලියගේ නිවසේ දී වික්‍රම ආරච්චිලාගේ නීතා රමණී මෙනෙවිය සමග විවාහ විය.

සෙ/302524 කෝප්‍රල් රූපසිංහ කේඩබ්ජ් 98/02/02 දින ගම්පොල ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ දී දූෂාන්ති නිල්මිණී ද සිල්වා මෙනවිය සමග විවාහ විය.

සෙ/301145 කෝප්‍රල් පුෂ්පකුමාර එස්එන්පී 98/08/28 දින නැලිගම විවාහ ලේකම් කාර්යාලයේ දී ජයකොඩි ආරච්චිලාගේ රෝහිණී දමයන්ති මෙනවිය සමග විවාහ විය.

සෙ/300760 කෝප්‍රල් වික්‍රමසිංහ කේයූ 98/08/08 දින කොරසගල්ල ලේකම් කාර්යාලයේ දී වැලිකුඹුරේ ආරච්චි මුදියන්සේලාගේ රමණී දිසානායක මෙනෙවිය සමග විවාහ විය.

සෙ/304763 කෝප්‍රල් ප්‍රනාන්දු එස්පීඑස්එන්එස් 98/08/08 දින 5 කණුව විවාහ උප්පැන්න ලේකම් කාර්යාලයේ දී වීරක්කොඩි මුදියන්සේලාගේ තුෂාර පුෂ්පකුමාරි මෙනෙවිය සමග විවාහ විය .

සෙ/306414 ලාකෝ සිල්වා එල්එස්පී 98/09/23 දින මහනුවර විවාහ රෙජිස්ට්‍රාර් කාර්යාලයේදී දෙඩම්පේ ගෙදර නිලන්ති මෙනෙවිය සමග විවාහ විය.

සෙ/304049 ලාකෝ ජයන්ත එම් 98/07/30 දින ගෝනපතිරාව විවාහ ලේකම් කාර්යාලයේ දී ඩිංගිරිබංඩාගේ නන්දනී මෙනෙවිය සමග විවාහ විය.

සෙ/305797 ලාකෝ වීරකෝන් එස්එස් 98/05/26 දින ගලපිටගල විවාහ රෙජිස්ටාර් ලේකම් කාර්යාලයේදී විජේසෝම කුසුම් විජේසෝම මෙනවිය සමග විවාහ විය.

සෙ/302606 ලාකෝ පෙරේරා එස්එම්පීඑල් 98/05/04 දින හෝමාගම විවාහ ලේකම් කාර්යාලයේ දී හෙට්ටිආරච්චිගේ සුනේත්‍රා අයිරාංගනී මෙනවිය සමග විවාහ විය.

සෙ/304713 ලාකෝ ගුණදාස බීපීසී 98/10/05 දින මහවිලච්චිය විවාහ ලේකම් කාර්යාලයේ දී කරුණාපේඩිගේ මාලිනී පද්මලතා මෙනවිය සමග විවාහ විය.

සෙ/304710 ලාකෝ තිලකරත්න කේවීඩී 98/07/08 දින කඹුරුපිටිය විවාහ රෙජිස්ටාර් කාර්යාලයේ දී කැකුනවෙල පතිරණගේ චන්ද්‍රිකා මෙනෙවිය සමග විවාහවිය.

සෙ/301185 සාසෙ කරුණාසිංහ එම් 98/09/08 දින කුරුන්දන්කුලම විවාහ ලේකම් කාර්යාලයේ දී සිරිපාලගේ රෝහිණී ප්‍රියංගිකා මෙනෙවිය සමග විවාහ විය.

සෙ/309811 සාසෙ සමන් කුමාර එච්ජ් 98/09/03 දින දුම්මලසූරිය විවාහ ලේකම් කාර්යාලයේ දී අඹේගොඩ ලියන අප්පුහාමිලාගේ චතුරිකා මෙනෙවිය සමවිවාහ විය.

සෙ/307579 සාසෙ ගුණපාල ඩබ්ජී 98/07/31 දින බදුල්ල තැන්නේපංගුව විවාහ ලේකම් කාර්යාලයේ දී හඳුන්ගල දේවගේ නිරෝෂා ප්‍රියදර්ශණී මෙනෙවිය සමග විවාහ විය..

සෙ/125687 ආසෙ සිරිමල් ඩබ් ජ 98/08/06 දින වැල්ලවාය මල්වත්තාවල විවාහ ලේකම් කාර්යාලයේ දී ජයතුංග ගමගේ රේනුකා දමයන්ති මෙනෙවිය සමග විවාහ විය.

සෙ/300305 කෝප්‍රල් සුසන්ත කේජී - 98.10.03 දින අකුරැස්ස විවාහ ලේකම් කාර්යාලයේ දී මාකාවිට විතාරණලාගේ ඉන්ද්‍රාණී මෙනෙවිය සමග විවාහ වන ලදී.

සෙ/13560 සැරයන් බංඩාර සීඑම්එස් 1998.09.15 දින කුරුණෑගල දිස්ත්‍රික් රෙජිස්ටාර් කාර්යාලයේ දී පීජ්එම් අමිතා ජයසුන්දර මෙනවිය සමග විවාහ වන ලදී.

සෙ/300612 කෝප්‍රල් ලක්නාත් එච්පීඑස් 1998.06.28 කළුතර දිස්ත්‍රික් රෙජිස්ටාර් කාර්යාලයේ දී කේජ් නිශාන්ති සාගරිකා මෙනෙවිය සමග විවාහ වන ලදී.

සෙ/301419 කෝප්‍රල් ප්‍රනාන්දු එම්පී 1998.05.08 ඥනික්කුලම්හි මනාලියගේ නිවසේ දී ආර්ජ් නිශාන්ති ප්‍රියදර්ශණී මෙනෙවිය සමග විවාහ වන ලදී.

සෙ/301871 කෝප්‍රල් නවරත්නබංඩා ජ්පී 1998.01.18 ඉඩම්පිටිය විවාහ ලේකම් කාර්යාලයේ දී ඩබ් සන්ධ්‍යා කුමාරි මෙනෙවිය සමග විවාහ වන ලදී.

සෙ/302530 කෝප්‍රල් ජයසිංහ පීජීපී 1997.12.25 තුම්පනේ විවාහ ලේකම් කාර්යාලයේ දී කේඑම් ශ්‍රියානි මානෙල් කුලතුංග මෙනෙවිය සමග විවාහ වන ලදී.

සෙ/301412 කෝප්‍රල් ලක්ෂ්මන් යූජ්කේ 1998.07.16 පහල ඉගුරු වත්ත මනාලියගේ නිවසේ දී එන් කේ ඉනෝකා නවරත්න මෙනෙවිය සමග විවාහ වන ලදී.

සෙ/301377 කෝප්‍රල් ජයසිරි පීඩීඑන්කේ 1998.06.22 කටුගම්පල හත්පත්තුව විවාහ ලේකම් කාර්යාලයේදී කේ නිලූෂා චතුරාංගනී මෙනෙවිය සමග විවාහ වන ලදී

සෙ/301396 කෝප්‍රල් ප්‍රනාන්දු කේඑම්පී 1998.03.20 දින ජලතර විවාහ ලේකම් කාර්යාලයේ දී හේමමාලි දිනේෂිකා විතාරණ මෙනෙවිය සමග විවාහ වන ලදී.

සෙ/304256 ලාකෝ කුලතුංග ජ්එම්යූබී 1998.08.26 බුද්ධම වි. උ. ම. රෙජිස්ටාර් කාර්යාලයේදී ඩීඑම් ශීලවති මෙනෙවිය සමග විවාහවන ලදී.

සෙ/14705 ලාකෝ රංජිත්කුමාර ජ 1996.09.27 දින ඌරපොළ විවාහ රෙජිස්ටාර් කාර්යාලයේ දී සිවනෙත්තිගේ පුෂ්පකුමාරි මෙනෙවිය සමග විවාහ විය.

සෙ/301841 කෝප්‍රල් පත්මසිරි ඩබ් 1998.08.17 මහමල්ගොල්ලෑව විවාහ ලේකම් කාර්යාලයේ දී එම් ජ සමන්ලතා මෙනෙවිය සමග විවාහ විය.

සෙ/303418 සාසෙ පුෂ්පකුමාර පීඑච්එස් 1997.04.21 දිස්ත්‍රික් රෙජිස්ටාර් කාර්යාලයේ දී ටී ජී පුෂ්පා නිල්මිණී ගුණසේකර මෙනෙවිය සමග විවාහ වන ලදී.

සෙ/302731 ලාකෝ රම්බණ්ඩාර එස්එම් 1997.07.24 මාකෙලිය විවාහ ලේකම් 'කාර්යාලයේ දී ජ්එම් නන්දනී අධිකාරි මෙනෙවිය සමග විවාහ වන ලදී.

## දරු උපත්

3 ශ්‍රීලපාහ එස්/13266 සැරයන් ප්‍රනාන්දු ඩබ්ආර්ජේ බිරිඳට මාතර රජයේ රෝහලේ දී 98.12.24 දින දුවක් උපනි. නම සඳුනි ඉමේෂා මල්ෂාරි ප්‍රනාන්දු

15 ශ්‍රීලපාහ එස්/13857 සැරයන් චන්ද්‍රදාස වීජී ගේ බිරිඳට මාතර රජයේ රෝහලේ දී දුවෙකු උපනි. නම හංසිකා සංදීපනි චන්ද්‍රමාලි

# තිරියාය ප්‍රදේශයෙන් මුදාගත් "ජයභූමි" ක්‍රියාන්විතය

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ උතුරින් ත්‍රිකුණාමලය නගරයේ සිට සැතපුම් 30 ක් දුරින් යාන්ඔය අසල පිහිටි තිරියාය ලක්වැසි සැම දන්නා සුවිශේෂ ප්‍රදේශයකි. එයට ප්‍රධාන හේතුව ලංකාවේ ප්‍රථම වටදාගේ පිහිටමයි. ක්‍රි. පූ. 06 වන සියවස දක්වා දිවයන අතීතයක් තිරියාය විහාරයට ඇත. ක්‍රමයෙන් වර්ධනය වූ උතුරු නැගෙනහිර ඊලාම් ප්‍රශ්නය මත තිරියාය ලක්වාසීන්ගේ මතකයෙන් ක්‍රමයෙන් ගිලිහි ගිය අතර, මෙම ප්‍රදේශය කැලෑ ප්‍රදේශයක් වූ හෙයින් තිරියාය ත්‍රස්තවාදීන්ට වඩාත් සමීප ප්‍රදේශයක් විය.

ප්‍රථම වරට 1980 දශකයේ මෙම ප්‍රදේශයේ යුද්ධ හමුදාව ස්ථානගත වූ අතර, 1995 න් පසුව යුද්ධ හමුදාව ඉවත් කරන ලදී. ඉන්පසු මෙම ප්‍රදේශය ත්‍රස්තවාදීන්ගේ ප්‍රබල බලකොටුවක් බවට පත් විය.

නැගෙනහිර පළාතේ සිටි ත්‍රස්තවාදීන් උතුරු ප්‍රදේශයට යෑමට පෙර නවාතැන් පලක් බවට තිරියාය ප්‍රදේශය භාවිතා කරන ලදී. ත්‍රස්තවාදීන්ගේ උතුරු නැගෙනහිර යාකරන මන්සන්ධිය බවට තිරියාය පත් වී තිබුණි. මොහුන්ගේ මුහුදු ගමනා ගමනය සඳහා තිරියාය අවට මුහුදු තීරය ප්‍රයෝජනයට ගන්නා ලදී. ප්‍රධාන ත්‍රස්ත කඳවුර තිරියාය ප්‍රදේශයේ විය.

මෙම තත්ත්වය මත 1995, 1996, 1997 වර්ෂවල ත්‍රිකුණාමලයට බටහිර සහ උතුරු ප්‍රදේශයේ පිහිටි හමුද කඳවුරු සහ පොලිස් ස්ථාන වලට විශාල ත්‍රස්තවාදී තර්ජන එල්ල වී තිබුණි. කඳවුරු රැසක් ත්‍රස්තවාදී ප්‍රහාර වලට ලක්වූ අතර හමුද භට පිරිස් රැසක් මිය ගියහ. ත්‍රස්තවාදී ප්‍රහාර රැසක් එම ප්‍රදේශය ආශ්‍රිතව සිදුවිය.

මෙයට විසඳුමක් ලෙස 22 සේනාංකාධිපති සහ නිලාවේලි 222 බලසේනාධිපති විසින් තිරියාය ත්‍රස්ත කඳවුරු වලට ප්‍රහාරයක් එල්ල කර එම ප්‍රදේශය මුදවා ගැනීම සඳහා "ජයභූමි" ක්‍රියාන්විතය සැලසුම් කරන ලදී. මෙම ක්‍රියාන්විතය සිදු කිරීම සඳහා 5(සෙව්) ශ්‍රීලපාහ ඒකකය වෙත නියෝග කරන ලදී. මේ වන විට මෙම ඒකකය පුල්මුඩේ සහ කුඹුරුපිටිය ප්‍රදේශවල අණුකණ්ඩ රාජකාරී සඳහා ස්ථානගත වී තිබුණි. දින 04 ක් තුළ බළඇණිය මෙම ක්‍රියාන්විතය සඳහා සූදනම් කරන ලදී.

1998 මැයි මස 31 වන දින මෙම ක්‍රියාන්විතය සඳහා දින නියම කරන ලදී. 1998 මැයි මස 29 වන දින 222 බලසේනාධිපතිගේ නියෝග වලින් පසු බළඇණිය කුච්චවේලි වෙත යවන ලදී. 1998 මැයි මස 30 වන දින අණදෙන නිලධාරී නියෝග වලින් පසු කණ්ඩායම් ක්‍රියාන්විතය සඳහා සූදනම් කරන ලදී.

"ඒ" කණ්ඩායම - ත්‍රස්තවාදී කඳවුරට ප්‍රහාර දීම

"බී" කණ්ඩායම - ප්‍රහාරක "ඒ" කණ්ඩායමේ වම්පැති ආරක්ෂාව

"සී" කණ්ඩායම - කුච්චවේලි සිට පොඩුවකට්ටු දක්වා මාර්ග ආරක්ෂාව

"ඩී" කණ්ඩායම - පොඩුවකට්ටුව සහ පොඩුවකට්ටුවේ සිට "ටී" හංදිය දක්වා ආරක්ෂාව

"ඊ" කණ්ඩායම - ප්‍රහාරක "ඒ" කණ්ඩායමේ දකුණු පැති ආරක්ෂාව

1998 මැයි මස 30 වන දින 2330 වන විට "සී" කණ්ඩායම විසින් කුච්චවේලි සිට පොඩුවකට්ටු දක්වා මාර්ග ආරක්ෂාව සැලසූ අතර, මැයි 31 වනදින 0200 පැය වන විට නාවික හමුදවේ විශේෂ බෝට්ටු බළසනය (එස්. බී. එස්) විසින් පොඩුවකට්ටුව කළපුවේ උතුරු දකුණු මායිම් ආරක්ෂාකර හමුද භට පිරිස් වලට කළපුවෙන් එගොඩ ඒමට බෝට්ටු සූදනම් කර තිබුණි. 1998 මැයි මස 31 වන දින 0630 වන විට බළඇණිය බෝට්ටු මගින් පොඩුවකට්ටුව කළපුවේ උතුරු දෙසට ගොස් තිබුණි.

ඉන්පසු ක්‍රියාන්විත සැලැස්මට අනුව පොඩුවකට්ටුවේ සිට තිරියාය දක්වා කැලෑව තුලින් ගමන්කර 1215 පැයට පමණ තිරියාය ත්‍රස්ත කඳවුරට කාලතුවක්කු සහය ඇතිව ප්‍රහාරයක් එල්ල කර අල්ලා ගන්නා ලදී. මෙහි දී ත්‍රස්තවාදීන් කඳවුර දමා පලායන ලදී. පසුව ප්‍රදේශය පරීක්ෂා කිරීමේ දී මුළු තිරියාය ගම්මානයම කඳවුරු සංකීර්ණයක් බවට සකස් කර තිබූ බව නිරීක්ෂණය කළ හැකිවිය.

1998 ජූනි මස 01 වන දින තිරියායේ යාන්ඔය පාලම්පාරු හංදිය දක්වා අප බලය තහවුරු කර ගන්නා ලද අතර, පසුව කල්ලරාවේ අත්හැර තිබූ ධීවර ගම්මානයේද අප බලය තහවුරු කර ගන්නා ලදී.

මෙම ක්‍රියාන්විතයෙන් පසු 1998 ජූනි මස 01 වන දින 22 සේනාංකාධිපති තිරියාය ප්‍රදේශයට පැමිණ පරීක්ෂාකළ අතර, 1998 ජූනි මස 02 වන දින නියෝජ්‍ය ආරක්ෂක ඇමති යුද්ධ හමුදපති, නාවික හමුදපති, ගුවන් හමුදපති තිරියාය ප්‍රදේශයට පැමිණෙන ලදී. 1998 ජූනි මස 08 වන දින පොසොන් පොහොය දින තිරියාය විහාරස්ථානයේ වසර 13 කට පසුව පිංකමක් සිදුකරන ලද අතර, ඒ සඳහා විහාරස්ථානයේ වැඩ විසූ පූජ්‍ය රොටවල නන්දරාම හිමියන් වසර 13 කට පමණ පසු වැඩ සිටි තිරියාය පංසලට නැවත වැඩම කරන ලදී.

මේජර් ආර්ඩීජී මෙල්
කාර්ය නියුක්ත අණදෙන නිලධාරී
5 (සෙව්) ශ්‍රීලපාහ






1. 1 ශ්‍රීලපාහ
ජයග්‍රහණ
ගන්නා ලද
2. 9 වන බල
5 වන සං
යාපනය අ
සරඹ භූමි
විසින් සම්
අවස්ථාවක
3. 1999.01.03
මොහොති
නිළධාරී මේ
ශ්‍රීලපාහ ස
පහන දල්
4. 8 ශ්‍රීලපාහ
ක්‍රියාන්විත
වෙත කරු
5. 12 ශ්‍රීලපාහ
ජ්‍යෙෂ්ඨ නි
වලල්ලේ ප






# මංගල සීනු




1. 1 ශ්‍රීලපාහ ඒකකයේ අණ සහ පාලන කණ්ඩායමට අයත් සෙ/302851 සාසෙ හෙට්ටිආරච්චි එච්ඒ යන අය 1998.12.09 වන දින කොතලාවල, කඩුවෙල පදිංචි උදේණි බාලසූරිය සමග අතිනත ගන්නා ලදී.
2. 12 ශ්‍රීලපාහ ඒකකයේ සෙ/302692 සැරයන් ශාන්ත විපීඑස් වැල්ලවාය වත්තේ පදිංචි රත්නායක මුදියන්සේලාගේ චන්ද්‍රාවතී මෙනෙවිය සමග වැල්ලවාය රෙජිස්ට්‍රාර් කාර්යාලයේදී 98.10.01 දින විවාහ වන ලදී.
3. 1 ශ්‍රීලපාහ ඒකකයේ සෙ/300023 කෝප්‍රල් රස්සපාන ආර්ඒයුඑස් 1998.12.07 වන දින නො.127, බඩල්ගම පදිංචි ජේ.ඒ.ඩී. අසන්තා සංජීවනී මෙනෙවිය සමග මනාලියගේ වසේදී විවාහ ගිවිසගන්නා ලදී.

වෙඩි තැබීම් තරගාවලියේ
ං "ඩී" කණ්ඩායම විසින් දිනා
අවස්ථාව.

ඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව
ාත්සරය සැමරීම වෙනුවෙන්
විවුවේලි කඳවුරු මූලස්ථාන
යේදී ඒකක අණදෙන නිලධාරී
මාන පෙලපාලිය පරීක්ෂා කළ
ි.

දින 1035 ට යෙදුන සුබ
් නව 4 ශ්‍රීලපාහ අණදෙන
මේජර් එල්එම් මුදලිගේ ආර්එස්පී
සම්ප්‍රදායානුකූලව පොල් තෙල්
ා වැඩ භාර ගැනීමේ අවස්ථාව.



2

ඒකක අනි විසින් ජයසිකුරු
යේ ඉදිරි ගමන ගැන නිලධාරීන්
ණු පැහැදිලි කරමින්

අනි, බලසේනාධිපති ඇතුලු
ලධාරීන්ට ඉදිරි ආරක්ෂක
තත්ත්වය පැහැදිලි කරමින්.



4



5



2



3

# නගර් කෝවිල් ක්‍රියාන්විතයේ 14 (සෙව්) ශ්‍රීලපාහ දායකත්වය හා අත්කරගත් ජයග්‍රහණ




**නගර්කෝවිල් මෙහෙයුමෙන් පසු ත්‍රස්තවාදී ග්‍රහණයෙන් මුදගත් මිරුසුවිල් උතුරු ප්‍රදේශයේ වැසියන් හා ඒකක අනි පිළිසඳරක**

යාපනය අර්ධද්වීපයේ 52 සේනාංක ක්‍රියාන්විත බල ප්‍රදේශයට අයත් යාපන වඩමාරච්චි ප්‍රදේශයේ පිහිටි නගර් කෝවිල් ආශ්‍රිත වෙරළ හා නගර් කෝවිල් තොටුපල බොහෝ කාලයක සිට එල්ටීටීඊ සංවිධානය මගින් පරිහරණය කරන ලද්දේ ය. නගර් කෝවිල් ප්‍රදේශයේ භූගෝලීය පිහිටීම ද එල්ටීටීඊ ක්‍රියාකාරම් වලට බොහෝ වාසිදයක විය. එයට ප්‍රධාන හේතුව නගර්කෝවිල් ප්‍රදේශයට දකුණින් පිහිටි උතුර සිට නැගෙනහිර දෙසට විහිදෙන කිලෝ මීටර් 2 ක් පමණ පළල වූ කලපු තීරයක් තිබීමය. ආරක්ෂක හමුද නගර් කෝවිල් ප්‍රදේශයට ගොඩබිමින් පිවිසෙන්නේ නම් මෙම කලපු තීරය අනිවාර්යයෙන්ම තරණය කළ යුතු ය. මෙම කළපු තීරය නිරන්තරයෙන්ම ගැඹුරු මඩ සහිත ජලයෙන් පිරී තිබීම ද විශේෂයකි. එසේම මෙම ප්‍රදේශයේ භූමිය විවෘත භූමියකි.

නගර් කෝවිල් ප්‍රදේශය 98.06.09 වන තෙක් අනාරක්ෂිත ප්‍රදේශයක් විය (Black Area) එයට හේතුව පේදුරුතුඩුව, කොඩිකාමම්, හා අලිමංකඩ යන ප්‍රධාන නගර හරහා දිවෙන ආරක්ෂිත වලල්ලට පිටතින් නගර්කෝවිල් ප්‍රදේශය පිහිටා තිබීමයි. නගර් කෝවිල් ප්‍රදේශය අවට මිරුසුවිල් උතුර එලුත්තු මඩුවාල්, අම්පන්, කුඩත්තනෙයි, නාවක්කාඩු, මරක්කාඩු, වල්ලිපුරම් යන ගම්මාන ද පිහිටා තිබෙන අතර, මෙම ගම්මාන වල සැලකිය යුතු ජනගහනයක් ද ජීවත් වේ. මේ ගම්මාන වල වෙසෙන ජනයා එල්ටීටීඊ සංවිධානය විසින් තමන්ගේ නොයෙකුත් අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා ජනතාවගේ නොකමැත්තෙන් අතරමැදියන් කර ගැණින. ඉහත සඳහන් කළ ගම්මානවල ජනතාව ඔවුන්ගේ එදිනෙද අවශ්‍යතාවයන් සඳහා ආරක්ෂක වළල්ලෙන් ඇතුළට පැමිණීමට කටයුතු කරන අතර ඔවුන්ගේ එම එදිනෙද අවශ්‍යතාවයන් ඉටුකර ගැනීම සඳහා ආරක්ෂක හමුදව මගින් නොමද සහයක් ඔවුන්ට ලබාදේ. එමගින් එම ජනතාව ආරක්ෂක හමුදව හා කිට්ටු සම්බන්ධතාවයක් පවත්වාගෙන යන අතර. ඔවුන් ජිවත් වන ප්‍රදේශවල ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් ගැන ද තොරතුරු සොයා බලා ආරක්ෂක හමුද අතට පත් කරයි. මෙහි දී විශේෂයෙන් සඳහන් කළ යුතු කරුණක් වනුයේ එම ගම්මානවල ජනතාව එල්ටීටීඊ සංවිධානය පිටු දැකීමයි. අවුරුදු 15 කට වැඩි කාලයක් තිස්සේ එල්ටීටීඊ සංවිධානය මවා පෑ ඊලාම් රාජ්‍යය සිහිනයක් බව ඔවුන්ගේ මතයයි. මේ සැබෑ නොවන සිහිනය ඔස්සේ තවදුරටත් දිවයාම අරුතක් නොමැති ව්‍යායාමයක් බව එම සිවිල් ජනතාව හොඳකාරවම අවබෝධ කරගෙන සිටි. එම නිසා එම සිවිල් ජනතාව පුරවැසි කමිටු රැස්වීම් වල දී කියා සිටියේ එම ප්‍රදේශයේ යුධ හමුද කඳවුරක් පිහිටුවා තමන් එල්ටීටීඊ ග්‍රහණයෙන් මිදවීමට කටයුතු කරන ලෙසටය. මේ බැව් එල්ටීටීඊ සංවිධානයට ද ආරංචි වී තිබුණ අතර, ඔවුන් හමුදව සමග සම්බන්ධකම් දක්වනවායයි සැක කළ සිවිල් වැසියන් කීප දෙනෙකුට මරණීය තර්ජන එල්ල කළ අතර අප විසින් එම වැසියන් කීප දෙනා ආරක්ෂක වළල්ලෙන් ඇතුළට ගෙන පදිංචි කරවා ආරක්ෂාව සැලසීමට ද සිදුවිය.

එල්ටීටීඊ සංවිධානය මගින් නගර්කෝවිල් ප්‍රදේශයේ සිට ආරක්ෂක හමුදවන්ට එරෙහිව ප්‍රහාරයන් එල්ල කිරිම නොකඩවා සිදු කෙරුණි. විශේෂයෙන්ම පසුගිය කාලයේ පේදුරුතුඩුව ආශ්‍රිත මුහුදේ දී නෞකාවකට පහර දුන්නේ ද නගර්කෝවිල් ප්‍රදේශයේ ස්ථානගත එල්ටීටීඊ සාමාජිකයින් ප්‍රමුඛවය. නගර් කෝවිල් ප්‍රදේශයේ එල්ටීටීඊ සංවිධානයේ නායකයින් ලෙස මහින්දි, සුධූඔයිල්, එල්ලෙන්දි, නලන්, සීලන් නමැති අයවලූන් ක්‍රියා කළහ. තව ද දිනපතා පාහේ නගර් කෝවිල් ප්‍රදේශයට දකුණින් පිහිටි අප ඒකකයේ ක්‍රියාත්විත කොට්ඨාශයට අයත් කොඩිකාමම් සිට පලෙයි දක්වා නුවර යාපනය මහා මාර්ගයට (ප්‍රධාන සැපයුම් මාර්ගයට) සමාන්තරව දිවෙන ආරක්ෂක වළල්ලට ත්‍රස්තවාදීන් විසින් ප්‍රහාර එල්ල කරන ලදී. විශේෂයෙන්ම ඔවුන් මෝටාර් හා සුලු යාන්ත්‍රික තුවක්කු, ආර්පීජී උපයෝගී කර ගනිමින් මෙම ප්‍රහාර එල්ල කළහ. එසේම අපගේ ප්‍රධාන සැපයුම් මාර්ගයේ කීප වරක්ම ක්ලේමෝ බෝම්බ අටවා තිබී හසුවිය.




මීට අමතරව මුලතිව් හා පූනරින් සිට කලින් කලට ත්‍රස්තවාදීන් බොහෝ සංඛ්‍යාවක් නගර් කෝවිල් ප්‍රදේශයට පැමිණ තම පුහුණුවීම් කටයුතු සහ යාපනය අර්ධද්වීපය තුල ඔවුන් විසින් දියත් කළ විශේෂ ප්‍රහාරයක් සැලසුම් කර ක්‍රියාත්මක කිරිම ද සිදු කෙරිණ.

ඉහත සඳහන් කරුණු සමාලෝචනය කළ 52 සේනාංකාධිපති තුමා නගර් කෝවිල් ප්‍රදේශය එල්ටීටීඊ ත්‍රස්තවාදී ග්‍රහණයෙන් මුද ගැනීම සඳහා නගර් කෝවිල් ක්‍රියාන්විතය නමින් ක්‍රියාන්විතයක් 1998.06.09 වන දින දියත් කරන ලදී. මෙම ක්‍රියාන්විතය සඳහා අප ඒකකය සහභාගී වූ අතර, ක්‍රියාන්විතයේ විශාල වූ කාර්ය භාරයක් ඉටු කිරිමට අප ඒකකය සමත් විය.

මෙම ක්‍රියාන්විතය 523 බළසේනාධිපතිගේ අණදීම යටතේ ක්‍රියාත්මක වූ අතර, ක්‍රියාන්විතයේ පළමු අධියර වූයේ නගර් කෝවිල් ප්‍රදේශය වටා "බ්ලොක්ස්" යෙදීමෙන් ත්‍රස්තවාදීන්ට පැනයා හැකි මංපෙත් ඇහිරිමයි. අප ඒකකය සමග 5 ගරෙ, 14 ගැහේබ, 12 විපාරෙ, 522 බසේමු හි නිඅ භට පිරිස් යන ඒකක විසින් "බ්ලොක්ස්" පිහිටවූ අතර අප භට පිරිස් විසින් ඒ හා සමගම නගර්කෝවිල් වලට දකුණින් පිහිටි කළපු තීරය අසබඩ ත්‍රස්තවාදීන් ලැගුම් ගෙන සිටි කුඩා කඳවුරක් අල්ලාගත් අතර, එහි තිබී පහත සඳහන් බඩුබාහිරාදිය අත් අඩංගුවට ගත හැකිවිය.

60 එම් එම් මෝටාර් එච්ඊ බෝම්බ 04 යි
60 එම් එම් මෝටාර් වාජර් 100 යි
පණිවුඩ හුවමාරු ගුවන් විදුලි යන්ත්‍ර ඇන්ටනා 01 යි
පතරොම් සහිත ටී 56 මැගසීන් 05 යි
අත් බෝම්බ 15 යි
ජම්පින් බෝම්බ 04 යි
බැංග්ලෝ ටෝපිඩෝර් 01
මරාගෙන මැරෙන ඇඳුම් කට්ටල් 01 යි
එල්එම්ජී අවි 01
එස්එල්ආර් මැගසීන් 04 යි
ක්ලේමෝර් වයර් අඩි 100 කැලි 1යි
වැසි කබා 02 යි
ක්ෂේත්‍ර වෙලුම්පටි 15 යි

ත්‍රස්තවාදීන් ඉහත සඳහන් බඩු බාහිරාදිය දමා කළපුව තරණය කර නගර්කෝවිල් දෙසට පලාගොස් සිටි අතර, මේ වන විට පේදුරුතුඩුව දෙසින් මුහුදු වෙරළ දිගේ නගර්කෝවිල් දෙසටත් කුඩාරිප්පු සිට මුහුදු වෙරළ ආශ්‍රිත ප්‍රදේශයෙන් නගර්කෝවිල් දෙසටත් 12 ශ්‍රීලංසිරෙ හා 15 ශ්‍රීලපාහ බළඇණි ගමන් ආරම්භ කර තිබුනෙන් නගර්කෝවිල් ප්‍රදේශයේ සිට එල්ටීටීඊ ත්‍රස්තවාදීන් කළපුවත් මුහුදු තීරයත් අතර, සිරවී සිටියහ. එම බළඇණි විසින් එල්ල කළ ප්‍රහාර වලින් ත්‍රස්තවාදීන් සැහෙන සංඛ්‍යාවක් මියගිය අතර, ඔවුන් සතු විශාල අවි / පතරොම් හා උපකරණ තොගයක් ආරක්ෂක හමුද අතට පත්විය.

1998.06.14 දින අප ඒකක භට පිරිස් වලට නගර්කෝවිල් කළපු ආශ්‍රිත ප්‍රදේශයේ ත්‍රස්තවාදීන් විසින් අතහැර දමා ගොස් තිබූ පහත සඳහන් බඩු බාහිරාදිය ද අත් අඩංගුවට ගැනීමට හැකිවිය.

7.62 ජීව පතරොම් 450 යි
පුද්ගල නාශක බෝම්බ 05 යි
චීන පුවස් 01 යි

දින 07 කට පසු ආරක්ෂක හමුද විසින් මුලු නගර්කෝවිල් ප්‍රදේශයම නිසැක කර ආරක්ෂක හමුද පාලනයට නතු කරගත් අතර, නගර්කෝවිල් හි 15 ශ්‍රීලපාහ බළඇණිය ස්ථානගත විය. අතිසාර්ථක වූ මෙම නගර්කෝවිල් මෙහෙයුම නිසා නගර්කෝවිල් ප්‍රදේශයේ නොකඩවා සෙරීගෙන ආ ත්‍රස්තවාදී ක්‍රියා සම්පූර්ණයෙන්ම ඇණහිටි අතර, එමගින් එම ප්‍රදේශයේ ජීවත් වන සිවිල් ජනතාව ඉමහත් ප්‍රීතියට පත්වීම විශේෂ කරුණකි. මෙහිදී සඳහන් කළ යුතු විශේෂ කරුණක් වනුයේ මෙම ක්‍රියාන්විතයෙන් පසු අප හමුවට ආ එම ප්‍රදේශයේ සිවිල් ජනතාව කියා සිටියේ යම් දිනක යුධ හමුදව එම ප්‍රදේශය අතහැර පැමිණේයැයි බියට පත්ව සිටින බවයි. මෙයින් හැඟී යන්නේ වර්තමාන ද්‍රවිඩ සිවිල් ජනතාව ඊලාම්වාදීන් සමග පවත්වාගෙන ආ සම්බන්ධතාවය ශුන්‍ය වී ඇති බවයි. එය අප ලද විශේෂ ජයග්‍රහණයක් බැව් සඳහන් කළ හැක.

නගර්කෝවිල් ප්‍රදේශයේ ත්‍රස්තවාදී ග්‍රහණයෙන් මුදගත් පසු ත්‍රස්තවාදීන් හා සම්බන්ධ බුද්ධි තොරතුරු නොකඩවා ලැබෙන්නට පටන් ගත්තේය. අප ඒකක බුද්ධි අංශයට සම්බන්ධ සිවිල් වැසියන් විසින් සැපයූ තොරතුරු අනුව 1998.07.10 දින අප ඒකක "බී" කණ්ඩායම මගින් ත්‍රස්තවාදීන් විසින් වලදමා තිබූ බවුසරයක් සොයා ගෙන ගොඩ ගැනීමට සමත්විය. එම බවුසරය ත්‍රස්තවාදීන්ට ආරක්ෂක හමුද මගින් කාතු / මෝටාර් ප්‍රහාර එල්ල කිරීමේ දී ඉන් බේරී සැඟවී සිටීමට භාවිතා කිරීමට යොද ගෙන තිබිණි.



1998.07.11 දින මෙම ඒකක හට පිරිස් විසින් ත්‍රස්තවාදීන් ගෙන් අල්ලාගන්නා ලද අවිවලින් කොටසක්


සාමය ස්ථාපිත විමයි. මේ සඳහා ආරක්ෂක හමුද සියලු ක්‍රියා මාර්ග ගනිමින් පවතින අතර, නොබෝ දිනකින් ඔවුන්ගේ එම පැතුම ද සපිරෙන බව සඳහන් කළ හැක.

**මේජර් එස්ඩබ්එම්ටීබී හුලුගල්ලේ ශ්‍රීලපාහ**
කාර්ය තියුක්ත අණදෙන නිලධාරි
14 (සේවා) ශ්‍රීලපාහ

1998.07.11 දිනට සිවිල් වැසියෙකුගෙන් ලද බුද්ධි තොරතුරක් අනුව මෙම ඒකක "බී" කණ්ඩායමේ හට පිරිස් විසින් මිරුසුවිල් උතුරු ප්‍රදේශයේ පොළොව යට ගබඩාකර තිබූ එල්ටීටීඊ සංවිධානයට අයත් අවි ගබඩාවක් අත් අඩංගුවට ගැනීමට සමත් විය. මැත කාලයේ ත්‍රස්තවාදීන්ගෙන් අල්ලා ගන්නා ලද විශාලතම අවි ගබඩාව මෙය වන අතර, අදියර දෙකකින් ගොඩගත් එම අවි ප්‍රමාණයන් පහත සඳහන් පරිදි වේ.

ටී 56 වර්ගයේ අවි 31 යි
එස්එල්ආර් වර්ගයේ අවි 12 යි
303 වර්ගයේ අවි 74 යි
බෝර් 12 තුවක්කු 216 යි
එල්එම්ජී වර්ගයේ අවි 05 යි
අත් බෝම්බ 25 යි
එෆ්එන්සී වර්ගයේ අවි 03 යි
60 එම්එම් මෝටාර් බෝම්බ 42 යි
81 එම්එම් මෝටාර් බෝම්බ 08 යි
අභ්‍යාස අත් බෝම්බ 16 යි

මේ අනුව නගර්කෝවිල් ප්‍රදේශයෙන් ත්‍රස්තවාදීන් සම්පූර්ණයෙන්ම තුරන් කිරීමට ආරක්ෂක හමුද සමත් වූ අතර, දැනට එම ප්‍රදේශයේ වැසියන් ඉතා සතුටින් ජීවත් වෙති. ඔවුන්ගේ එකම බලාපොරොත්තුව එම ප්‍රදේශයේ ද සිවිල් පරිපාලනය සම්පූර්ණයෙන්ම යථා තත්ත්වයට පත්ව



# HUMOUR IN UNIFORM

During a particular fierce battle in the North, a young, in-experienced Artillery officer was called upon to provide covering fire for an infantry advance.

His orders to his battery resulted in their firing in the wrong direction, and most of the shells landed on the brigade headquarters at the rear. When the shelling had stopped, an orderly ran into the battery office with a message from the brigadier.

The young officer full of his own importance said, 'Read it out, will you?'.

The orderly opened the message and read out in a loud voice, 'You are the most inefficient, stupid, bungling, incompetent officer in the whole of my brigade'.

The officer glanced round at the office staff who had heard every word of this and said hastily, 'Er, yes, well - have that de-coded at once, will you !'

❁ ❁ ❁

A journalist was visiting the front line in the North where the war is on full scale, and an Infantry Captain was assigned to show him around. From base headquarters, they trudged upto the trenches in silence and as they ducked down into the bunkers, the Captain whispered, 'This is the forward defence line of bunkers'. 'How far are we from the enemy ?' whispered the journalist. 'About a mile and a half' the Captain whispered in return. 'A mile and a half ?' asked the journalist. 'Then what are we whispering for ?' 'I don't know about you', replied the officer, 'but I've got laryngitis'.

❁ ❁ ❁

The drill sergeant stopped the squad of officer cadets and walked over to a tall, thin young second lieutenant in the front rank.

'Excuse me - Sir', he said sarcastically. 'Everybody seems to be out of step except yourself'. I just don't know what to do about it'. 'Well', said the young man. 'I really think you ought to tell them sergeant. After all, you are in charge'.

❁ ❁ ❁

| | | |
|---|---|---|
| Sentry | : | 'Halt ! Who goes there ?' |
| Officer | : | 'Orderly Officer'. |
| Sentry | : | 'Halt ! Who goes there ?' |
| Officer | : | 'I've just told you. Orderly Officer'. |
| Sentry | : | 'Halt ! Who goes there ?' |
| Officer | : | 'What's the matter with you, soldier ? Are you deaf or just stupid ?' |
| Sentry | : | 'I'm sorry, Sir. The sergeant said that if anyone whom I didn't recognize came up, I was to shout 'Halt ! who goes there three times, and then fire'. |

❁ ❁ ❁

'We were the best drilled regiment in the army' said one service pensioner to an Infantry pensioner. 'Why when we presented arms on parade, all you could hear was 'Slap - 2 - 3 - slap - 2 - 3 - slap !'

'We were pretty good on drill too', said his friend. 'But of course, we were mainly a fighting unit. When we presented arms, all you could hear was Slap - 2 - 3 - slap - 2 - 3 - slap 2 - 3 - jingle.' 'Jingle ?' questioned the first sweat. 'What was that ?'.

'Medals' replied the Infantryman.

❁ ❁ ❁

The new recruits marched onto the rifle range and took up their positions at a range of 1000 yards from the targets. On the command, they loaded, took aim, and fired. After a few minutes the results came through from the markers. Not one of them had hit the target. The sergeant instructor moved them upto 500 yards. They fired again and again not one single hit was registered. He took them to 300 yards, then to 100 yards and then to 50 yards.

The result was the same - every single bullet missed the target.

Finally he said, 'Alright you lot - fix bayonets ! It's our only chance.

**Contributed by T.V. Pereira**
**(Son of ex-C.Q.M.S. Pereira F.A. 'A' Coy. 1/C.L.I.)**

# LANKA'S PRIDE

**(The Sri Lanka Light Infantry)**

From deep down Dondra Head to the shores of Point Pedro,
We fight our country's battles on clear land as in the wild.
The nation's admiration, we're the finest anyone would see
We glory in the title of the
Sri Lanka Light Infantry.

Our flags flutter in the breeze from dawn to setting sun,
We've fought in every place, where we could take a gun.
In tropical sun and monsoon rains, in the North and East of this land,
You will always see us on the job, defending our motherland.

If the nation ever takes a look at heaven's scenes above,
They will find the streets are guarded by the 'Light Infantry' now.
In many a strife we've fought for life, but never lost our nerve.
Here's health to you and to the Regiment which we are proud to serve.

**By T.V. Pereira**
**(Son of ex-C.Q.M.S. F.A. Pereira ' A' Coy. 1/C.L.I.)**

# LEADERSHIP

Leadership is the process of influencing people to direct their efforts towards the achievement of particulars.

Leaders were not born but made. It is the nature (environment) learning process, training ,responsibilities and experiences.

Rather than NATURE which results in leadership Qualities.

### LEADERSHIP PART OF THE ROLE OF THE INDIVIDUAL

* To give vision to the group.
* Lead and inspire the group to a cause or a movement.
* Seek co-operation.
* Mobilize resources.
* Give confidence and courage to the members.
* Show zeal and enthusiasm for work.

### LEADERSHIP TRAITS

1. Ambition and energy.
2. Desire to lead.
3. Honesty and intergrity.
4. Self-confidence.
5. Intelligence.
6. Job relevant knowledge.

Some traits increase the likelihood of success as a leader, but none of the traits guarantee success.

### LEADERSHIP QUALITIES

1. High level of physical and nervous energy, conspicuous drive, more endurance, greater vigour.
2. High enthusiasm.
3. Unfaltering attitudes of friendliness, affection, tolerence and patience.

Positive attitudes - Positive expectencies and results

4. Sacrifice time, energy, financial resources, or even stark physical torture or persecution.
5. Commitment to the programme.
6. Emotional maturity.

| CHARACTER | PERSONALITY |
|---|---|
| Honesty | Moral Courage |
| Integrity | Determination (Will Power) |
| Truthfulness | Judgement |
| Loyality | Flexibility |
| Stability | Knowledge |
| Tolerance | Accountability |
| Fairness | Initiative |

**2/Lt. K.G.D.A . Keerthirathne**
**6/SLLI "B" Coy**
**Mankulam.**

# The Silver Platter

*By Natan Alterman*

The earth grows still. The reddened eye of the heavens dims slowly out
Over smoke - shrouded boulders.
And a nation stands torn - hearted but breathing
To receive the one miracle
Unlike any other.

Awaiting the ceremony ; they arose to a crescent and stood, before dawn, draped in celebration and dread.
Then from afar there came forth a youth and a maiden
And slowly towards the nation before them they tread.

Wearing drab and equipment heavily shod, They walked up the path
Without even a whisper.
They haven't changed clothes, or used water and washed the signs of the harsh day and of the night under fire.

Weary past ending, hermits from repose, and gleaming with the dew of hebrew youth they in silence approach and motionless, pause and there's no way of knowing if they're alive or have been shot

Then the nation inquires, in tears and in wonder,
And says : Who are you ? And soft speak the two, and reply : We are the silver platter
Upon which the Jewish state is handed to you.
So speaking, they fall at the nation's feet, now their veil and rest will be recounted in the annals of Israel.

(Translated by Richard Flantz)

(Quoted from the 'ISRAEL REVIEW', which is published by the Embassy of Israel in Singapore)

**2/Lt. Tharindu Weerasinghe, SLLI**
**21 SLNG HQ**
**Mahaberiyathenna**
**Digana.**



1881

ස්වේච්ඡා ලංකා පාබල හමුද ඒකකයේ පළමු සරඹ අභ්‍යාසය පවත්වන ලද්දේ 1881 මැයි මස 11 වෙනි දිනය. මෙම අභ්‍යාසය පැවැත්වූයේ කොළඹ කොටුවේ, බේලි වීදියේ (දැන් මුදලිගේ මාවත නමින් හඳුන්වන) පිහිටි ගොඩනැගිල්ලක තාවකාලිකව සකස් කරන ලද සරඹ ශාලාවකදීය. මෙතෙක් පෙරසේ පවතින මෙම ගොඩනැගිල්ලේ දැන් ඇත්තේ ග්ලෝබ් හෝටලයයි.


The first Drill Meeting of the Ceylon Light Infantry Volunteers took place on 11 May 1881 at a Temporary Orderly Room and Drill Hall in Baillie Street (now known as Mudalige Mawatha) in Colombo Fort. Presently the Globe Hotel occupies this building.

එවකට ස්වේච්ඡා සාමාජිකයින් සරඹ පවත්වන ලද "රැකට් කෝට්" යන නමින් හැඳින්වූ උද්‍යානය ආසන්නයේ පිහිටි "සීමන්ස් හෝස්පිටල්" (නැවියන්ගේ රෝහල) ගොඩනැගිල්ලේ ඒකක මූලස්ථානය 1881 මැයි මස 30 වන දින පිහිටුවන ලදී. ලංදේසි යුගයේ දී ළමා අනාථ නිවසක් මෙන් නගාලූ මෙම ගොඩනැගිල්ල කොළඹ පිටකොටුවේ වත්මන් කුමාර වීදියේ පිහිටුවා තිබුණු අතර, මෑතක දී කොළඹ පිටකොටුවේ තැපැල් කාර්යාලය මෙන් ද, දැනට අළුත්වැඩියා කිරීමෙන් පසුව ලන්දේසි කෞතුකාගාරයක් මෙන් ද, යොදගෙන ඇත. කොළඹ කොටුව දුම්රියපොළ ඉදිරියේ පිහිටා ඇති "චාමර්ස් ග්‍රැනරි" නමින් හඳුන්වන රජයේ ධාන්‍ය ගබඩා සංකීර්ණය පිහිටා ඇත්තේ පැරණි "රැකට් කෝට්" උද්‍යානයේ ය.

On 30 May 1881 the Headquarters moved to a building known as the Seamen's Hospital near Racket Court where Volunteers held their Drills and Parades. The Chalmers Granary, opposite the Colombo Fort Railway Station, now stands on the site which was once the Racket Court. The Seamen's Hospital was an Orphanage run by the Dutch prior to British Sovereignity. Located in Prince Street, Pettah, Colombo, it much later became the Pettah Post Office, and at present houses the Dutch Museum.



1903




1935/39

1905 අගෝස්තු මස 06 වන දින ඒකක මූලස්ථානය කොළඹ නගරයේ කොම්පඤ්ඤවීදිය කොට්ඨාශයේ මැලේ වීදියේ පිහිටා තිබූ එවකට පාවිච්චියට නොගත්, බන්ධනාගාරයේ පිහිටුවන ලදී. දැනට කොම්පඤ්ඤවීදිය පොලිස් ස්ථානයට ආසන්නව ඇති මෙම භූමියේ රජයේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි ද කාර්යාලද පිහිටා ඇත.

On 06 August 1905 the Headquarters moved to a disused Jail in Malay Street Slave Island Colombo. This site now holds buildings and Offices of the Department of Education, and almost adjoins the Slave Island Police Station.

ශ්‍රී ලංකා යුධ හමුදව ආරම්භ කිරීමෙන් පසුව, 1951 පෙබරවාරි 20 වන දින ඒකක මූලස්ථානය දැනට ස්ථාවරව පවතින කොළඹ බාලදක්ෂමාවතේ (එවකට පහල වැව පාර නමින් හැඳින්වූ ) ගොඩනැගිල්ලේ පිහිටුවන ලදී. කලින් බ්‍රිතාන්‍ය රාජකීය කාලතුවක්කු හමුදවේ නිලධාරී නිවස්නයක් වූ මෙම පැරණි දෙමහල් ගොඩනැගිල්ල බලඇණි මූලස්ථාන භූමියේ පසුව තනා ඇති ගොඩනැගිලි වලට වඩා කැපී පෙනේ.

On 20 February 1951, after the inauguration of the Sri Lanka Army, the Headquarters moved to its present permanent home in Baladaksha Mawatha, (and earlier known as Lower Lake Road.) The original building, once a Royal Artillery Officers' Mess, still stands imposing and distinctive among new additions that have been built around it.



1960/81

# අන්තර් රෙජිමේන්තු ආබාධිත රණවිරුවන්ගේ ක්‍රීඩා උළෙල 1998



ආබාධිත සෙ/302135 සාසෙ වීරසිංහ කේඑස් රෝද පුටුවේ සිට හෙල්ල විසිකරන අවස්ථාව (පළමුවන ස්ථානය)



ජාතික ආරක්ෂක ලේකම් චන්ද්‍රානන්ද සිල්වා මහතා අතින් සාසෙ වීරසිංහ කේඑස් කුසලානය ලබාගන්නා අයුරු



ආබාධිත පිහිනුම් තරගාවලියේ දක්ෂතම පිහිනුම්කරුවන පාදයක් අහිමි සෙ/304189 කෝප්‍රල් ප්‍රියදර්ශන කේවීසී රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරල් ඒකේ ජයවර්ධන ආර්ඩබ්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී ආර්සීඩීඑස් පීඑස්සී අතින් ජය සංකේත ලබාගන්නා අයුරු



98/08/03 දින පැවැති අන්තර් රෙජිමේන්තු ආබාධිත ක්‍රීඩා උළෙලේ සය සාමාජික සැහැල්ලු පන්දු ක්‍රිකට් ශූරතාවය දිනාගත් රෙජිආබ ශ්‍රීලපාහ ක්‍රීඩකයින්

යුධ හමුද අන්තර් රෙජිමේන්තු ආබාධිත රණවිරුවන්ගේ ක්‍රීඩා උලෙල 1998 ක් වූ අගෝස්තු මස 14 සහ 15 යන දෙදින තුළදී යුධ හමුද මූලස්ථාන ක්‍රීඩාංගනයේ දී මහත් උත්කර්ෂවත් අන්දමින් පැවැත්විනි.

1998 ක් වූ අගෝස්තු මස 14 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදපති ලුතිනන් ජෙනරාල් ආර් ද එස් දළුවත්ත, ආර්ඩබ්පී, ආර්එස්පි, වීඑස්වී, යූඑස්පී, එන්ඩීසී, පීඑස්සී ගේ සමාරම්භක දේශණයෙන් පසු පැවැති මෙකී ක්‍රීඩා උළෙළ සඳහා මෙම ඒකකය වෙතින් ක්‍රීඩකයින් 50දෙනෙකුගෙන් පමණ සමන්විත ක්‍රීඩා කණ්ඩායමක් ඉදිරිපත් කරන ලදී.එහි දී සමස්ථ තරගාවලියෙන් ලකුණු 282 ක් ලබා ගනිමින් ශ්‍රී ලංකා පාබල හමුදාව 3 වන ස්ථානය ලබා ගන්නා ලදී.

එසේම මෙකී තරගාවලිය දෙස අවධානය යොමුකරන කල සැහැල්ලු පන්දු ක්‍රිකට් ශුරතාවය, බැඩ්මින්ටන් (රෝදපුටු) ශුරතාවය, පිහිණුම් ශුරතාවය (දණහිසට පහලින් එක් පාදයක් අහිමි) ශ්‍රී ලංකා පාබල හමුදව සතුවීම විශේෂ කරුණක් විය.එසේම ශ්‍රී ලංකා පාබල හමුද ක්‍රීඩකයින් අතුරින් රෝදපුටු හෙල්ල විසිකිරීම සහ යගුලිය, රෝද පුටු මීටර් 100 තරග ඉසව්වලින් සෙ/302153 සාජේ වීරසිංහ කේඑස් (3 ශ්‍රීලපාහ) ක්‍රීඩකයා 1 වන ස්ථානය ලබාගැනීම තවත් විශේෂ කරුණක් විය.

මෙම ඒකකයෙන් 1998 යුධ හමුද අන්තර් රෙජිමේන්තු ආබාධිත රණවිරුවන්ගේ ක්‍රීඩා උළෙලට සහභාගී වී ජයග්‍රහණ සහ පදක්කම් ලබාගත් ක්‍රීඩකයින් පහත සඳහන් පරිදි වේ.

**කාණ්ඩ අංක 01 යටතේ (රෝදපුටුවලට සීමාවූ)**

සෙ/302135 සාජෙ වීරසිංහ කේඑස් (හොඳම රෝදපුටු තරග කරු)
- රෝදපුටු මීටර් 100 තරග ඉසව්ව 1 වන ස්ථානය - රන් පදක්කම
- රෝදපුටු හෙල්ල විසිකිරීමේ තරග ඉසව්ව 1 වන ස්ථානය - රන් පදක්කම
- රෝදපුටු 100 X 4 සහය තරග ඉසව්ව 1 වන ස්ථානය - රන් පදක්කම
- රෝදපුටු යගුලිය විසිකිරීම තරග ඉසව්ව 1 වන ස්ථානය - රන් පදක්කම

**කණ්ඩ අංක 02 යටතේ (රෝදපුටුවලට සීමා වූ)**

සෙ/300820 කෝප්‍රල් නිශාන්ත විජී
- රෝදපුටු මීටර් 100 තරග ඉසව්ව 2 වන ස්ථානය - රිදී පදක්කම
- රෝද පුටු මීටර් 200 තරග ඉසව්ව 2 වන ස්ථානය - රිදී පදක්කම
- රෝද පුටු හෙල්ල විසිකිරීම 3වන ස්ථානය - ලෝකඩ පදක්කම
- රෝදපුටු මීටර් 100 X 4 සහාය - 1 වන ස්ථානය - රන් පදක්කම

**කාණ්ඩ අංක 04 යටතේ (දණහිසට පහලින් එක් පාදයක් අහිමි)**

සෙ/15750 කෝප්‍රල් සම්පත් එච්එස්පී
- හෙල්ල විසිකිරීම තරග ඉසව්ව 1 වනස්ථානය - රන් පදක්කම්
- මීටර් 100X4 සහය තරග ඉසව්ව 1 වන ස්ථානය - රන් පදක්කම

සෙ/302627 ලාකෝ රණසිංහ ආර්ඩී
- මීටර් 100 X 4 තරග ඉසව්ව 1 වනස්ථානය - රන් පදක්කම
- මීටර් 200 තරග ඉසව්ව 2 වන ස්ථානය - රිදී පදක්කම

සෙ/01941 සාජෙ මංජුල නිරෝෂන් පීජී
- මීටර් 200 තරග ඉසව්ව 2 වන ස්ථානය - රිදී පදක්කම
- මීටර් 100 X 4 සහය තරග ඉසව්ව 1 වන ස්ථානය - රන් පදක්කම

**කාණ්ඩ අංක 05 යටතේ (පාදවල කොටස් අහිමි)**

නි/62569 ලුතිනන් අයිකේසී එදිරිසිංහ ශ්‍රීලපාහ
- කවපෙත්ත විසිකිරීමේ තරග ඉසව්ව 3 වන ස්ථානය - ලෝකඩ පදක්කම

සෙ/300975 කෝප්‍රල් ශ්‍රී ලාල් ඩීඑම්
- මීටර් 100 X 4 සහය දිවීමේ තරග 2 වන ස්ථානය - රිදී පදක්කම

සෙ/300145 ලාකෝ ශාන්ත ආර්එම්එස්
- දුර පැනීම තරග ඉසව්ව 2 වන ස්ථානය - රිදී පදක්කම
- උස පැනීම තරග ඉසව්ව 1 වන ස්ථානය - රන් පදක්කම
- මීටර් 100 X 4 සහය දිවීමේ තරගය 2 වන ස්ථානය - රිදී පදක්කම

සෙ/303394 ලාකෝ සුමනරත්න පීජීඑල්එස්
- උස පැනීමේ තරග ඉසව්ව 2 වන ස්ථානය - රිදී පදක්කම

සෙ/301750 සාජෙ ප්‍රේමරත්න ජේ
- මීටර් 100 X4 සහාය දිවීමේ තරගය 2 වන ස්ථානය - රිදී පදක්කම

**කාණ්ඩ අංක 078 යටතේ (අතක් අහිමි / අප්‍රාතික)**

සෙ/300111 කෝප්‍රල් සේනාරත්න එච්එම්යි
- මීටර් 400 දිවීමේ තරගය 2 වන ස්ථානය - රිදී පදක්කම
- මීටර් 100 X 4 සහාය දිවීමේ තරගය 2 වන ස්ථානය - රිදී පදක්කම

සෙ/14031 ලාකෝ වසන්ත කුමාර බීඒසී
- මීටර් 100 දිවීමේ තරගය 3 වන ස්ථානය - ලෝකඩ පදක්කම

සෙ/301320 කෝප්‍රල් ඒකනායක ඊඑම්එස්කේ
මීටර් 100 දිවීමේ තරගය 2 වන ස්ථානය - රිදී පදක්කම
සෙ/306342 සාසෙ ජයකොඩි එස්ඩබ්
උසපැනීමේ තරග ඉසව්ව 3 වන ස්ථානය - ලෝකඩ පදක්කම

**කාණ්ඩ අංක 08 යටතේ (පූර්ණ අන්ධ)**
සෙ/15962 කෝප්‍රල් ජයරත්න ඒඩීඑන්
මීටර් 100 දීවේ තරග ඉසව්ව 1 වන ස්ථානය - රන් පදක්කම
යගුලිය විසි කිරීමේ තරග ඉසව්ව 1 වන ස්ථානය - රන් පදක්කම
කව පෙත්ත විසි කිරීමේ තරග ඉසව්ව 1 වන ස්ථානය - රන් පදක්කම

**කාණ්ඩ අංක 09 යටතේ (එක් ඇසක් නොපෙනෙන)**
සෙ/11936 සැරයන් සිල්වා ඩබ්එම්පී
මීටර් 100 X 4 සහාය දිවීමේ තරග ඉසව්ව 2 වන ස්ථානය - රිදී පදක්කම
සෙ/13981 සැරයන් ජයසිරි එස්එච්ජ්
යගුලිය විසිකිරීමේ තරග ඉසව්ව 1 වන ස්ථානය - රන් පදක්කම
කව පෙත්ත විසිකිරීමේ තරග ඉසව්ව 3 වන ස්ථානය - ලෝකඩ පදක්කම
සෙ/13860 ලාකෝ සිරිසේන එච්එම්
දුර පැනීමේ තරග ඉසව්ව 3 වන ස්ථානය - ලෝකඩ පදක්කම
සෙ/14981 සාසෙ විජයසිරි එස් ඒ
යගුලිය විසිකිරීමේ තරග ඉසව්ව 1 වනස්ථානය - රන්පදක්කම
කව පෙත්ත විසිකිරීමේ තරග ඉසව්ව 3 වන ස්ථානය - ලෝකඩ පදක්කම

**කාණ්ඩ අංක 04 යටතේ ක්‍රිකට් තරගාවලිය (පාදයක් අහිමි අයවලුන් සඳහා)**

සෙ/15750 කෝප්‍රල් සම්පත් කේඑම්ජ්
සෙ/301757 ලාකෝ කුමාරසිංහ ඩබ්ජීඑන්
සෙ/301902 ලාකෝ විජයවර්ධන ඩබ්
සෙ/302627 ලාකෝ රණසිංහ ආර්එම්
සෙ/304370 සාසෙ බුද්ධික වීජ්
සෙ/303354 සාසෙ ජයසුන්දර එම්ජීකේඑන්
සෙ/305259 සාසෙ රොහාන් වයිඑම්සී
සෙ/305979 සාසෙ ප්‍රේමරත්න බංඩා ඒඑම්ජ්
සෙ/301910 සාසෙ රත්නායක ආර්එම්ජ්
ක්‍රිකට් ශුරතාවය - රන් පදක්කම

**කාණ්ඩ අංක 9 යටතේ පිහිණුම් තරගාවලිය (ඇස් ආබාධිත)**
සෙ/11936 සැරයන් සිල්වා ඩබ්එම්පී
මීටර් 100 නිදහස් ආර 3 වන ස්ථානය - ලෝකඩ පදක්කම
මීටර් 50 නිදහස් ආර 1 වන ස්ථානය - රන් පදක්කම

**කාණ්ඩ අංක 04 යටතේ පිහිනුම් තරගාවලිය (දණහිසට පහලින් පාදයක් අහිමි)**
සෙ/304189 කෝප්‍රල් ප්‍රියදර්ශණ කේවීසී
මීටර් 100 නිදහස් ආර 1 වන ස්ථානය - රන්පදක්කම
මීටර් 50 නිදහස් ආර 1 වන ස්ථානය රන් පදක්කම
මීටර් 50 පසුපස ආර 1 වන ස්ථානය - රන් පදක්කම

**කාණ්ඩ අංක 02 යටතේ පිහිණුම් තරගාවලිය (දණහිසට ඉහලින් පාදයක් අහිමි)**

සෙ/112967 ආසෙ සමන් කුමාර ජේකේ
මීටර් 100 නිදහස් ආර 2 වන ස්ථානය - රිදී පදක්කම
මීටර් 50 නිදහස් ආර 2 වනස්ථානය - රිදී පදක්කම
නි/62303 ලුතිතන් ඒච්ච් විජේගුණවර්ධන , ශ්‍රීලපාහ
මීටර් 25 නිදහස් ආර 1 වන ස්ථානය - රන් දක්කම

**කාණ්ඩ අංක 04 යටතේ පිහිණුම් තරගාවලිය (දණහිසට පහලින් පාදයක් අහිමි**

මීටර් 50 X 4 සහය නිදහස් ආර 2 වන ස්ථානය - රිදී පදක්කම
සෙ/304189 කෝප්‍රල් ප්‍රියදර්ශන කේවීසී
සෙ/300202 කෝප්‍රල් විමලසිරි පීජීජ්
සෙ/301902 කෝප්‍රල් කොතලාවල එච්පී
සෙ/301374 කෝප්‍රල් රණවීර එච්සීඑම්

**කාණ්ඩ අංක 02 යටතේ පිහිණුම් තරගාවලිය (දණහිසට ඉහලින් පාදයක් අහිමි)**
සෙ/307697 සාසෙ සිරිවර්ධන පීඑම්පී
සෙ/112967 සාසෙ සමන්ත කුමාර ජේකේ
සෙ/305495 සාසෙ විජිතානන්ද ඩබ්ඩී
සෙ/308256 සාසෙ ධර්මදස කේඑම්
මීටර් 25X4 නිදහස් ආර 2 වන ස්ථානය - රිදී පදක්කම




*මෙම ජායාරූපයෙන් දැක්වෙනුයේ 1998 අන්තර් රෙජිමේන්තු ආබාධිත ක්‍රීඩා උළෙලේ දී ශ්‍රීලපාහ රෙජිමේන්තුවෙන් ඉදිරිපත් වූ ක්‍රීඩාකයින් ලබාගත් කුසලාන / පදක්කම් සමග සමූහ ජායාරූපයකට පෙනී සිටි අයුරු*

**පළවන පෙළ වාඩි වී වමේ සිට දකුණට**


සෙ/15962 කෝප්‍රල් ජයරත්න ඒඩීඑන්
සෙ/15461 ලාකෝ වෛද්‍යරත්න ඩීජීයූ
සෙ/15750 කෝප්‍රල් සම්පත් එච්එස්පී
සෙ/13327 ව/සැ ජයවික්‍රම ඩීයූ
නි/62569 ලුතිතන් අයිකේඩී එදිරිසිංහ, ශ්‍රීලපාහ
සෙ/13981 සැරයන් ජයසිරි එස්එච්ඒ
සෙ/302135 සාසෙ වීරසිංහ කේඑස්
සෙ/309428 ලාකෝ සිල්වා එම්ඩීපී
සෙ/302627 ලාකෝ රණසිංහ ආර්එම්

**දෙවනපෙළ සිටගෙන - වමේ සිට දකුණට**

සෙ/305979 සාසෙ ප්‍රේමරත්න බංඩා ඒඑම්
සෙ/301320 කෝප්‍රල් ඒකනායක ඊඑම්එස්
සෙ/307920 සාසෙ අමරදාස අයිජී
සෙ/303394 ලාකෝ සුමනරත්න ඩීඒඑල්
සෙ/301374 කෝප්‍රල් රණවීර එච්සීඑම්
සෙ/119440 ලාකෝ පියරත්න කේඒ
සෙ/300975 කෝප්‍රල් ශ්‍රී ලාල් ඩීඑම්
සෙ/01941 සාසෙ මංජුල තිරෝෂන් ජේඑම්
සෙ/14031 ලාකෝ වසන්ත කුමාර ඩබ්ඩී
සෙ/123100 සාසෙ චන්දන ඩබ්
සෙ/112964 සාසෙ සමන්ත කුමාර කේඒ

**පසුපෙළ සිටගෙන - වමේ සිට දකුණට**

සෙ/303746 සාසෙ පියතිස්ස ඊකේකේ
සෙ/13860 ලාකෝ සිරිසේන එච්එම්
සෙ/306698 සාසෙ සුනිල් කරුණාදාස එම්යූ
සෙ/300202 කෝප්‍රල් විමලසිරි ඩීඑන්ජී
සෙ/01753 සාසෙ වර්ණශාන්ත එල්පී
සෙ/300135 ලාකෝ ශාන්ත ආර්එම්එස්
සෙ/30011 කෝප්‍රල් සේනාරත්න එස්සී
සෙ/304370 සාසෙබුද්ධික වීඒ




සැකසුම:
කපිතාන් ඩබ්ඩීආර් ගුණසේකර ශ්‍රීලපාහ

හිතවත් පාඨකය !

උතුරේ හා නැගෙනහිර බංකරයේ රාජකාරියේ යෙදී සිටින ඔබ වෙත නිරතුරුවම ගලාඑන කවි සිතිවිලි හා සංකල්පනා සඳහා මෙම පිටු කිහිපය වෙන්ව ඇත.

ඔබගේ උසස් නිර්මාණයන් "තල් අරඹේ සිට" වෙත ලැබීමට පහත සඳහන් ලිපිනයට තැපැල් කරන්න

සංස්කාරක, "තල් අරඹේ සිට", වයිට් හැකල් සඟරාව, රෙම ශ්‍රීලපාහ, හමුදා ජනපදය, පනාගොඩ

## ගත යුත්තේ පැන ද අවිය ද

දූතට හුරු   අවිය පසෙකට      දමනවාද
පන්හිඳ තුළින් ලෝකය දෙස      බලනවා ද
සතුරන් දෙස බලා කවි පද      බඳිනවා ද
නැතිනම් මව් බිමේ අයිතිය      රකිනවා ද

අවිගත් සැවොම ගත් අවියෙන්      නැසෙනවලු
කවිපද වලින් හදවත      සනසවනවලු
මැරුවොත් සතුරෝ රන් මඩුරන්      ලැබෙනවලු
බුදු බණ අනුවනම් මහ පව්      පිරෙනවලු

පැනට පුළුවන්ලු ලෝකය      ජයගන්න
අවියට බැරිලු ජීවිතයක්      රැකගන්න
සෙබළෙකු වූනේ හෙළ සාමය      රැකගන්න
හැමවිට මිනිස්කම සෙබළුනි      සුරකින්න

**සෙ/15839 කෝප්‍රල් කපිලවංශ ඩබ්ජ්එස්**
**3 ශ්‍රීලපාහ "සංඥ අංශය"**
**පුලියන්කුලම**

## වෙනස

එකම කුස උපන් ඔබ මා
එකට කෙළි දෙලෙන්
ගෙවූ කාලය ගෙවී ගොස්
ඔබට ගිණි අවිය
විජිනිපත මට
කුරිරුය අඳුරුය ගිණි අවිය
කාරුණික ශාන්තය විජිනිපත
අපේ පැතුම
සැමට සැනසුම
එහෙත් "වෙනස"...


**3 ශ්‍රීලපාහ සෙ/301272 ලාකෝ**
**සමරතුංග බීජ්එම්**
**ඇතුළු තිලයිත්ට**
**පූජ්‍ය විමල ධම්ම හිමියන්ගෙන්**

**හොඳ මිනිසෙකු ලැබීමේ හොඳම ක්‍රමය**
**තමන් හොඳ මිතුරෙකු වීමයි**

**අත් දැකීමක් යනු - නොදත් ලෝකය පෙන්වන කවුළුවකි.**

**අවාසනාවටත් වඩා දැරිය නොහැකි දෙයක් වේ**
**එය මිනිසාගේ අකාරුණිකත්වයයි**

**අප නිදන්නේ අවදිවන්නටය**
**වැටෙන්නේ නැගිටින්නය**




## නොමියන මිනිසුන්

දූයේ රකින්නට
නිර්භය විරපුතුන් සේ
යුදවැදුනා ඔබ පෙරද යුධ බිමේ....
හෙළ උරුමය රැකීමට
නිදහස් නිවහල් රටක් රකින්නට
හෙලුවා ඔබ රුධිර ධාරා.. මව් බිමේ
ඔබ ගතින් හෙලූ ඒ ද බිඳු... රුධිරයෙන්
සුවඳ වී පොලෝ තල
සුදු වලා සිපගනී...
නිදහසේ පරවියෝ
පින්බර මව්බිමේ ඉගිලෙන ද
දූය වෙනුවෙන් දිවි මල් පිදූ ඔබ
දිවිමන්ව අප අතර නොමැති මුත්...
නොමියෙන මිනිසුන් වේවි සැමද...

**සෙ/11896 බති 11 සූජ්ව බීවී**
**බුද්ධිඅංශය 4 ශ්‍රීලපාහ**

## සෙබළ සිතක්

*සම කළ නොහැකි සේවය අපගේ සුළුවට*
*මිල කළ නොහැක ජීවය අපගේ මුදලට*

*නිදහස් තරුණවිය කිසිද ගත නොහැක*
*දිවිතොර වීම කොයි මොහොතදී කිව නොහැක*

*දෙඅතට අවිය ගෙන නොනිද සිටින රැයේ*
*ඔබෙ වත සිහි වුනෙම් පෙරද දිනෙදී රැයේ*
*අපමණ සෙනෙහසක් කැටිකොට තුරුණු වියේ*
*ලිපියක් ලියමි පිළිතුරු මග බලමි ප්‍රියේ*

**සෙ/304912**
**ලාකෝ අබේසිංහ**
**ඡ්එච්එම්පී**
**8 ශ්‍රීලපාහ බී කණ්ඩායම**

## ඔබේ දියුණුවට ඔබ වල කපනු එපා

මසකට පසුව ගන්නා ඔබගේ පඩිය
දෙමාපියන් ජිවත් කරනා පඩිය
අඹු දරුවන්ව පෝෂණය කරනා පඩිය
සුරා සුදුවට යොදවයි ඔබේ පඩිය

පඩිපත ගන්න තුරු බලමින් සිටින්නේ
නිවාඩුවක් යන්නට අර අදින්නේ
ඔබ යන මගෙයි ගණිකාවන් දකින්නේ
පඩියෙන් වැඩි කොටස ඇය හට පුදන්නේ

නිවාඩු ඉවර වන බව දැන් සිතට දැනේ
යළි එන්නට මුදලුත් නැහැ ඉතිරි වුනේ
අම්මා ළගට ගොස් මුදලුත් ඉල්ලන්නේ
ඇයි ඔබ මෙලෙස මේ විදිහට හැසිරෙන්නේ

මෙලෙසට ඇයි ද සෙබලුන් ඔබ හැසිරෙන්නේ
ඔබගේ දියුණුවක් ගැන ඔබ නොසිතන්නේ
සුරා සුදුවට ඔබේ සිත යොදවන්නේ
කවද හෝ දිනක ඔබ පසු තැවෙන්නේ

දූ දරුවන්ගේ මතු දියුණුව බිඳිනු එපා
දෙමාපියන් හට කඳුලක් දෙන්න එපා
මත් ගණිකාවො ඔබේ ඇසුරට ගන්න එපා
ඔබගේ දියුණුවට ඔබ වල කපනු එපා

**සෙ/14829 ලාකෝ කරුණාරත්න කේආර්පීආර්කේ**
**ප්‍රවාහන අංශය 4 ශ්‍රීලපාහ**

## සැම දෙන එක්වනන්න ලක්මවුන් සනසන්න

අඩසිය වසරක කුරිරු වූ ශාපයක්
ඇන කොටා නැතිවෙන්න අප රටේ යුද්ධයක්
රට කඩා රජ වෙන්න මෙතන ලොකු වාදයක්
කවදක ලංවෙයි ද අප රටට සාමයක්

රුදූ අවි අතට ගෙන නසන්නට මිහි තලය
තවත් වද ගෙන දුන්නේ කුරිරු වූ මේ බලය
රකුසාට බිලි වෙන්නෙ තරුණ අපේ එඩි බලය
කෙලෙසකද නිම වෙන්නේ මේ යුද්ධ අර ගලය

සාමයක් ඇති වෙන්න මේ යුද්දෙ නැති වෙන්න
තරුණ දිවි රැකගන්න නිදහසින් වැජ ඹෙන්න
ගිණි අවිය පසෙකලා සතුරුකම දුරලන්න
සැම දෙන එක්වන්න ලක්මවුන් සනසන්න

**සෙ/310179 සාසෙ හේමරත්න එච්ජ්ජ්**
**ආධාරක කණ්ඩායම 6 ශ්‍රීලපාහ**




## ජීවිතයේ කටුක බව

අපේ සුන්දර වූ ජීවිතය ගෙවෙන්නේ
දස අතින්ම බියකරු විදියට ය
කිසිම දිනෙක අපි වගේ
සොල්දදුවෙකුට
කිසිම දිනෙක සුන්දර බවක් නැත
දෙමාපිය සහෝදර සහෝදරියන්
අමතක කර
දූදරුවන් බිරිඳ අමතක කර
උපන් දේශය වෙනුවෙන්
ජීවිතය පරදුවට තබා සටන් කරන
සටන් බිමේ සිටින
සොල්දදුවෙකුට දිරිය ශක්තිය
නොඅඩුවම ලැබේවායි පතමි.

**සෙ/121929 ආසෙ පතිරගේ ආර්එම්**
**8 ශ්‍රීලපාහ ඩී කණ්ඩායම**

## සෙබල පැතුමක්

හිරු ගිලෙන විට, ඉර බටු තරුව
පායනකොට
සැක බිය දැඩිව, සිත කකියයි
හැමදම
වෙඩි හඬට සලිත වන කිටි
ගැහෙනා ඝනඳුර
බියකරුයි... බියකරුයි...
අනේ හිරු පායන්න. ඉක්මනින්
එළඹෙන්න
හෙටත් ජීවත් වෙන්න....

**සෙ/302866 සාසෙ දීපාල් කුමාර සීඑච්**
**ඩී කණ්ඩායම 10 ශ්‍රීලපාහ**

## තවමත් අපි සටනේ

සිහිල් සුළං අතරේ ගත පෙළෙන ගනඳුර රැයේ
රට රකින්නට දැය නගන්නට පහන් වූ අරමුණ ලෙයේ
සිනිඳු සුසිනිඳු සුව යහන් මත ලෝකයා නිදනා රැයේ
කුරිරු බියකරු ත්‍රස්තයන් මැද සටනෙ අද අපි යුධ බිමේ

**සෙ/303947 සාසෙ අමරසේකර ටීජේපීඑම්**
**පාලන කණ්ඩායම 10 ශ්‍රීලපාහ**

## සෙබළාණනේ ඔබ මැරුනා නොවේ..
## කුසුමක් වෙලා ඔබ පිපුනා දෑයේ..

ඔබ මිය ගියත් මේ සටනේ හෙට දිනයේ
නුඹ ගැන තියේ හදවත් තුළ සියලු දැයේ
පොදු ජනයාගේ යහපත ගැන ඔබ සිතුයේ
නුඹෙ රුධිරයෙන් සාමයේ මල් බිහි වූයේ

අම්මා ඔබේ දේහය දැක හඬාවි
සුදු කොඩි ගස් කොලන් දෙපළව සරසාවි
සියලු දෙනා නුඹේ යහගුණ පවසාවි
නුඹේ ගුණමැදින් සාමය ලොව බිහිදේවි

**සෙ/309310 සාසෙ වෙස්සමිත්ත එච්එම්**
**11 ශ්‍රීලපාහ බී කණ්ඩායම**

## සාමයේ මල් පිපේවා

මිනිසුනි ඇයි ද බෙදිලා අපි දෙපිලකට
ගිනි අවි අමෝරා ජීවිත වැනසුමට
සාමයේ මගක් නොසිතා මේ විලසටම
සටන් කරන්නේ මොන සතුටක් ලබන්නද

මවුපියෝ වෙහෙසි දරුවන් ඇති දැඩි කරලා
ඉගෙනුම සඳහා පාසැල වෙත යවලා
අතර මගදී ඔහු යුද්දෙට යවලා
සාමය රකින්නැයි ඔහු හට දිරිදීලා

**සෙ/308462 සාසෙ බස්නායක බීජ්**
**11 ශ්‍රීලපාහ සී කණ්ඩායම**




# සෙබල සිතුවිල්ලක්

රාත්‍රිය සුන්දරයි එහෙත්
බියකරුයි
මුරුගසන් වරුසාවක් ලෙසින්
ගිනි අවි වලින් පිටවන
පුංචි ගිනි එළිය මේ රෑ
අසුන්දර කරයි
ගිනි එළිය අතරින් නුඹට බැඳි
ආදරය මට මතක් වෙයි
එහෙත් එක නිමේෂයකට පමණක්
තල් වැටේ මායිමේ
නුඹට ආදරය කරන මෙවැනි
පෙම්වතුන් දහසක් දෙනා
ජාතියත් රටත් රැකගන්නට
පෙරමුණේ සිටියි
මා රටට ආදරය කරනවා යනු
නුඹට ආදරය කිරිමයි...

සෙ/311429 සාසෙ සමින්දක බීවීට්
11 ශ්‍රීලපාහ සී කණ්ඩායම

# මා හැර ගිය ඇය

*වෛර නොකරමි - කිසිම දවසක - ගියා කියලා*
*මා දමා සඳ මතකයේ - රැඳී පවතී ඔබෙන් ලද*
*සෙනෙහස මෙමා - එහෙත් කුමරියේ කෙසේ*
*සැනසෙමි*
*ඔබව මට අහිමිය කියා - ගතින් නැති වුනත්*
*සිතින් ඔබ ළඟ රැඳෙමි - මගේ දිවි ඇති තුරා...*

සෙ/308952
සාසෙ අබේසිංහ ජේඑම්ආර්බී
12 ශ්‍රීලපාහ බී කණ්ඩායම

# ආදර මගෙ අම්මෙ

මා කුඩා කළ සිට තුරුළු කරන් ඔබේ සෙනෙහසට
ආදර මගෙ අම්මේ...
අද මට ඒ උණුසුම නැහැ අම්මේ
අද මා ගිනි අවියක් සමගයි අම්මේ
ගියාට නිවාඩුවක් ඔබේ සෙනෙහස ලබන්නට
වරම් නැත ඔබේ දෙපා නමදින්න

මන්ද ඔබ මගෙන් වෙන් වී දනට වසර 06 ක් වැනිය
ඔබේ පුතු උපන් දේශය නමින් සුරකිම් මතු පරපුරේ
උරුමයක් ආවා උතුරු යුධ බිමට
ආදර මගේ අම්මේ

සෙ/308952
සාසෙ අබේසිංහ ජේඑම්ආර්බී
12 ශ්‍රීලපාහ බී කණ්ඩායම

# සොයුරනේ

රුදුරු වෙඩි හඬක් දසත ඇසෙන්නේ
සොයුරු කැලමයි උතුරේ සිටින්නේ
අප රට රැකුමට වෙහෙස දරන්නේ
ඇයි ද සිහලුනේ නිහඬව ඉඳින්නේ

රට රැකලා සිරිලක බබලන්නේ
ගිනි අවියයි නිතරම සුරත දරන්නේ
සාමයේ පරවියා ඉගිලි ගෙන එන්නේ
වීර සොයුරන් නෑ පස්සට යන්නේ

සෙ/125935
සාසෙ ප්‍රේමචන්ද්‍ර ජීඑම්
12 ශ්‍රීලපාහ - මාන්කුලම්

# එක් සැනසීමක්

කඳවුර තුලදී මට එක ඇති සැනසීම
අම්මා එවපු ලිපියක් දූන් කියවීම
එම විට දස් අබියස ඇය ඇතිසේම
පිළිරුව ඇඳේ ඉදිරියෙ හිටි හැටියේම

අදහස් ගොඩගැසී ඇත එක් එක් දිගට
ඇය දූන් පෙනෙයි කඳු වැටියක් උසට
අම්මා බලන්නට යම් විසිවෙනි දිනට
ඇවිත් ලියමි යුද කවි වැල් එක පෙලට

සෙ/300173 සාසෙ ජයන්ත පීඑච්ඩී
15 ශ්‍රීලපාහ සී කණ්ඩායම නගර්කෝවිල්




# මව්නි දයාබර පියාණෙනි

සිරුරේ වැඩුනු රතු ලේ රස කිරි පෙරා
දුක්කම් කටලු බාදක හදවතෙහි දරා
වැගිරුණු කඳුළු කැට සයුරක් ලෙසින් දරා
බුදු විය යුතුයි අම්මේ නුඹ පෙරුම් පුරා

වගුරා ඩා බිඳු අප ජීවත් කර වන්න
නුඹ ගත් දිරිය ඇත අද මා මෙතනට එන්න
පෙම්බර පියා දෙවියෙකි නිවසට ඉන්න
උපදින බවේ දී නුඹ මගේ පියතුම වන්න

සෙ/122520
ආසෙ හේරත් බණ්ඩා වයිබී
15 ශ්‍රීලපාහ සී කණ්ඩායම
නගර්කෝවිල් යාපනය

# යුධ ගිනි දැල් මැද

යුද්ධය අවසානය කොතැන ද
එහෙත් ඉදිරියට යමි
සොල්දාදුවෙකි මම
මේ පුංචි ලංකාවේ

තනිකර දමා දරුවොත් බිරිඳත්
කිම ද මට නොවැටහේ
ඒත් මම නොසැලෙමි
යළි ඉදිරියට යමි

සෙ/124761
ආසෙ විල්සන් එච්එන්එම්
15 ශ්‍රීලපාහ සී කණ්ඩායම
නගර්කෝවිල්

# බිරිඳත් දුවත් සැනසීමකි දිවි ගමනේ

ගෙවිලා කාලේ දින සති මාසයක් වෙමින්
ලැබුනා නිවාඩුව ගෙදරට එන්න ගොසින්
තබලා විරාමය සටනට ටික දිනකින්
ගම්බිම් බලා ගියෙ නව විරුවන් සමගින්

අවරට ගියා හිරු අහසේ සැහව ගියා
සැතපුම් ගෙවා බසයත් දූන් ගමට ගියා
බිරිඳත් දූවත් මා එනතුරු දූස අයා
සිටියා බලා ගෙන දූන් දූන් ඒවි කියා

බොහො දුර ගෙවා ගෙදරට මා ගිය විගසින්
බිරිඳත් දුවත් සිප ගත්තා මා සතුටින්
පෙර මා නොසිටි පාලුව මකලා දමමින්
සංග්‍රහ කළා දෙනෙතට සුලු සිනාවකින්

ඔත්පල මාමා ද නව නිවසේ වැඩ ද
බලමින් දුවගෙ සහ බිරිඳගෙ දුක සැප ද
දළද සතර මහ දෙවිඳුන් පිහිට යැ ද
නිම වී නිවාඩුව යන්නට වුනා අ ද

මුලු නිවහනට පාලුව රජ යන්න උනා
බිරිඳත් දූවත් දූතින් එල්ලෙන්න උනා
කවදත් පුරුදු හාදුව දෙදෙනට දෙමිනා
නැවතත් නැගෙනහිර යුද්දෙට උර දුන්නා

සෙ/21921 කෝප්‍රල් ප්‍රේමසිරි ආර්ජී
2(සෙව්) ශ්‍රීලපාහ, ආධාරක කණ්ඩායම
යුධ හමුද කඳවුර
මාවඩිවෙම්බු

# විඩාබර සෙබල සිත

*වැලි පොලව රත්වෙලා*
*නගී මිරිගුව උසට*
*දිය තිබහ ඇති වෙලා*
*දිව ගිලෙන තරම් මට*
*සෙවනැල්ලට වෙලා*
*ගිණි අවිය තුරුළු කොට*
*ජීවිතය භාර කර*
*දෛවයේ ඉරණමට*
*ගෙවමි මගේ ජීවිතය*
*දෑයේ දරුවන් නමට*

සෙ/5ඩී01206 ලාකෝ
රූපසිංහ පීඑම්
සී කණ්ඩායම 5 ශ්‍රීලපාහ




# අවසන් පැතුම

සෙබළෙකු විලස ඉපදුණ ලක් බිමට ගරු
දිවි ඇති තෙක්ම කරනෙමි යුද්ධය රුදුරු
මා ගෙන ගියත් ජය ලද දින රුදුරු මරු
පවසමි අවසාන කටයුතු කරන යුරු

කුමට ද මල්වඩම් පාවඩ වැනි දේවල්
නොසලනු මැනවි උණු කඳුළැලි ගංගාවල්
සෙබළුනි මගේ සොයුරන් ඔබ රැ දහවල්
නොකරනු මැනවි මගෙ මිනියට මුරකාවල්

රට දැය රැකුමටයි නිතරම වෙහෙසෙන්නේ
දිවි පරදුවට තබලයි පෙරටම යන්නේ
ඒ ගිය ගමන අද මෙතනින් නිම වෙන්නේ
කල හොඳ පමණි අද මා ළග තනි වෙන්නේ

මියැදුණු නිසා කිසිවෙක් නම් හඩනු එපා
කොඳුරා කියමි ගරු බුහුමන් අනේ එපා
තනිය රකින්නට සොහොනට පහන් එපා
සෙබළුනි මගේ රට සුරකින් එඩිය පපා

සෙ/5ඩී00610 කෝප්‍රල්
පුන්‍යපාල ඩබ්ජී
ඒ කණ්ඩායම 5 ශ්‍රීලපාහ

# සෙබල සිතුවිලි

විල්ලුද ගැටෙන අඩි ශබ්දය දුර ඇසෙන
යුධ සෙබළුන් ඇදෙයි දස දෙස රණ දෙරණ
සතුරන් සැහවිලා ඇති ගස් පඳුරු බෙන
බියකරු බව දනෙයි සතුරන් පොර බඳන

සෙ/00188
සාසෙ මුතුබංඩා ආර්එම්
ඒ කණ්ඩායම 9 ශ්‍රීලපාහ

# බෙදුමක් නැත

රටවල් දෙකක් කරනට මෙය ලොකුත් නැත
සිංහලයාට ලොව තුල වෙන තැනක් නැත
උපතින් මට ද හෙළ උරුමය හිමිව ඇත
අන්තවාදියට බෙදුමක් දෙන්නේ නැත

මෙහි පමණයි හෙළ බස මුල් බස වන්නේ
යාබද රටේ ඊලම් පැත්තක් තිබෙන්නේ
සාධාරණ වීමෙන් විසඳුම් ලැබෙන්නේ
විසඳුම් ලැබෙන තුරු සටනක් කෙරෙන්නේ

සෙබළුන් සමග නිලධාරීන් පැමිණ ඇතේ
සටනට ඔවුන් නිළ නොව සිත් බැඳි ඇතේ
පිළියෙල වෙලා බංකර් තල් කොට මත්තේ
පාබල සෙබළු කවදත් ඉදිරියෙන් ඇතේ

රුපියල් ශත වලින් මෙහි සේවය නොගැනේ
වෙහෙසෙදී සිතේ දහිරිය ඉදිරියට පැනේ
සුභසාධනය ලෙසයි පුහුණුව සලකන්නේ
බර නැති ලොවක් නව පරපුර වෙත දෙන්නේ

නාවුක ගුවන් හමුදා සහය ද දෙන්න
වියතුනි ඔබද හොඳ අදහස් දක්වන්න
මිතුරනි ඔබේ සැණකෙලි ටික නවතන්න
ශ්‍රී ලංකාවෙ ප්‍රශ්නය බේරා ගන්න

බ්‍රිගේඩියර් ටීටීආර් ද සිල්වා ආර්ඩබ්පී.
ආර්එස්පී. යූඑස්පී. පීඑස්සී - ශ්‍රීලපාහ




## මගේ රත්තරන් අම්මාට

ආදර අම්මෙ අද උතුරෙයි මා ඉන්නේ
යුධ ගිනි මැදින් ඔබතිතරම සිහි වන්නේ
දිවි නැති වුනත් මව් බිමනම් නෑ දෙන්නේ
අම්මේ ඔබව කඳ සුරිඳුන් රැක දෙන්නේ

**සෙ/103068 සාසෙ රණසිංහ**
**ඡ් කණ්ඩායම 9 ශ්‍රීලපාහ**

## යුද්ධය නුඹ නිසාය

දිවාකල දිනකර කිරණින්
ගිණිගෙන දැවෙන දේශය
පුරා...
නිශායාමයේ වුවත් සිසිලක්
නෑ
දිවා රෑ දෙකෙහි ම
බුර බුරා දිදුලන්නේ
ශාපලත් යුද්ධයේ ගිනි දළුයි
කර්කශ වූ උතුරු කරේ
දකින්නට නෑ දිය බිඳක්
ගලා බසින්නේ රුධිර ගංගාය
ගිමන් නිවා ගන්නට
අවි බිම තියන්නට
අපේ රණවිරුවන් හට
ලැබෙන්නේ නෑ විරාමයක්
කෙළවරක් දකින්නට
ශාපලත් කුරිරු යුද්ධය
නුඹ නිසා....

**සෙ/23177 ලාකෝ කුසුම්කුමාර කේ**
**14 (සෙව්) ශ්‍රීලපාහ යුධ හමුද කඳවුර**
**උසත් මිරුසුවිල්**

## යුද්ධයට පිවිසවූයේ කවුරුද

මූර කුටිය තුල හිඳ
දෙඇස් දල්වා බලා සිටි සඳ
පෙනෙන නොපෙනන මානයේ
දිස්වේ රුදුරු සෙවනැලි

ගොඩබිමයි සයුරයි
වාලුකා තල් අරණයි
සිහල රණවිරු ගත සිත
පෙළෙන්නට තැත් කරයි තිබඳව

එක බිමක ජනිතව
ගිණි අවි අමෝරාගෙන
ඔබ අප නැසෙන යුද්ධයට
පිවිස වූයේ කවුරුද....

**සෙ/14 ඩී0089 සාසෙ ගුණසේකර එච්ජ්එස්කේ**
**ඡ් කණ්ඩායම 14(සෙව්) ශ්‍රීලපාහ**
**උසත් - මිරුසුවිල් යාපනය**

## *There is beauty you can't see*



*What you hear or feel can influence*
*What you see*
*Even what you don't see*
*There is beauty you can't see*
*It's... P.. E... A... C... E*
*It can be seen it you know the meaning of*
*Patience*
*Enthusiasm*
*Ambition*
*Cooperation*
*Education*

*Major Jayanath Jayaweera*

# ආබාධිත සහිත වූවන්ගේ 8 වන ජාතික ක්‍රීඩා උළෙළ - 1998



*අතිගරු ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරණතුංග මැතිණිය අතින් වසරේ හොඳම ක්‍රීඩකයාට හිමි කුසලානය සෙ/304189 කෝප්‍රල් ප්‍රියදර්ශණ කේවීසි විසින් ලබාගත් අයුරු*

ආබාධිත සහිත වූවන්ගේ ජාතික සම්මේලනය මගින් සංවිධානය කර, කොළඹ මෙට්‍රෝපොලිටන් රොටරි සමාජයේ අනුග්‍රහය ඇතිව 1998 දෙසැම්බර් මස 02 සහ 03 දෙදින තුළ කොළඹ රිඩ් මාවතේ ක්‍රීඩා අමාත්‍යංශ ක්‍රීඩා පිටියේ දී ආබාධිත වූවන්ගේ 8 වන ජාතික ක්‍රීඩා උළෙල නිමාවන ලදී.

මෙදින ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරණතුංග මැතිණියගේ ප්‍රධානත්වයෙන් මැති ඇමතිවරුන්ගේ සහ ත්‍රිවිධ හමුදපතිවරුන්ගේ සහභාගීත්වයෙන් පැවැත් වූ මෙම ක්‍රීඩා උළෙළ සඳහා ක්‍රියාත්විත රාජකාරියේ යෙදී සිටිය දී ත්‍රස්ථවාදී ප්‍රහාර හේතුවෙන් ආබාධිත තත්ත්වයට පත් ශ්‍රීලපාහ ඒකකයන්ට අයත් ක්‍රීඩකයින් 50 දෙනෙකුගෙන් පමණ සමන්විත ක්‍රීඩා කණ්ඩායමක් ද සහභාගී කරවන ලදී.

එසේම මෙම තරගාවලිය දෙස අවධානය යොමුකරවන කල ඉදිරිපත් වූ තරග ඉසව් අතුරින් සෑම තරගයකින්ම ජය අත්කර ගැනීමෙන් හා ආබාධිත පිහිණුම් තරගාවලියේ දී දණහිසින් පහළ එක් පාදයක් අහිමි කෝප්‍රල් ප්‍රියදර්ශණ කේවීසී පිහිණුම තරග ඉසව්වෙන් විශේෂ දස්කම් පෙන්නුම් කිරීමෙන් 1987 වසරේ හොඳම ක්‍රීඩකයාට හිමි සම්මානය හිමි කර ගැනීමෙන් පාබල හමුද රෙජිමේන්තුවට ගෞරවයක් ගෙනදුන් අතර, පහත සඳහන් ක්‍රීඩකයින් ද ශ්‍රීලපාහ රෙජිමේන්තුව වෙනුවෙන් ජයග්‍රහණයන් හිමි කරගන්නා ලදී.

### 1 එක් පාදයක කොටසක් අහිමි තරගකරුවන් සඳහා

නි/62569 ලුතිනන් අයිකේසි එදිරිසිංහ, ශ්‍රීලපාහ කව පෙත්ත විසිකිරීම 1 වන ස්ථානය

සෙ/13327 ව/සැරයන් ජයවික්‍රම ආර්ජ්ජ් මීටර් 100 දිවීම - 3 වන ස්ථානය, මීටර් 100X4 සහාය 2 වන ස්ථානය, දුර පැනීම 2 වන ස්ථානය

සෙ/300145 කෝප්‍රල් ශාන්ත ආර්එම්එස් උස පැනීම 1 වන ස්ථානය, මීටර් 100X4 සහාය 2 වන ස්ථානය

සෙ/300394 කෝප්‍රල් සුමනරත්න ඩීජ්එල්එස් උස පැනීම 1 වන ස්ථානය, මීටර් 100X4 සහාය 2 වන ස්ථානය

සෙ/300975 කෝප්‍රල් ශ්‍රී ලාල් ඩීඑම් - මීටර් 100X4 සහාය 2 වන ස්ථානය

### 2. එක් පාදයක් දණහිසට පහලින් අහිමි තරගකරුවන් සඳහා

සෙ/302627 කෝප්‍රල් රණසිංහ ආර්එම් මීටර් 100 දිවීම 1 වන ස්ථානය, මීටර් 100X4 සහාය 3 වන ස්ථානය

සෙ/303445 කෝප්‍රල් සම්පත් එච්එස්පී - මීටර් 100X4 සහය 3 වන ස්ථානය

සෙ/305259 ලාකෝ රොහාන් වයිඑම්සී මීටර් 100X4 සහය 3 වන ස්ථානය

සෙ/01941 ලාකෝ මංජුල නිරෝෂන් පීපී - මීටර් 100X4 සහය 3 වන ස්ථානය

### 3 එක් අතක් අප්‍රාණික තරගකරුවන් සඳහා

සෙ/300111 කෝප්‍රල් සේනාරත්න එච්එම්සීඑච් මීටර් 100X4 සහාය 3 වන ස්ථානය

සෙ/14031 ලාකෝ වසන්ත කුමාර පීඑච්එස් මීටර් 100X4 සහය 3 වන ස්ථානය

සෙ/306342 ලාකෝ ජයකොඩි එස්ඩබ් මීටර් 100X4 සහය 3 වන ස්ථානය

සෙ/305804 සාසෙ අබේකෝන් එම්එස් මීටර් 100X4 3 වන ස්ථානය

### 4. පිහිනුම් තරගාවලිය (ඉනෙන් පහල අප්‍රාණික)

නි/62303 ලුතිනන් ඒඑච් විජේගුණවර්ධන, ආර්එස්පී, ශ්‍රීලපාහ නිදහස් ආර මීටර් 100 - 1 වන ස්ථානය

### 5 පිහිනුම් තරහාවලිය (දණහිසට පහලින් එක් පාදයක් අහිමි)


සෙ/ 304189 කෝප්‍රල් ප්‍රියදර්ශණ කේවීසී - මීටර් 100 පසුපස ආර 1 වන ස්ථානය, මීටර් 100 නිදහස් ආර 1 වන ස්ථානය, මීටර් 50 නිදහස් ආර 1 වන ස්ථානය. (වසරේ හොඳම ක්‍රීඩකයාට හිමි සම්මානයෙන් මෙම ක්‍රීඩකයා පිදුම් ලබා ඇත..

### 6. පිහිණුම් තරගාවලිය (දණහිසට ඉහලින් පාදයක් අහිමි)

සෙ/112964 ආසෙ සමන්ත කුමාර කේපී නිදහස් ආර මීටර් 100 - 2 වන ස්ථානය, නිදහස් ආර මීටර් 50 - 2 වන ස්ථානය

### 7. පාපැදි තරගය (ද/ප පාදයක් අහිමි)

සෙ/305895 සාසෙ අමරසිරි ඩීඑල්එස් 10 වන ස්ථානය



තරගකරුවන් සඳහා පැවැති වොලිබෝල් තරගාවලියේ දී තියුණු තරගයකින් පසු ශ්‍රී ලංකා පාබල හමුදුව අනුශූරතාවය හිමි කර ගන්නා ලදී. ඒ සඳහා ඉදිරිපත් වූ පාබල හමුද ආබාධිත වොලිබෝල් කණ්ඩායම පහත සඳහන් වේ.

සෙ/11922 බනි 11 දිසානායක එස්කේ (කණ්ඩායම් නායක) - හොඳම පැති ප්‍රහාරකයාට හිමි සම්මානය ලබා ගන්නා ලදී.

සෙ/13643 කෝප්‍රල් හේරත් එච්එම්බී
සෙ/15750 කෝප්‍රල් සම්පත් එච්එස්පී
සෙ/14510 කෝප්‍රල් කුඩාබංඩා ටීඑම්
සෙ/301874 කෝප්‍රල් රණවීර එච්සීඑම්
සෙ/305259 ලාකෝ රොහාන් ඩයිඑම්සී

***පාබල හමුද ක්‍රීඩකයින් සහභාගී වූ ක්‍රීඩා ඉසව්වක උද්වේගවත් අවස්ථාවක්***

## 8. පාදයක් අහිමි තරඟකරුවන් (බැඩ්මින්ටන් යුගල තරගය)

නි/62493 කපිතන් පීආර්බී බංඩාර, ශ්‍රීලපාහ සහ සෙ/123100 සාසෙ චන්දන කේඩබ්එන් -3 වන ස්ථානය

දණහිසට පහලින් පාදයක් අහිමි



***ක්‍රීඩා උත්සවය අවසානයේ ශ්‍රීලපාහ ආබාධිත ක්‍රීඩකයින් ශ්‍රීලපාහ ධජය පෙරටුකොටගෙන පෙළපාලියේ ගමන් ගන්නා අයුරුයි***



***ක්‍රීඩා උත්සවය නිමාකර පැමිණි ක්‍රීඩකයින් රෙම ශ්‍රීලපාහ සේනාවිජායක ලුතිතන් කර්නල් ජේඑස් මාසක්කාර, ආර්එස්පී ශ්‍රීලපාහ සහ රෙපීආබ ශ්‍රීලපාහ රෙසැමේ සමග සමූහ ජායාරූපයකට මුහුණ දුන් අයුරු. රෙම ශ්‍රීලපාහ වෙනුවෙන් ක්‍රීඩා උත්සවය භාරව කටයුතු කළ ලුතිතන් අයිකේසී එදිරිසිංහ ශ්‍රීලපාහ (රෙපීආබ) සේනාවිධායක තුමාගේ දකුණු පසින් සිටී.***

සෙ/300979 සාසෙ දිසානායක එන්එස්එල්එස්
සෙ/303357 සාසෙ ජයසුන්දර එම්පීඩීඑම්
සෙ/304370 සාසෙ බුද්ධික විජ්
සෙ/305975 සාසෙ ප්‍රේමරත්න බංඩා එච්එම්
සෙ/122016 සාසෙ වීරසිංහ එච්එම්

**රෙජිමේන්තු ආධාරක බළඇණිය ශ්‍රීලපාහ**

# සමුගැනීමේ සාදය...

රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරල් ඒකේ ජයවර්ධන ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී ආර්සීඩීඑස් පීඑස්සී
(1997.03.25 - 21.09.98)



99.01.12 දින පැවති සමුගැනීමේ සාදයේදී රෙජිමේන්තු ගීය ගායනා කිරීම.



සාදයේ ආරම්භයට පෙර.



බනි/සැර නිවස්නයේදී රෙසැමේ විසින් ජේෂ්ඨ නිලධාරීන් පිළිගන්නා ලද අවස්ථාව.




සෙසු නිල භෝජනාගාරයේදී පැවති සියලුම නිලයින්ගේ භෝජන සංග්‍රහයේදී රෙජි අධිපති විසින් සැමදෙන ඇමතීම.



9 (සෙවි) ශ්‍රීලපාහ
ඒකක 5 වන
සංවත්සරයේ ආගමික
කටයුතු සඳහා
වැඩමකළ
සංඝයාවහන්සේ ඇතුළු
ඒකක අණදෙන
නිලධාරී.



1998.07.11 දින 14 (සෙවි) ශ්‍රීලපාහ
ඒකක භට පිරිස් විසින්
ත්‍රස්තවාදීන්ගෙන් අල්ලාගන්නා ලද
අවි ආයුධවලින් කොටසක්.




3 ශ්‍රීලපාහ ඒකක භට පිරිස් ගුවන්
සංග්‍රාමික පුහුණුව ලබමින් සිටියදී.



මොරටුව පුබුදු යොවුන් සමාජය මගින් මෙම රෙජිම ආබාධිත
රණවිරුවන් දෙදෙනෙකු වෙත රෝද පුටු පරිත්‍යාග කරන
ලද අවස්ථාව.